ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

இலங்கை அரச மருந்தகக் கூட்டுத்தாபனம்

State Pharmaceuticals Corporation of Sri Lanka



# 2024

# වාර්ෂික වාර්තාව

## வருடாந்த அறிக்கை

## ANNUAL REPORT

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

# වාර්ෂික වාර්තාව
# 2024

SPC

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

# අන්තර්ගතය


- අපගේ දර්ශනය, මෙහෙවර, ආයතනික වටිනාකම් සහ පාඨය 01
- ප්‍රතිඵල සාරාංශය 02
- සභාපතිතුමාගේ ප්‍රකාශය 03
- කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව 04
- අධ්‍යක්ෂ මණ්ඩලය 06
- ආයතනික තොරතුරු 09
- කළමනාකාර මණ්ඩලය 10
- අධ්‍යක්ෂ මණ්ඩල වාර්ෂික වාර්තාව 13
- විගණන කමිටු වාර්තාව 15
- ආයතනික පාලන වාර්තාව 16
- මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂ වගකීම් වාර්තාව 18
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 19
- ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය 20
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 21
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය 22
- ගිණුම්කරණ ප්‍රතිපත්ති 23
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 32
- විගණකාධිපතිගේ වාර්තාව 68
- මානව සම්පත් විශ්ලේෂණය 80
- ආදායම් වාර්තාව සම්බන්ධ වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු 81
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සම්බන්ධ වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු 82
- විකුණුම් ජාලය 83

## අපගේ දර්ශනය

*සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට මඟ පාදන ඖෂධ පරිභෝජනයේ යහපත් පුරුදු වර්ධනය කිරීමේ ප්‍රධාන හවුල්කරු වීම.*

## අපගේ මෙහෙවර

*දේශීයව නිෂ්පාදනය කරන ලද සාමාන්‍ය ඖෂධ භාවිතය ප්‍රවර්ධනය කරමින් සහ දේශීයව නිෂ්පාදනය කරන ලද ඖෂධ අපනයනය සඳහා වේදිකාවක් සපයමින්, ආරක්ෂිත, ඵලදායී සහ උසස් තත්ත්වයේ ඖෂධ නිෂ්පාදන රෝගියාගේ දොරකඩටම ලබා දීමෙන් ශ්‍රී ලංකාවේ මහජනතාවට සේවය කරන ප්‍රමුඛතම සෞඛ්‍ය සේවා සංවිධානය වීම.*

## ආයතනික වටිනාකම්

*ජනතා සේවය ප්‍රමුඛයි.*

*හොඳම තත්ත්වයේ නිෂ්පාදන.*

*අඛණ්ඩතාව කිසි විටෙකත් අවදානමට ලක් නොකළ යුතුය.*

*විශ්වාසදායක සහකරු සහ ඵලදායී කණ්ඩායම් ක්‍රීඩකයා.*

*කාර්ය සාධන විශිෂ්ටත්වය සඳහා ඇති ආශාව.*

*නවෝත්පාදනය.*

## අපගේ පාඨය

*ඔබේ සුවසෙත අපේ පැතුමයි.*

## ප්‍රතිඵල සාරාංශය

| විස්තරය | 2024 රු."000" | 2023 රු."000" | විචලනය (%) | 2022 රු."000" |
|---|---|---|---|---|
| රාජ්‍ය ඖෂධ සංස්ථාවේ විකුණුම් | 11,069,400 | 11,746,644 | (5.8) | 9,945,849 |
| රජයේ බෙහෙත් ගබඩාවට කල සැපයුම් | 51,018,099 | 62,948,425 | (19.0) | 40,973,117 |
| **මුළු ආදායම** | **62,087,499** | **74,695,069** | **(16.9)** | **50,918,966** |
| දළ වෙළඳ ලාභය - රා.ඖ.සං | 2,963,156 | 3,901,069 | (24.0) | 2,069,584 |
| දළ අතිරික්තය - ර.බෙ.ග. | 3,986,181 | 3,243,417 | 22.9 | 2,635,384 |
| **දළ අතිරික්තය** | **6,949,337** | **7,144,486** | **(2.7)** | **4,704,968** |
| වෙනත් ආදායම් | 844,337 | 612,566 | 37.8 | 107,110 |
| පරිපාලන වියදම් | (2,890,044) | (2,479,525) | (16.6) | (2,068,280) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (678,013) | (727,141) | 6.8 | (1,979,136) |
| මූල්‍ය පිරිවැය | (18,599) | (15,595) | (19.3) | (13,974) |
| බැංකු අයිරා පොළී | (1,739,789) | (3,274,891) | 46.9 | (3,052,165) |
| මූල්‍ය ආදායම් | 7,181 | 7,816 | (8.1) | 7,643 |
| **බදු ගෙවීමට පෙර ලාභය** | **2,474,411** | **1,267,716** | **95.2** | **(2,293,834)** |
| විශ්‍රාමික පාරිතෝෂික | (224,901) | 112,091 | (300.6) | 86,102 |
| ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ සංචිතය | (300,000) | - | 100.0 | - |
| බදු වියදම | 851,004 | 494,181 | (72.2) | (611,992) |
| **එකතු විස්තීරණ ආදායම** | **1,098,506** | **885,626** | **(24)** | **(1,524,389)** |
| රඳවාගත් ලාභ | 13,398,308 | 12,531,862 | 6.9 | 11,781,893 |
| දායක ප්‍රාග්ධනය හා සංචිත | 125,117 | 125,117 | - | 125,117 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 71,351 | 71,351 | - | 71,351 |
| ජංගම නොවන වත්කම් | 2,653,677 | 2,975,448 | (10.8) | 2,627,937 |
| ජංගම වත්කම් | 51,826,895 | 53,742,607 | (3.6) | 54,544,508 |
| ජංගම නොවන වගකීම් | 4,299,021 | 5,901,912 | 27.2 | 8,004,715 |
| ජංගම වගකීම් | 36,286,775 | 38,087,813 | 4.7 | 37,189,369 |
| ශුද්ධ ජංගම වත්කම් | 15,540,120 | 15,654,794 | (0.7) | 17,355,139 |
| **මූලික අනුපාත** | | | | |
| දළ ලාභ අනුපාතය (%) රා.ඖ.සං | 26.8 | 33.2 | - | 20.8 |
| දළ ලාභ අනුපාතය (%) ර.බෙ.ග. | 7.8 | 5.2 | - | 6.4 |
| දළ අතිරික්තයට විකුණුම් අනුපාතය (%) | 11.2 | 9.6 | - | 9.2 |
| යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ (%) | 23.2 | 24.4 | - | 3.8 |
| පොළී ආවරණය (වාර) | 2.4 | 1.4 | - | 0.25 |
| ස්කන්ධයට මුළු වත්කම් (වාර) | 1:3.9 | 1:4.5 | - | 1:4.7 |
| යෙදවූ ප්‍රාග්ධනයට විකුණුම් (වාර) | 3:1 | 4:1 | - | 2.5:1 |
| ජංගම අනුපාතය (වාර) | 1:1.4 | 1:1.4 | - | 1:1.5 |
| ද්‍රවශීලතා අනුපාතය (වාර) | 1:1.3 | 1:1.2 | - | 1:1.4 |
| තොග පිරිවැටුම් අනුපාතය (වාර) | 1.4 | 1.6 | - | 2.7 |
| **වෙනත් තොරතුරු** | | | | |
| සේවක සංඛ්‍යාව | 917 | 876 | - | 919 |
| සේවකයෙකුගේ ඉපයීම (රු.) | 2,698 | 1,447 | - | (2,496) |
| සේවකයෙකුට විකුණුම් (රු.) | 67,707 | 85,268 | - | 55,407 |

# සභාපතිතුමාගේ වාර්තාව



රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2024 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද ගෞරවයක් ලෙස සලකමි. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (SPC) එහි නිර්මාතෘ මහාචාර්ය සේනක බිබිලේ මහතාගේ දැක්ම අනුව යමින්, තත්ත්ව සහතික කල ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ සාධාරණ මිලට වෙළඳපළට සැපයීමට සෑම විටම කටයුතු කරයි.

පසුගිය වසර 53 පුරාවට සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් පරිපාලනය කරනු ලබන සියලුම ආයතන සඳහා ඖෂධ, ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය, රසායනාගාර රසායනික ද්‍රව්‍ය සහ උපකරණ සපයන ප්‍රමුඛ සැපයුම්කරු ලෙස SPC කටයුතු කරයි.

**මෙහෙයුම් සමාලෝචනය**

2024 දී අපි සැලකිය යුතු වර්ධනයක් සහ මෙහෙයුම් විශිෂ්ටත්වයක් අත් කර ගත්තෙමු. අපගේ පිරිවැටුම රුපියල් මිලියන 62,087 දක්වා ළඟා වූ අතර, 2024 වසර සඳහා රුපියල් මිලියන 2,474ක් වූ බදු ගෙවීමට පෙර අපගේ ශුද්ධ ලාභය 95% ක ආකර්ෂණීය වැඩි වීමක් පෙන්නුම් කරයි.

ඖෂධ ප්‍රසම්පාදනය ඖෂධවල ඵලදායීතාව, කාර්යක්ෂමතාව සහ ගුණාත්මක භාවය නිශ්චිතවම තහවුරු කර ගත යුතු අතිශයින් වැදගත් සංකීර්ණ ක්‍රියාවලියක් වන අතර එය වැඩිදියුණු කිරීමට අපි නිරන්තර උත්සාහයක යෙදෙමින් සිටිමු.

මූල්‍යමය වශයෙන් ශක්තිමත් රාජ්‍ය ආයතනයක් ලෙස, වෛද්‍ය සැපයුම් අංශයෙන් ලබා දිය යුතු හිඟ මුදල් සහ ප්‍රමාදයන් ද නොසලකා, ලාභාංශ ලෙස මහා භාණ්ඩාගාරයට රුපියල් මිලියන 232 ක් ලබා දීමට අපට හැකි විය. එයට අමතරව, ආදායම් බදු ලෙස රුපියල් මිලියන 177ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට මෙම වර්ෂයේ ගෙවා ඇත.

**වෙළඳපළ පුළුල් කිරීම**

SPC විවෘත වෙළඳපොළ මෙහෙයුම් පුළුල් කිරීම සඳහා වන අපගේ උත්සාහයන් අතරට නව රාජ්‍ය ඔසුසල ස්ථාපිත කිරීම, නව බෙදා හරින්නන් සහ බලයලත් ඔසුසල් ඇති කිරීම ද ඇතුළත් වේ. මෙම වසරේ දී, අපි  වාණිජමය වශයෙන් සුදුසු ස්ථානවල රාජ්‍ය ඔසුසල දහයක් ස්ථාපිත කල අතර බෙදා හරින්නන් හය දෙනෙකු සහ බලයලත් ඔසුසල් විසිපහක් ඇති කළෙමු. තත්ත්ව සහතික කළ ගුණාත්මක ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ සාධාරණ මිලට ජනතාවට සපයා "ජාතියට සේවය" සැපයීම මෙහිදී අපගේ ප්‍රධාන අරමුණ විය.

**ඇගයීම හා සමාප්තිය**

2024 වසර තුළ ලබා දුන් සහයෝගය සහ මග පෙන්වීම වෙනුවෙන් ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා, ගරු සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ අනෙකුත් නිලධාරීන්ට මම ස්තුතිවන්ත වෙමි. වෛද්‍ය සැපයුම් අංශයේ අධ්‍යක්ෂවරයාට සහ අනෙකුත් නිලධාරීන්ට ද අපගේ කෘතඥතාව පළ කරමු. අපගේ අරමුණු සහ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා කැප වී කටයුතු කිරීම වෙනුවෙන් කළමනාකාර අධ්‍යක්ෂවරයාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට, කළමනාකාරිත්වයට සහ සංස්ථාවේ සියලුම සේවකයින්ට මම පෞද්ගලිකව ස්තුතිය ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. SPC ඖෂධ කෙරෙහි විශ්වාසය තැබූ සැපයුම්කරුවන්ට, බෙදා හරින්නන්ට, බලයලත් වෙළඳුන්ට සහ සාමාන්‍ය ජනතාවට මාගේ ස්තුතිය පුද කරමි.

තත්ත්ව සහතික කල ඵලදායි ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ  සාධාරණ මිලට ලබා දෙන ප්‍රමුඛතම සැපයුම්කරු ලෙස SPC සන්නාමය ශ්‍රී ලාංකික ජනතාවගේ හදවතේ පවතීවා යනු මගේ ප්‍රාර්ථනාවයි !



**වෛද්‍ය. මනුජ් සී. වීරසිංහ**
**සභාපති**

# කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව



2024 වසරේ කාර්ය සාධනය සම්බන්ධයෙන් කළමනාකාර අධ්‍යක්ෂ වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද ගෞරවයක් ලෙස සලකමි.

රජයේ රෝහල්වලට තත්ත්ව සහතික කළ ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වෛද්‍ය සැපයුම් අංශයට ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ ආනයනය කර සපයන ප්‍රධාන සැපයුම්කරු වන්නේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවයි. තවද ඖෂධ ආනයනය කර මුළු දිවයිනම ආවරණය වන පරිදි රාජ්‍ය ඔසුසල අලෙවිසැල්, බලයලත් ඔසුසල අලෙවිසැල් සහ බෙදාහරින්නන් හරහා විවෘත වෙළඳපොළට සැපයීම ද සිදු කරයි. එයට අමතරව, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ජීවනී සහ ග්ලූකෝස් වැනි ඖෂධ කිහිපයක් රත්මලානේ පිහිටි තම නිෂ්පාදනාගාරයේ නිෂ්පාදනය කර බෙදා හරියි.

### අභියෝග

2024 වසර සැලකිය යුතු ප්‍රගතියක් වාගේ ම සැලකිය යුතු අභියෝග රැසකට මුහුණ දුන් වසරකි. සැපයුම් ක්‍රියාවලියට සිදු වූ බාධාවන්, මිල උච්චාවචන, වෙළඳපළ ගතිකත්වය සහ පශ්චාත් කොවිඩ් ආර්ථික භූ දර්ශනයේ දිගු කාලීන පවතින බලපෑම් සැලකිය යුතු බාධක ඇති කරන ලදි. එසේ වුවත්, මෙම අභියෝග අපගේ ක්‍රියාකාරකම් නිවැරදි කිරීමට සහ ඉදිරියට යාමේ අපගේ අධිෂ්ඨානය ශක්තිමත් කිරීමට වටිනා පාඩම් හා සමාන අවස්ථා ද ලබා දෙන ලදි.

### අභියෝග කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළ දී, ජාතික මාර්ගෝපදේශ හා යහපාලන පිළිවෙත් සමඟ වඩා හොඳින් අනුගත වීම හා ප්‍රසම්පාදන ක්‍රියාවලින් විධිමත් කිරීමේ මූලික අරමුණ ඇතිව, ප්‍රධාන දෙපාර්තමේන්තු පුළුල් ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කළෙමු. මෙම මුලපිරීම අපගේ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කළා පමණක් නොව, ප්‍රසම්පාදන කටයුතුවල දී, විශේෂයෙන් කාර්ය සාධන බැඳුම් කර සඳහා නිසි පිළිවෙත් ක්‍රියාත්මක කිරීම මඟින් රුපියල් බිලියන 2.5 ක අමතර ආදායමක් උපයා ගත් අතර, එය සංස්ථාවේ මූල්‍ය ස්ථාවර භාවයට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන ලදි.

සමාලෝචිත වසර අවසන් වන විට, සංස්ථාවේ ප්‍රධාන තනතුරු පිරවීම ඇතුළුව බඳවා ගැනීමේ කටයුතු සාර්ථකව නිම කරන ලදි. අපි සේවක සංවර්ධනය කෙරෙහි ද දැඩි අවධානයක් යොමු කළෙමු. බාහිර පුහුණු වැඩසටහන් හරහා අපගේ සියලූ සේවක මට්ටම්වල කාර්ය මණ්ඩල අභියෝග ඵලදායී ලෙස ජය ගැනීමට සන්නද්ධ කළ අතර, විශ්වාසයේ සහ සහයෝගිතාවේ සංස්කෘතියක් පෝෂණය කරන ලදි. වසර තුළ සියලූම සේවක කාණ්ඩ පාහේ වෘත්තීය කේන්ද්‍රීය පුහුණුවක් ලබා ගත් අතර, එය විනිවිදභාවය සහ විශ්වාසය ගොඩනැගීමට උපකාරී වූ අතර, අපගේ ශ්‍රම බලකාය සංස්ථාවේ ඉලක්ක සමඟ පෙළගස්වන ලදි. විනිවිදභාවය සහ දැනුවත් ව  අනුකූල වීම සඳහා අපගේ කැපවීමේ කොටසක් ලෙස, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් අලූතින් පනවන ලද පනතේ ප්‍රධාන විධිවිධාන සහ බලපෑම පිළිබඳ අපගේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා කොමිෂන් සභාව සමඟ දැනුවත් කිරීමේ වැඩසටහනක් අපි සාර්ථකව සංවිධානය කළෙමු.

රාජ්‍ය ඔසුසල සහ ORS නිෂ්පාදන පිළිබඳ සමාලෝචන රැස්වීම මාසිකව පැවැත්වීම කළමනාකරුවන්ට ඔවුන්ගේ කණ්ඩායම්වල කාර්ය සාධනය තක්සේරු කිරීමට වටිනා වේදිකාවක් සපයන ලදි. අභියෝග හඳුනා ගැනීමත් රාජ්‍ය ඔසුසල ජාලය සහ ORS නිෂ්පාදන මෙහෙයුම් සුමටව පවත්වා ගැනීමත් සඳහා මෙම රැස්වීම් මඟින් පහසුකම් සැලසුණු අතර, නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාත්මක කිරීම සහතික කරන ලදි.

වසර අවසන් වන විට, අපි රට පුරා නව රාජ්‍ය ඔසුසල ශාඛා 10 ක් පිහිටුවීමෙන් අපගේ ප්‍රවේශය සාර්ථකව පුළුල් කළෙමු. ඔසුසල ජාලය පුළුල් කිරීම මඟින් සාධාරණ මිලකට උසස් තත්ත්වයේ ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ සාමාන්‍ය ජනතාවට සැපයීමේ අපගේ හැකියාව ශක්තිමත් වී ඇති අතර, එ මඟින් ඖෂධ වෙළඳපොළ තුළ අපගේ ස්ථානය තවදුරටත් ශක්තිමත් වී ඇත.

අපගේ සියලූ කාර්ය මණ්ඩල එක් කණ්ඩායමක් ලෙස සහයෝගයෙන් කටයුතු කිරීම මෙහෙයුම් සුමටව ක්‍රියාත්මක කිරීමටත් ඵලදායී වැඩ පරිසරයක් නිර්මාණය කිරීමටත් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ලදි. විවෘත සන්නිවේදනය, සාධාරණ සාකච්ඡා සහ සේවක සුබසාධනය කෙරෙහි අවධානය යොමු කිරීම තුළින්, අපි කම්කරු ආරවුල් අවදානම සාර්ථකව අවම කර වසර පුරා ශක්තිමත්, ඒකාබද්ධ ශ්‍රම බලකායක් පෝෂණය කළෙමු.

### 2024 වසරේ කාර්යසාධනය

රජයේ රෝහල් සඳහා ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ ආනයනය කරන එකම ආනයනකරු ලෙස හා විවෘත වෙළඳපළේ ප්‍රමුඛතම ආනයනය කර බෙදාහරින්නා වශයෙන්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව කාර්යක්ෂම සැපයුම් දාමයක් පවත්වා ගනිමින් ජාතියේ අත්‍යවශ්‍ය ඖෂධ සඳහා වන ඉල්ලුම සපුරාලීමට 2024 වසර තුළ කැපවී කටයුතු කරන ලදි. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ  රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ කාර්යසාධනය පහත පරිදි විය.

- බදු පෙර ලාභය (PBT) රු. මිලියන 2,474 (2023 දී රු. මිලියන 1,268 ක් වූ අතර එය 95% ක වර්ධනයක් නියෝජනය කරයි)
- මුළු පොදු කාර්ය පිරිවැය රු. මිලියන 5,326 (2023 දී රුපියල් මිලියන 6,497 ක් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2024 වසර සඳහා පොදු කාර්ය වියදම් 18% කින් අඩු විය.)

2023 සිට 2024 දක්වා පිරිවැටුම පහත වැටුණ ද, පෙර වසරට සාපේක්ෂව සංස්ථාවේ ඵලදායී පිරිවැය පාලනය සහ මෙහෙයුම් වැඩිදියුණු කිරීම් හේතුවෙන් බදු ගෙවීමට පෙර ලාභයේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදි.




**2025 වසරේ අරමුණු**

2025 හා ඉදිරි වර්ෂ වල දී, අත්‍යවශ්‍ය ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා සෞඛ්‍ය සේවා සපයන්නන්, රාජ්‍ය ආයතන සහ අනෙකුත් ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ සහයෝගිතාව ශක්තිමත් කිරීම කෙරෙහි අපගේ අවධානය යොමු වනු ඇත. ලාභ දිශානතිය කෙරෙහි අවධානය යොමු කරමින්, අපගේ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ තිරසාර භාවය පිළිබඳ ක්‍රමවේද වැඩිදියුණු කිරීමට ද අපි කැපවෙමු.

2025 ඩිජිටල්කරණය සඳහා ප්‍රමුඛතාව ලබා දෙනු ඇති අතර ආසියානු සංවර්ධන බැංකුව දැනටමත් මෙම මුලපිරීම සඳහා ක්‍රියාකාරී සහාය දක්වා කටයුතු කරමින් සිටී. **ERP** (ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක්) සහ විද්‍යුත් ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීම හරහා අපි මෙම පරිවර්තනය ඉදිරියට ගෙන යාමට සැලසුම් කරමු. මෙම උත්සාහයේ අරමුණ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව වැඩි දියුණු කිරීම මඟින් සැලකිය යුතු වර්ධනයකට මාවත විවර කර ගැනීමයි. ඩිජිටල්කරණයේ ප්‍රතිලාභ අතරට උපරිම කාර්යක්ෂමතාව, වැඩි විනිවිදභාවය, දූෂණ අවම කිරීම සහ වඩාත් දියුණු ආර්ථික හා සමාජීය ස්ථාවරත්වය ද ඇතුළත් වේ.

අපගේ කළමනාකරණ මණ්ඩලයේ සහ සියලු සේවකයින්ගේ, විශේෂයෙන් සංස්ථාවේ සියලු වෘත්තීය සමිතිවල කැපවීම නොමැතිව අපගේ සාර්ථකත්වය මුදුන් පත්කර ගත නොහැකි වනු ඇති අතර ඔවුන්ගේ කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් අපි ඔවුන්ට කෘතඥ වෙමු. විශිෂ්ට සේවාවක් ලබාදුන් සියලු පාර්ශවකරුවන්ට අපි අපගේ අවංක ස්තුතිය පුද කරමු. අපි එක්ව සෞඛ්‍ය සම්පන්න අනාගතයක් නිර්මාණය කරමු.

**මෙවන් එල්. සුබසිංහ ආරච්චි**
**කළමනාකාර අධ්‍යක්ෂ**

# අධ්‍යක්ෂ මණ්ඩලය

**වෛද්‍ය මනුජ් සී වීරසිංහ**
**සභාපති**

වෛද්‍ය මනුජ් සී වීරසිංහ මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයෙන් 1998 දී වෛද්‍ය උපාධිය ලබා ඇත. දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ සීමාවාසික පුහුණුව සම්පූර්ණ කළ පසු ඒ මහතා 1999 දී කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රජා වෛද්‍ය දෙපාර්තමේන්තුවේ කථිකාචාර්යවරයෙකු ලෙස 2024 ජූලි දක්වා වසර 25 ක් සේවය කර ඇත.

ඔහු වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ MSc උපාධිය හා ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ MD උපාධියත් කොළඹ විශ්ව විද්‍යාලයේ කලා පීඨයෙන් ව්‍යවහාරික සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවත් ලබා ඇත. ඒ මහතා ඇමරිකා එක්සත් ජනපදයේ (Pittsburg) පිට්ස්බර්ග් විශ්ව විද්‍යාලයේ මහජන සෞඛ්‍ය උපාධි පාසලෙන් (Post Doctoral Fellowship) පශ්චාත් ආචාර්ය උපාධි ශිෂ්‍යත්වයක් ද සම්පූර්ණ කර ඇත.

2017 ජනවාරි මස ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය ධුරයට පත් ඔහු 2016 සිට 2022 දක්වා වසර 6 ක් ප්‍රජා වෛද්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස ද 2021-2023 දක්වා PGIM හි ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලයේ සභාපති ලෙස සේවය කරන ලදි.

මහාචාර්ය වීරසිංහ මහතා වසර නවයකට අධික කාලයක් දේශීය වෛද්‍ය ආයතනයේ කළමනාකරණ මණ්ඩල පීඨය නියෝජනය කල අතර වසර 6 ක්, විශේෂයෙන් COVID-19 වසංගතය අතරතුර,පිටකෝට්ටේ (MOH) විශ්ව විද්‍යාල ක්ෂේත්‍ර ප්‍රායෝගික ප්‍රදේශයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරි තනතුරේ ආරම්භක සාමාජිකයෙකු වූ අතර, ජාතික විද්‍යා පදනමේ, ජාතික සෞඛ්‍ය පර්යේෂණ කවුන්සිලයේ උපදේශක වරයෙකු සහ ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරන ලදි.

ඔහු ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ හිටපු උප සභාපතිවරයෙකු, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ හිටපු සභාපතිවරයෙකු සහ දැනට People’s Health Movement පාලක මණ්ඩලයේ දකුණු ආසියානු නියෝජිතයෙක් ලෙස කටයුතු කරයි.

වෛද්‍ය මනුජ් සී වීරසිංහ මහතා පර්යේෂණ ලිපි 55 කට අධික ප්‍රමාණයක්, සම්මන්ත්‍රණ ඉදිරිපත් කිරීම් 100 කට අධික ප්‍රමාණයක්, මොනොග්‍රෑම්, පොත් පරිච්ඡේද සහ පර්යේෂණ වාර්තා ගණනාවක් ප්‍රකාශයට පත් කර ඇත. ඔහුගේ බොහෝ කාර්යයන් ඖෂධ ප්‍රතිපත්තිය, ඖෂධ - වසංගත විද්‍යාව සහ ඖෂධ - ආර්ථිකය හා සම්බන්ධ වෙයි. එතුමා තම වෘත්තීය ජීවිතය තුළ ආචාර්ය උපාධි සිසුන් 15 කට අධික සංඛ්‍යාවක්, ශාස්ත්‍රපති සිසුන් 14 දෙනෙකු සහ උපාධි අපේක්ෂකයින් 100 කට අධික සංඛ්‍යාවක් පර්යේෂණ සිසුන් අධීක්ෂණය කර ඇති අතර විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ගණනාවක් දිනා ඇත.

ආචාර්ය වීරසිංහ මහතා පේරාදෙණිය, රුහුණ, රජරට, ශ්‍රී ජයවර්ධනපුර, නැගෙනහිර, විවෘත විශ්වවිද්‍යාලය, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, ඉන්දියාවේ ටාටා ආයතනය, International People’s Health University සහ ගල්ෆ් අරාබි විශ්වවිද්‍යාලය, බහරේන් සහ එක්සත් රාජධානියේ “Coventry University” ඇතුළු අනෙකුත් විශ්වවිද්‍යාලවල බාහිර මහාචාර්යවරයෙකු සහ පරීක්ෂකයෙකු ලෙස කටයුතු කර ඇත.

ජාතික බෝවන රෝග උපදේශක කමිටුව ඇතුළු මහජන සෞඛ්‍ය පිළිබඳ කමිටුවල උපදේශක වරයෙක් ලෙස සහ HIV/AIDS පිළිබඳ උපාය මාර්ගික තොරතුරු කමිටුවේ සභාපති ලෙස දශක දෙකකට වැඩි කාලයක් වෛද්‍ය වීරසිංහ මහතා සෞඛ්‍ය අමාත්‍යාංශයට සිය සේවාව ලබා දී ඇත.

ඔහු WHO" UNICEF" UNFPA" Save the Children" The World Bank සහ GFATM ආයතන වල බොහෝ පැවරුම් භාර ගෙන ඇති අතර එම ආයතන වල උපදේශක වරයෙක් ලෙස ද කටයුතු කර ඇත.

**එම්. එල්. සුබසිංහ ආරච්චි මහතා**
**කළමනාකාර අධ්‍යක්ෂ**

එම්.එල්. සුබසිංහ ආරච්චි මහතා වෘත්තියෙන් කීර්තිමත් ප්‍රධාන විධායක නිලධාරියෙක්, ආර්ථික විද්‍යාඥයෙක්, බැංකුකරුවෙක් සහ ව්‍යාපාර උපදේශකයෙකි. සිය වෘත්තීය ජීවිතය ශ්‍රී ලංකා කොමර්ෂල් බැංකුවෙන් ආරම්භ කල ඔහු පේරාදෙණිය සහ කැලණිය විශ්වවිද්‍යාලවලින් ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් සහ පශ්චාත් උපාධියත් ලබාගෙන ඇත. ඔහු ආර්ථික විද්‍යාව සහ බැංකු කරණය පිළිබඳ කථිකාචාර්යවරයෙකු ලෙස ද කටයුතු කර ඇති අතර වසර 30 කට අධික කළමනාකරණ පළපුරුද්දක් ඇති අතර ඔහු ප්‍රමුඛ පෙළේ පෞද්ගලික සමාගම් වල කළමනාකාර අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි ලෙස කටයුතු කර ඇත.

පසුගිය දශක කිහිපය තුළ රජය ව්‍යාපාර පරිපාලනය සහ කළමනාකරණය පිළිබඳ පුළුල් අත්දැකීම් ඇති සුබසිංහ ආරච්චි මහතා, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති සහ ශ්‍රී ලංකා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සභාපති ලෙස සේවය කර ඇති ඔහු මේ වන විට ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස සේවය කරයි.

සුබසිංහ ආරච්චි මහතා කීර්තිමත් පරිපාලකයෙකි, ඔහු යහපාලනය ක්‍රියාත්මක කිරීම සහ දූෂණයෙන් තොර ඉහළ ලාභදායී තත්වය කරා ආයතන මෙහෙයවීම සම්බන්ධයෙන් ප්‍රකට ය.

**එස්.එස්. විජේදෝරු මහතා**
**අධ්‍යක්ෂ**

එස්.එස්. විජේදෝරු මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධිය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ MBA (PIM - SJU) උපාධිය ලබා ඇත. එසේම, ඔහු ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් L.L.B උපාධිය හා ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් නීතිඥ උපාධියත් ලබා ඇත. ඔහු වරලත් පිරිස් කළමනාකරණ ආයතනයෙන් (CIPM) මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව හා මනෝවිද්‍යා හා උපදේශන ආයතනයෙන් මනෝවිද්‍යාව සහ උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව සාර්ථකව සම්පූර්ණ කර ඇත. ඔහු ජාතික වෘත්තීය උපදේශක ආයතනයේ (NIPC) සාමාජිකයෙකි.

විජේදෝරු මහතා යුද සමයේ දී ශ්‍රී ලංකා නාවික හමුදාවේ උතුරු සහ නැගෙනහිර මෙහෙයුම් ප්‍රදේශවල අධිකාරී ලත් නිලධාරියෙකු ලෙස සේවය කර ඇති අතර රිවිරැස මෙහෙයුම් පදක්කම සහ පූර්ණ භූමි පදක්කම යන යුද සේවා පදක්කම් වලින් පිදුම් ලබා ඇත. ඔහු ලක්බිම පුවත්පත් (පුද්ගලික) සමාගමේ මානව සම්පත් ප්‍රධානියෙකු ලෙස සේවය කළේය. ඉන් පසු රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට බැඳී මානව සම්පත් හා සැපයුම් අංශයේ සහකාර සාමාන්‍යාධිකාරීවරයෙකු ලෙස විශ්‍රාම ගොස් මේ වන විට නීතිඥවරයෙකු සහ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ලෙස කටයුතු කරයි.

**කේ.ඩී. පැරකුම් ශාන්ත මහතා**
**අධ්‍යක්ෂ**

කේ. ඩී. පැරකුම් ශාන්ත මහතා විශ්‍රාමික අතිරේක මිනුම්පතිවරයෙකු වන අතර, ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ වසර 36 කට වැඩි කීර්තිමත් සේවයක් සහිත ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි. ඔහු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මිනින්දෝරු ජනරාල්, නියෝජ්‍ය මිනින්දෝරු ජනරාල් සහ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී ආදී ප්‍රධාන තනතුරු දරා ඇත.

ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධියත් මැනුම් හා සිතියම් කරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාවත්, ITC (නෙදර්ලන්තය) වෙතින් ඒකාබද්ධ සිතියම් සහ භූ තොරතුරු ගොඩනැගීම පිළිබඳ විද්‍යාපති උපාධිය, වෘත්තිකයන් සඳහා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව හා පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ඇත.

ඉතා පළපුරුදු මැනුම් සහ සිතියම්කරණ විශේෂඥයෙකු ලෙස, ඔහුගේ විශේෂඥතාව භූමිතික පාලනය, GIS, ඡායාරූපමිතිය, දුරස්ථ සංවේදනය, ඉඩම් පරිපාලනය සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් දක්වා විහිදේ. ඔහු මැනුම්, සිතියම් ගත කිරීම, ඉඩම් ලියාපදිංචි කිරීම, ඩිජිටල් දත්ත කළමනාකරණය සහ ආපදා ප්‍රතිචාර දැක්වීම ආදී ජාතික ව්‍යාපෘති මෙහෙයවා ඇත.

අතින් සිදු කරන මැනුම් සහ සිතියම් ගත කිරීම ආදි ක්‍රියාවලින් සම්පූර්ණයෙන්ම ඩිජිටල් වැඩ ප්‍රවාහයක් බවට පරිවර්තනය කිරීම, දත්ත සැකසුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ අවකාශීය දත්ත සමුදායක් හරහා ප්‍රමිති ගත සමීක්ෂණ සැලසුම් සහ ගුණාංග ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහා ඔහු වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. ඔහුගේ උත්සාහයන් ශ්‍රී ලංකාවේ භූ අවකාශ දත්ත කළමනාකරණය සැලකිය යුතු ලෙස නවීකරණය වී ඇත.

පැරකුම් ශාන්ත මහතා ඔහුගේ වෘත්තීය භූමිකාවට අමතරව, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල කිහිපයක බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස කටයුතු කර ඇති අතර, මැනුම්, GIS සහ ඡායාරූපමිතිය පිළිබඳ විශේෂඥයෙකි. ඔහුගේ පර්යේෂණ දායකත්වයෙන් අතරට දුරස්ථ සංවේදනය, GIS ඒකාබද්ධ කිරීම සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණවල භූලක්ෂණාත්මක දත්ත කළමනාකරණය පිළිබඳ ප්‍රකාශන ඇතුළත් වේ.

ඔහු ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ සහ ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනයේ සාමාජිකයෙකි.

**කේ.වී.සී. දිල්රුක්ෂි මහත්මිය**

චන්දිමා දිල්රුක්ෂි මහත්මිය ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරිණියක් වන අතර දැනට මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරියක් ලෙස සේවය කරයි. රාජ්‍ය සේවයේ වසර 23 ක පමණ පළපුරුද්දක් ඇති ඇය, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන පරීක්ෂකවරියක් ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කර, 2005 වසරේ දී ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට සම්බන්ධ වී ඇත. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ වසර 20 ක සේවා කාලය තුළ ඇය තැපැල් දෙපාර්තමේන්තුව, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව සහ මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව ඇතුළු දෙපාර්තමේන්තු කිහිපයක සේවය කර ඇත.

ඇය ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, LINDEL, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම, පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය, නාගරික සංවර්ධන අධිකාරිය, ලංකා විදුලි බල මණ්ඩලය සහ ජාතික සංවර්ධන බැංකුව ඇතුළු විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස සේවය කර ඇත. දැනට ඇය ලංකා ඛනිජ වැලි සමාගමේ සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කරයි. ඊට අමතරව, ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ පාලක මණ්ඩල සාමාජිකාවක් ලෙසත්, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමයේ විකල්ප සභාපතිනිය ලෙසත් කටයුතු කරයි. ඇය මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින් තාක්ෂණික ඇගයීම් කමිටු සහ ව්‍යාපෘති කමිටු කිහිපයකට ද සේවය ලබාදෙයි.

පාලන සහ රාජ්‍ය මූල්‍ය ක්ෂේත්‍රයේ ඇයගේ පුළුල් අත්දැකීම් සමඟින්, දිල්රුක්ෂි මහත්මිය රාජ්‍ය අංශයේ ආයතන සමඟ, විශේෂයෙන් රාජ්‍ය ව්‍යාපාර අංශය සමඟ සම්පත් දායකයෙකු ලෙස ඇගේ දැනුම සහ අත්දැකීම් බෙදා ගනී.

චන්දිමා දිල්රුක්ෂි මහත්මිය ජපාන ජාත්‍යන්තර විශ්ව විද්‍යාලයෙන් MBA උපාධියක් සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් MBS උපාධියක් ලබා ඇති අතර ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකාවක් ද වේ. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ගණකාධිකරණය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරිනියක් වන අතර ජපානයේ පශ්චාත් උපාධිය හදාරන අතරතුර, ජපාන ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයෙන් හොඳම අධ්‍යයන කාර්යසාධනය සඳහා වන “Tuck Scholar” සම්මානය ඇයට හිමි විය.

**ඊ.ඩී. වීරරත්න**
**අධ්‍යක්ෂ**

ඊ.ඩී. වීරරත්න මහතා 1983 දී කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයෙන් ඖෂධවේදී ඩිප්ලෝමාව ලබා ඇත. සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස වසර නවයක් සහ තොග පාලන නිලධාරී (ඖෂධ) ලෙස වසර විසි එකක් ලෙස වෛද්‍ය සැපයුම් අංශයේ වසර තිස් එකක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත.

ඔහු එලදායි ඖෂධ භාවිතය හඳුන්වා දීම හා ප්‍රවර්ධනයට පුරෝගාමී ව කටයුතු කරන ලදි.

රජයේ සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු, ඔහු වසර එකහමාරක් පමණ උපදේශකයෙකු ලෙසත්, වසර 5 ක් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලේ ප්‍රසම්පාදන උපදේශකයෙකු ලෙසත් සේවය කරන ලදි. වීරරත්න මහතා අවංකකම, දැනුම සහ කැපවීම නිසා ඔහුගේ උසස් නිලධාරීන් අතර ප්‍රකට චරිතයකි.

**වෛද්‍ය චන්දන අතපත්තු**
**අධ්‍යක්ෂ**

වෛද්‍ය චන්දන අතපත්තු මහතා 1998 දී කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයෙන් MBBS උපාධිය ලබා ගන්නා ලදි. ඔහු ශ්‍රී ලංකා සාමාන්‍ය වෛද්‍ය විද්‍යාලයෙන් (CGPSL) MCGP, කැලණිය විශ්ව විද්‍යාලයෙන් (ආහාර සහ පෝෂණය) පිළිබඳ MSc උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) MBA උපාධිය, වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකය (PGCMEd) සහ කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ (PGIM) වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි (MMEd) උපාධියත් ලබා ඇත. වෛද්‍ය අතපත්තු මහතා 1999 සිට සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විවිධ ආයතනවල විවිධ තනතුරු දරමින් සේවය කර ඇත. මේ වන විට ඔහු කළුබෝවිල, දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ (CSTH) ජ්‍යේෂ්ඨ වෛද්‍ය නිලධාරියෙකු ලෙස සේවය කරයි.

වෛද්‍ය අතපත්තු මහතා මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ උපදේශකවරයෙකි. ඔහු CGPSL හි MCGP අධ්‍යයන මණ්ඩලයේ ලේකම්වරයා වන අතර ඔහු CGPSL හි භාණ්ඩාගාරික සහ කවුන්සිල සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරයි. ඔහු CGPSL හි MCGP පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහනේ සායනික පුහුණුකරුවෙකු, උපදේශකයෙකු සහ පරීක්ෂකවරයෙකි. ඔහු 2000 වසරේ සිට ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ (SLMA) යාවජීව සාමාජිකයෙකු ලෙස කටයුතු කරන අතර එහි සහකාර භාණ්ඩාගාරික, SLMA පුවත් පත්‍රිකාවේ කර්තෘ සහ සභා සාමාජිකයෙකු ලෙස ද කටයුතු කර ඇත. තවද, ආචාර්ය අතපත්තු ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ (SLAAS) යාවජීව සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

ඔහු 2013 සිට 2018 දක්වා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) මණ්ඩල සාමාජිකයෙකු වූ අතර 2016 සිට 2020 දක්වා එහි සහකාර ලේඛකාධිකාරී ලෙසත් 2018 සිට 2019 දක්වා ලේඛකාධිකාරී (වැඩබලන) ලෙසත් කටයුතු කර ඇත. ඔහු "Professional Conduct Committee" වෘත්තීය චර්යා කමිටුවේ සාමාජිකයෙකු වූ අතර ශ්‍රී ලංකාවේ වෛද්‍ය අධ්‍යාපනයේ අවම ප්‍රමිතීන් සකස් කළ කමිටුවේ සාමාජිකයෙකු විය. තවද, ඔහු ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පිළිගැනීම සඳහා විදේශීය වෛද්‍ය විද්‍යාල සමාලෝචකයෙකු ද විය. වෛද්‍ය අතපත්තු මහතා 2018 සිට 2020 දක්වා පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන කවුන්සිලයේ (PHSRC) නිල බලයෙන් සාමාජිකයෙකු වූ අතර එහි ලියාපදිංචි කිරීමේ කමිටුවේ සහ පැමිණිලි කමිටුවේ සාමාජිකයෙකු ලෙස සේවය කරන ලදි.

2005 දී ජාතික ඖෂධ ප්‍රතිපත්තිය සකස් කළ කමිටුවේ සාමාජිකයෙකු ලෙස ඔහු සේවය කළ අතර ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් පත් කරන ලද ජාතික ස්ථාවර කමිටුවේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරන ලදි. ඔහු 2005 දී ජාතික ඖෂධ නියාමන පනත කෙටුම්පත් කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ සාමාජිකයෙකු ද විය.

2008 සිට 2009 දක්වා "සෞඛ්‍ය අමාත්‍යාංශයේ යුධ අනතුරු කළමනාකරණය සම්බන්ධීකරණ කමිටුවේ" සාමාජිකයෙකු ලෙස සහ 2009 දී "උතුරු පළාතේ අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් සඳහා වූ සෞඛ්‍ය සේවා සම්බන්ධීකරණ කමිටුවේ සාමාජිකයෙකු ලෙස ද වෛද්‍ය අතපත්තු මහතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදි. තවද, වෛද්‍ය අතපත්තු මහතා 2020 සිට 2021 දක්වා COVID 19 පැතිරීම වැළැක්වීම පිළිබඳ "DGHS තාක්ෂණික උපදේශක කමිටුවේ" සාමාජිකයෙකු වූ අතර, COVID-19 රෝගීන් කළමනාකරණය කිරීමේ දී ශ්‍රී ලාංකික ප්‍රාථමික සත්කාර වෛද්‍යවරුන් සඳහා මාර්ගෝපදේශ සකස් කිරීමට ක්‍රියාකාරී ලෙස සම්බන්ධ විය. ඔහු "2020 දී හෙද පුහුණු පාසල් උපාධි ප්‍රදානය කිරීමේ" මට්ටමට පරිවර්තනය කිරීම් සඳහා වූ ශ්‍රී ලංකා අධ්‍යාපන කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ මූලික කණ්ඩායමේ සාමාජිකයෙකු විය.

වෛද්‍ය අතපත්තු මහතා වෛද්‍ය අධ්‍යාපනය, ප්‍රාථමික සෞඛ්‍ය සේවා සහ සෞඛ්‍ය පුවත්පත් කලාව ඇතුළු විවිධ ක්ෂේත්‍රවල දේශීය හා ජාත්‍යන්තර සඟරා ලිපි ප්‍රකාශයට පත් කර ඇත.

# ආයතනික තොරතුරු

| | | |
|---|---|---|
| වෛද්‍ය යු.අජිත් මෙන්ඩිස් මහතා | සභාපති | (2024.09.30 දක්වා) |
| වෛද්‍ය එච්. එම්. අර්ජුන තිලකරත්න මහතා | සභාපති | (2024.10.01 සිට 2024.11.22 දක්වා) |
| වෛද්‍ය. මනුජ් සී. වීරසිංහ මහතා | සභාපති | (2024.11.22 සිට) |
| එම්. එල්. සුබසිංහ ආරච්චි මහතා | කළමනාකාර අධ්‍යක්ෂ | (2024.01.01 සිට) |
| වෛද්‍ය චින්තක ද සිල්වා මහතා | අධ්‍යක්ෂ | (2024.12.12 දක්වා) |
| මහාචාර්ය ආර්.එම්.ඩී.මැදගෙදර මහතා | අධ්‍යක්ෂ | (2024.09.25 දක්වා) |
| පි.එල්.කේ. පෙරේරා මහතා | අධ්‍යක්ෂ | (2024.03.18 සිට 2024.12.12 දක්වා) |
| මලර්මති ගංගාතරන් මහත්මිය | අධ්‍යක්ෂ | (2024.12.12. දක්වා) |
| වෛද්‍ය සී.එල්.කේ. අතපත්තු මහතා | අධ්‍යක්ෂ | (2024.12.12 සිට) |
| කේ.වී.සී. දිල්රුක්ෂි මහත්මිය | අධ්‍යක්ෂ | (2024.12.12 සිට) |
| ඊ.ඩී. වීරරත්න මහතා | අධ්‍යක්ෂ | (2024.12.12 සිට) |
| එස්. සමීර විජේදෝරු මහතා | අධ්‍යක්ෂ | (2024.12.12 සිට) |
| පැරකුම් ශාන්ත මහතා | අධ්‍යක්ෂ | (2024.12.12 සිට) |

**විගණන කමිටුව**

| | | |
|---|---|---|
| මලර්මති ගංගාතරන් මහත්මිය | සභාපතිනී | (2024.12.12. දක්වා) |
| මහාචාර්ය ආර්.එම්.ඩී.මැදගෙදර මහතා | සාමාජික | (2024.09.25 දක්වා) |
| වෛද්‍ය චින්තක ද සිල්වා මහතා | සාමාජික | (2024.12.12. දක්වා) |
| පි.එල්.කේ. පෙරේරා මහතා | සාමාජික | (2024.12.12 දක්වා) |

**විගණකවරු**

විගණකාධිපති තුමා,
ජාතික විගණන කාර්යාලය,
අංක. 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

**බැංකුකරුවෝ**

**ලංකා බැංකුව**

ආයතනික ශාඛාව, ලංකා බැංකු මාවත,කොළඹ 01.

**මහජන බැංකුව**

ජාත්‍යන්තර ශාඛාව, තැ.පෙ. 437, ඩී.එන්.සී.එල් ගොඩනැගිල්ල,
ඩී. ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.

**ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුව**

තැ.පෙ. 37, 112 යෝර්ක් වීදිය, කොළඹ 01.

**කොමර්ෂල් බැංකුව**

නගර ශාඛාව, 98, යෝර්ක් වීදිය, කොළඹ 01.

**ලියාපදිංචි කාර්යාලය**

අංක. 75. සර් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.

**ව්‍යාපාරික කාර්යාලය**

16 වන මහල, අංක 41, “මෙහෙවර පියස”, කිරුළ පාර, කොළඹ 05.

**සංස්ථාපනය කළ දිනය**

1971 සැප්තැම්බර් 22.

# කළමනාකරණ මණ්ඩලය



**කේ. එම්. ඩී. ආර්. දසනායක මහතා**
**සාමාන්‍යාධිකාරී**

දිනුෂ දසනායක මහතා කළමනාකාර අභ්‍යාසලාභියෙකු ලෙස 1999 දෙසැම්බර් 1 වන දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සම්බන්ධ වූ අතර 2009 ජුනි මස 1වන දින සිට මේ දක්වා සංස්ථාවේ සාමාන්‍යාධිකාරිවරයා ලෙස කටයුතු කරයි. සාමාන්‍යාධිකාරිවරයා ලෙස පත්වීමට පෙර සංස්ථාවේ මානව සම්පත්, පරිපාලන, නීති හා ආනයන අංශවල සේවය කර ඇති අතර එම අංශවල නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා ලෙස ද කටයුතු කර ඇත.

දිනුෂ දසනායක මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ වාණිජවේදී (විශේෂ) උපාධිධාරියෙකි. ජපානයේ නගෝයා විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර වෙළඳ නීතිය හා විශේෂිත වූ ජාත්‍යන්තර සහයෝගිතාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙකු වන ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකි. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීතිය පිළිබඳ උසස් අධ්‍යාපන ආයතනයේ ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාධාරියෙකි. ඔහු බලයලත් වාණිජ සමථකරුවෙකු වශයෙන් ද සුදුසුකම් ලබා ඇත.



**නිම්මිකා තුෂාරි මහත්මිය**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( මානව සම්පත් හා පරිපාලන)**

නිම්මිකා තුෂාරි මහත්මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( මානව සම්පත් හා පරිපාලන) ලෙස 2018 අගෝස්තු මස 1 වන දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සම්බන්ධ විය. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව සම්පත් පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිධාරිනියක් වන අතර කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් ප්‍රවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරිනියකි. ඇයට මානව සම්පත් කළමනාකරණ හා පරිපාලන ක්ෂේත්‍රය පිළිබඳ වසර 25 ක පමණ පළපුරුද්දක් ඇත.



**හිරන්‍යා සම්මන්දප්පෙරුම මහත්මිය නියෝජ්‍ය**
**සාමාන්‍යාධිකාරී - (තාක්ෂණ හා රසායනගාර)**

හිරන්‍යා සම්මන්දප්පෙරුම මහත්මිය කළමනාකරණ ගණකාධිකාරීවරිය ලෙස 2007 ජූලි මස 01 වන දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සම්බන්ධ විය. මූල්‍ය කළමනාකරණය, කළමනාකරණ ගණකාධිකරණය හා විගණනය යන අංශ පිළිබඳ වසර 25 කට වඩා පළපුරුද්දක් ඇති ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) හා ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ (CMA) ගණකාධිකාරීවරියක් වේ. එක්සත් රාජධානියේ වරලත් සහතික පත්‍ර ගණකාධිකරණ ආයතනයේ (ACCA-UK) සාමාජිකත්වය ද අපේක්ෂාවෙන් සිටී.

හිරන්‍යා සම්මන්දප්පෙරුම මහත්මිය කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය කළමනාකරණයට විශේෂිත ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ගෞරව උපාධියක් 2001 වසරේ දී ලබාගෙන ඇති අතර කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරිනියකි.



**අයන්ති අල්විස් මහත්මිය**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන සහ ආනයන - ඖෂධ)**

ඒ. එච්. අල්විස් මහත්මිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන සහ ආනයන - ඖෂධ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී කළමනාකරණ උපාධිය (සාමාන්‍ය) සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. එයට අමතරව ඇය SLIDA ආයතනයේ රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත්තු පරිපාලනය පිළිබඳ ඩිප්ලොමාධාරිනියකි. ඇයගේ විෂය පථයට ඇතුළත් වන ආනයන අංශ හතරෙහි ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් නියමිත කාල රාමුව තුල සම්බන්ධීකරණය කිරීම හා කළමනාකරණය කිරීම ඇය විසින් සිදු කරයි.



**ඩී.එන්. දේවසුරේන්ද්‍ර මහත්මිය**
**වැඩබලන. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)**

ඩී.එන්. දේවසුරේන්ද්‍ර මහත්මිය 2000 මාර්තු 01 වැනි දින ගණකාධිකාරිවරියක් ලෙස රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සම්බන්ධ විය. ඇයට ගිණුම්කරණය, මූල්‍ය කළමනාකරණය සහ විගණන ක්ෂේත්‍රයේ වසර 32කට වැඩි පළපුරුද්දක් ඇත.

ඇය AATSL හි සාමාජිකාවක් වන අතර ICASL හි අවසාන මට්ටම 1 දක්වා සම්පූර්ණ කර ඇත. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී (සාමාන්‍ය) උපාධියක් සහ කැලණිය විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර මූල්‍ය පිළිබඳ ශාස්ත්‍රපති (MBF) උපාධිය ලබා ඇත.



**ජී. අසංක ඉරෝෂන මහතා**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි)**

ජී.අසංක ඉරෝෂන මහතා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) ලෙස 2024.08.20 වන දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සම්බන්ධවිය. අලෙවිකරණ ක්ෂේත්‍රයේ වසර 14 ක පමණ පළපුරුද්දක් ඇත්තෙක් වන ඔහු එක්සත් රාජධානියේ චරලත් අලෙවිකරණ ආයතනයේ සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ සාමාජිකයෙකු ද වේ. දිවයින පුරා අලෙවිසැල් 60 කට වැඩි සංඛ්‍යාවක් සහ රත්මලාන ප්‍රධාන ගබඩාව ද ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඔසුසල ජාලය ඔහු කළමනාකරණය කරයි. අසංක ඉරෝෂන මහතා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී ගෞරව උපාධියක්, නිව් බකිංහැම්ෂයර් විශ්වවිද්‍යාලයෙන් (එක්සත් රාජධානිය) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් සහ චරලත් අලෙවිකරණ ආයතනයෙන් (CIM-UK) අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ඇත.

# කළමනාකරණ මණ්ඩලය

## ජ්‍යෙෂ්ඨ කළමනාකරණය

| | |
|---|---|
| ඒ.එච්. අල්විස් මහත්මිය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන සහ ආනයන) I |
| එම්.ආර්.එන්. තුෂාරි මහත්මිය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( මානව සම්පත් හා පරිපාලන) |
| එස්.එම්.ඒ.ඩී.එස්.එච්.සම්මන්දප්පෙරුම මහත්මිය | නියෝජ්‍ය සාමාන්‍යධිකාරී (තාක්ෂණ හා රසායනාගාර) |
| පී.ඒ.ඉරෝෂන මහතා | නියෝජ්‍ය සාමාන්‍යධිකාරී (අලෙවි) (2024.08.20 සිට) |
| ඩී.එන්. දේවසුරේන්ද්‍ර මහත්මිය | වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය / ගණකාධිකාරී - ආදායම් |
| එම්.ඒ.වී.අයි. කුමාරසිරි මහතා | ක්ෂේත්‍ර කළමනාකරු - බෙදාහැරීම් පද්ධති සමාලෝචන |
| ඩී.පී. අජිත් ලියනගේ මහතා | කළමනාකරු - කළමනාකරණ තොරතුරු පද්ධති (2024.07.25 දක්වා) |
| පී.කේ.ආර්. ප්‍රනාන්දු මහතා | වාප්පු කළමනාකරු |
| සී.එස්. විතානගේ මෙනෙවිය | කළමනාකරු - ම.මි.ගැ.ඒකකය |
| පී.ඒ.යූ. විජේවර්ධන මහත්මිය | නීති නිළධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් |
| පී.එම්.බී.ආර්. සෝමතිලක මහතා | නිෂ්පාදන කළමනාකරු (2024.12.13 දක්වා) |
| ඒ.පී. හපන්ගම මහතා | ගණකාධිකාරී - පොත් තැබීම් |
| එල්.ඩබ්ලිව්. දමයන්ති මහත්මිය | ගණකාධිකාරී - වැටුප් (2024.12.12 දක්වා) |
| එම්.ඒ. එස්. කරුණාරත්න මහත්මිය | ගණකාධිකාරී - ඔසුසල |
| ඩී.කේ.ඒ.පී. දසනායක මහතා | පරිපාලන කළමනාකරු |
| කේ.ඩී.එෆ්.එන්.පෙරේරා මහතා | විකුණුම් කළමනාකරු |
| ඩී.ඩී.එස්. තරංගමාලා මහත්මිය | කළමනාකරු - ප්‍රසම්පාදන |
| ආර්.පී. විතානගේ මහත්මිය | කළමනාකරු - ප්‍රසම්පාදන |
| කේ.පී.එස්. පෙරේරා මහත්මිය | ගණකාධිකාරී - ඔසුසල |
| එම්.ඒ.ඩී.එස්.එස්. මුණසිංහ මහතා | කළමනාකරු - ආනයන |
| බී.ඒ.කේ. මදුසංක මහතා | කළමනාකරු - මානව සම්පත් (2024.03.01 දක්වා) |
| එම්.කේ.සී. ක්‍රිශාන්ත මහතා | කළමනාකරු - රාජ්‍ය ඔසුසල |
| ඩබ්ලිව්. ජයන්ත මහතා | කළමනාකරු - රාජ්‍ය ඔසුසල (2024.06.19 දක්වා) |
| එම්.ආර්.එම්.රිෆ්කාන් මහතා | කළමනාකරු - ශල්‍ය උපකරණ |
| ඊ.එම්.එච්.එන්.ටී.කේ. ඒකනායක මහත්මිය | කළමනාකරු - තාක්ෂණ |
| එච්.එන්.ජේ.ඉදුනිල් මහතා | අභ්‍යන්තර විගණක |
| ඩබ්ලිව්.ඒ ටී. ප්‍රේමවර්ධන මහතා | කළමනාකරු - රාජ්‍ය ඔසුසල |
| අයි.ජී.ඩබ්ලිව්.එස්. විමලසේන මෙනෙවිය | කළමනාකාරී - පර්යේෂණ හා නව ව්‍යාපෘති (2024.04.27 දක්වා) |
| පී.ඒ.එස්. පතිරණ මහතා | ගණකාධිකාරී - තොග හා මිල කිරීම් |
| ඊ.කේ.පී.ඒ. ප්‍රියදර්ෂණී මහත්මිය | කළමනාකාරී - ප්‍රවර්ධන හා ප්‍රචාරක |
| ඩබ්ලිව්.කේ.එම්.එස්. වන්නිආරච්චි | කළමනාකරු - පසු බෙදාහැරීමේ කටයුතු |
| එම්.ඒ.එස්.ජී.ටී. පෙරේරා මහතා | කළමනාකරු - ගබඩා හා තොග පාලන |
| බී.ටී.ඒ.එම්. අභයවර්ධන මහතා | කළමනාකරු - රාජ්‍ය ඔසුසල (2024.06.03 සිට) |
| ඩී.සී.එස්. බණ්ඩාර මහතා | කළමනාකරු - රාජ්‍ය ඔසුසල (2024.07.23 සිට |
| එස්.ආර්. කල්පගේ මහත්මිය | කළමනාකරු - මානව සම්පත් (2024.01.24 සිට) |
| ඩබ්ලිව්.ඒ.වී. සමන්ති මහත්මිය | කළමනාකරු - තත්ත්ව පාලන රසායනාගාරය (2024.04.16 සිට) |

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්ෂික වාර්තාව

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟින් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල වාර්ෂික වාර්තාව සතුටින් ඉදිරිපත් කරමු.

**ආරම්භය**

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තිය යටතේ අංක 14976/8 දරණ ගැසට් නිවේදනය මඟින් 1971 සැප්තැම්බර් 22 වන දින ශ්‍රී ලංකා රජයේ අනුමැතිය හා එවකට කාර්මික හා විද්‍යා කටයුතු අමාත්‍යතුමාගේ නියෝගය මත රුපියල් මිලියනයක මූලික ප්‍රාග්ධනයකින් යුක්තව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ස්ථාපිත කරන ලදි.

**ගණකාධිකරණ ප්‍රතිපත්ති**

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 23 සිට 31 දක්වා ඉදිරිපත් කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු වෙනසක් සිදු කර නොමැත.

**අඛණ්ඩ පැවැත්ම**

අඛණ්ඩ පැවැත්මේ සංකල්පය පදනම් ව මූල්‍ය වාර්තා පිළියෙල කරන අතර ඉදිරියේ දී සිය මෙහෙයුම් කටයුතු කර ගෙන යාමට ප්‍රමාණවත් සම්පත් සංස්ථාව සතුව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වේ.

**ප්‍රතිඵල**

ප්‍රවර්තන වසරෙහි මූල්‍ය ප්‍රතිඵල සහ ස්කන්ධය වෙනස් වීම පිළිබඳ දත්ත ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය මඟින් අනාවරණය කර ඇත.

**ව්‍යාපාර සමාලෝචනය**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය ශේෂ පත්‍රයෙහි දක්වා ඇති අතර ඒ පිළිබඳ ඇගයීමක් කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාවේ ඇතුළත් කර ඇත.

**දේපළ, පිරියත හා උපකරණ**

මූල්‍ය ප්‍රකාශනයෙහි ප්‍රවර්තන වසරට අදාළ දේපළ, පිරියත හා උපකරණ වල සිදු වූ වෙනස්කම් සටහන් අංක 16 මඟින් දක්වා ඇත. මෙම සටහනෙහි පෙන්වන වටිනාකම් ඒවායේ වර්තමාන වෙළඳපොළ අගය හා ප්‍රමාණාත්මක වෙනස්කම් නොපවතී.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- විවෘත වෙළඳපොළ වෙත ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය, මිලදී ගැනීම, විකිණීම සහ බෙදාහැරීම.
- සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය කර සැපයීම.
- ජීවනී, ග්ලූකෝස් සහ බෙන්සිල් බෙන්සොවේට් ක්‍රීම් නිෂ්පාදනය කිරීම සහ විකිණීම.
- රසායනාගාර පහසුකම් සහ වෛද්‍ය පරීක්ෂණ පහසුකම් සැපයීම.

පසුගිය මූල්‍ය වර්ෂය තුල සංස්ථාවේ ක්‍රියාකාරකම් වල සැලකිය යුතු වෙනසක් සිදුව නොමැත.

**සංචිත**

ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය තුල සංස්ථාවේ මූල්‍ය සංචිත වල වටිනාකම හා එහි සංයුතිය දක්වා ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලය

2024 දෙසැම්බර් 31 වන දිනට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| වෛද්‍ය යූ. අජිත් මෙන්ඩිස් | සභාපති | (2024.09.30 දක්වා) |
| වෛද්‍ය එච්. එම්. ඒ. තිලකරත්න මහතා | සභාපති | (2024.10.01 සිට 2024.11.22 දක්වා) |
| වෛද්‍ය. මනූජ් සී. වීරසිංහ මහතා | සභාපති | (2024.11.22 සිට) |
| එම්.එල්. සුබසිංහ ආරච්චි කළමනාකාර | අධ්‍යක්ෂ | (2024.01.01 සිට) |
| වෛද්‍ය චින්තක ද සිල්වා | අධ්‍යක්ෂ | (2024.12.12 දක්වා) |
| මහාචාර්ය ආර්.එම්.ඩී. මැදගෙදර | අධ්‍යක්ෂ | (2024.09.25 දක්වා) |
| පී.එල්.කේ. පෙරේරා මහතා | අධ්‍යක්ෂ | (2024.03.18 සිට 2024.12.12 දක්වා) |
| එම්. ගංගාතරන් මහත්මිය | අධ්‍යක්ෂ | (2024.12.12 දක්වා) |
| වෛද්‍ය සී.එල්.කේ. අතපත්තු මහතා | අධ්‍යක්ෂ | (2024.12.12 සිට) |
| කේ.වී.සී. දිල්රුක්ෂි මහත්මිය | අධ්‍යක්ෂ | (2024.12.12 සිට) |
| ඊ. ඩී. වීරරත්න මහතා | අධ්‍යක්ෂ | (2024.12.12 සිට) |
| එස්. සමීර විජේදෝරු මහතා | අධ්‍යක්ෂ | (2024.12.12 සිට) |
| පැරකුම් ශාන්ත මහතා | අධ්‍යක්ෂ | (2024.12.12 සිට) |

**විගණන කමිටුව**

රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට (Public Enterprises Guideline) අනුකූලව සංස්ථාවේ විගණන කමිටුව පිහිටුවා ඇත. විගණන කමිටු වාර්තාව පිටු අංක 17 දක්වා ඇත.

**සේවා නියුක්තිය**

සේවක නිපුණතා වර්ධනය කිරීම සඳහා යෝග්‍ය වන මානව සම්පත් කළමනාකරණ ක්‍රියා මාර්ග හා ප්‍රතිපත්ති සංස්ථාව මඟින් දිගින් දිගටම ක්‍රියාත්මක කරයි.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

අධ්‍යක්ෂවරුන්, ඔවුන්ගේ දැනුම හා විශ්වාසයේ පරිදි රජයට සහ සේවකයන් හට අදාළ සියලූ ම ව්‍යවස්ථාපිත ගෙවීම් යාවත්කාලීන කර ඇති බවට උපරිමයෙන් සෑහීමකට පත් වේ.

**පාරිසරික ආරක්ෂාව**

පරිසරයට අහිතකර කිසිදු ක්‍රියාකාරකමකට සංස්ථාව මැදිහත් වී නොමැත.

**රජයට දායකත්වය**

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව භාණ්ඩාගාර අයබදු හා ආදායම් බදු ලෙස රු. මිලියන 409ක් රාජ්‍ය භාණ්ඩාගාරයට ලබා දී ඇත.

**සංයුක්ත සමාජමය වගකීම**

සමාජමය වගකීම් ලෙස සලකා සංස්ථාව විසින් රු.21,730,639/- ක ප්‍රදානයන් ප්‍රවර්තන වර්ෂයේ දී කර ඇත.

**සබැඳි පාර්ශවයන් සමඟ ගනුදෙනු**

මූල්‍ය වාර්තාවේ සටහන් අංක 35 යටතේ සබැඳි පාර්ශව සමඟ ගනුදෙනු හෙළිදරව් කර ඇත.

**ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්**

ශේෂ පත්‍ර දිනට පසු ගිණුම් මඟින් ගැළපීමට හෝ හෙළිදරව් කිරීම සඳහා අවශ්‍ය වන කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැත.

**විගණකවරුන් පත් කිරීම**

1971 මුදල් පනතේ විධිවිධාන අනුව, රජයේ විගණකාධිපතිතුමා සංස්ථාවේ විගණකවරයා වන අතර 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය කටයුතු පිළිබඳ වාර්ෂික විගණනය සිදු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග මත

**අනුරාධා විජයවර්ධන**
**නීති නිලධාරිණී / අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

# විගණන කමිටු වාර්තාව

**විගණන කමිටුවේ ව්‍යවස්ථාව**

විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කරයි. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ, පහත සඳහන් සාමාජිකයන් විගණන කමිටුවේ රැස්වීම්වලට සහභාගි වූහ.

| | | |
|---|---|---|
| මලර්මතී ගංගාතරන් මහත්මිය | - | සභාපතිනී |
| මහාචාර්ය දුශාන්ත මැදගෙදර | - | සාමාජික (2024.09.25 දක්වා) |
| වෛද්‍ය චින්තක ද සිල්වා | - | සාමාජික |
| පී.එල්.කේ. පෙරේරා මහතා | - | සාමාජික (2024.03.18 සිට) |

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක, ජාතික විගණන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති සහ SPC හි ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී නිරීක්ෂකයින් ලෙස කමිටු රැස්වීම් සඳහා සහභාගී විය. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් හා අභ්‍යන්තර විගණක පිළිවෙළින් කමිටුවේ ලේකම් හා කැඳවුම්කරු ලෙස ක්‍රියා කරන ලදි.

**විගණන කමිටුවේ කාර්යභාරය**

විගණන කමිටුවේ ප්‍රධාන කාර්ය වන්නේ සංස්ථාවේ පවතින අභ්‍යන්තර පාලන පිළිවෙත් අධීක්ෂණය කිරීම හා සමාලෝචනය කිරීමත්, සංස්ථාවේ විගණන කටයුතු සහ මූල්‍ය කටයුතු පිළිබඳ සමාලෝචන හා නිර්දේශ ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම නිසියාකාරව ඉටු කිරීම සඳහා ඔවුන්ට සහය වීම වේ. සමාලෝචිත වර්ෂය තුල දී කමිටුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් වල නියැලෙන ලදි.

01. අභ්‍යන්තර විගණන සැලසුම් ඇගයීම, සමාලෝචනය හා අවශ්‍ය අවස්ථාවල සංශෝධනය කිරීමට නිර්දේශ කිරීම.

02. 2024 වසරට අදාළ අභ්‍යන්තර විගණන සැලසුම් සමාලෝචනය කිරීම හා අනුමත කිරීම.

03. පැනනැගී ඇති කරුණු වල ස්වභාවයත්, අදාළ කරුණු වලට කළමනාකරණයේ ප්‍රතිචාර හා අභ්‍යන්තර විගණන නිර්දේශත් ආවරණය වන ලෙස අභ්‍යන්තර විගණන වාර්තාවන් සමාලෝචනය කොට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ලබා දීම.

04. 1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 13(7) වී සහ 14(2) සී වගන්ති ප්‍රකාර විගණකාධිපති විසින් නිකුත් කර ඇති වාර්තාවල දක්වා ඇති කරුණු සමාලෝචනය කොට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ලබා දීම.

05. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) නිර්දේශ ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම.

**විගණන කමිටුවේ නිර්දේශ**

විගණන කමිටුවේ මග පෙන්වීම යටතේ, සමාලෝචිත වර්ෂය තුල දී අනුමත විගණන සැලැස්ම අභ්‍යන්තර විගණන අංශය මගින් ක්‍රියාත්මක කරන ලද අතර විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තාවල හා අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කරන ලද වාර්තාවල දක්වා ඇති අඩුපාඩු හා මූල්‍යමය අලාභ හා වංචා පිළිබඳ නිසි පියවර ගැනීමට සංස්ථා කළමනාකාරිත්වයට හා අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ නිර්දේශ ලබා දෙන ලදි. තවද, අභ්‍යන්තර විගණන අංශය විසින් අකාර්යක්ෂම ක්‍රියා පටිපාටි ඉවත් කිරීම, අභ්‍යන්තර පාලනය වැඩිදියුණු කිරීම, අලාභ අවම කිරීම සහ වංචා සහ දෝෂ ඇති විය හැකි අවස්ථා අවම කිරීම සඳහා මූල්‍ය හා පද්ධති විගණන සිදු කරන ලදි.

**රැස්වීම්**

2024 වර්ෂය තුල විගණන කමිටු රැස්වීම් හතරක් පවත්වන ලද අතර එහි දී හඳුනා ගන්නා ලද අඩුලුහුඬුකම් හා නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට හා කළමනාකාරිත්වයට ඉදිරිපත් කරන ලදි. ඒ අනුව, හඳුනා ගත් අඩුපාඩු සහ නිර්දේශ සැලකිල්ලට ගනිමින්, හඳුනා ගත් අඩුපාඩු සහ නිර්දේශ නිවැරදි කිරීමට සංස්ථා කළමනාකාරිත්වය වඩාත් වගකීමෙන් කටයුතු කළ යුතු ව තිබූ බව නිරීක්ෂණය කරමි.



**මලර්මතී ගංගාතරන්**
**විගණන කමිටුවේ සභාපතිනී**

# ආයතනික පාලන වාර්තාව

ආයතනික පාලනය යනු ආයතනයක් විසින් සියලු පාර්ශවකරුවන්ගේ යහපත වෙනුවෙන් ආයතනයේ සම්පත් ඵලදායී ලෙස භාවිතා කිරීම, මෙහෙයවීම සහ පාලනය සඳහා ආයතන යන්ත්‍රණයක් ස්ථාපිත කරනු ලබන සමස්ථ පද්ධතියයි. ආයතනික පාලනය සම්බන්ධ මූලික වගකීම සංස්ථාවේ සභාපතිතුමා හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරණු ලබයි.
අධ්‍යක්ෂවරු

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ට අදාළ ක්ෂේත්‍රයේ අත්දැකීම්, ඉහලම වෘත්තීය සහ පුද්ගලික ආචාරධර්ම සහ වටිනාකම් තිබිය යුතු වේ.

- අමාත්‍යතුමා විසින් තීරණය කළ මනා පරිචයක් හා සුදුසුකම් ඇති පුද්ගලයින් අතුරෙන් සභාපතිතුමා හා තවත් අධ්‍යක්ෂවරු 5 දෙනෙකු ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් පත් කරනු ලබයි.

- මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු මුදල් අමාත්‍යංශය විසින් නම් කරනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**

අධ්‍යක්ෂවරුන්ට සහ කළමනාකාරිත්වයට රැස්වීම් වල දී සාකච්ඡා කිරීමට අවශ්‍ය සියලුම ප්‍රධාන සහ උපාය මාර්ගික තොරතුරු සකස් කිරීමට හැකි වන පරිදි ප්‍රමාණවත් දැනුම්දීමක් ලබා දීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා දින නියම කරන අතර අධ්‍යක්ෂවරුන්ට සෑම රැස්වීමකට ම අවම වශයෙන් දින හතකට පෙර න්‍යාය පත්‍රය හා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ලබා දී අන්තර්ගතය අධ්‍යයනය කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙයි. අමතර තොරතුරු ඉදිරිපත් කිරීමට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වැඩිදුර පැහැදිලි කිරීම් ලබා දීමට අවශ්‍ය වූ විට පමණක් අධ්‍යක්ෂ මණ්ඩලයේ කැඳවීම මත අංශ ප්‍රධානීන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගී වේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දොළහක් කැඳවා ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ පැමිණීම පහත පරිදි වේ.

**කළමනාකරණ කමිටුව**

කළමනාකරණ කමිටුව සංස්ථාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් සමන්විත වන අතර සභාපතිවරයා විසින් සභාපතිත්වය උසුලයි. කළමනාකරණ කමිටුව වෙත යොමු කරන ලද සියලු ප්‍රතිපත්තිමය කරුණු හොඳින් විමසා බලන අතර අනුමැතිය හා ඒකඟතාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීමට පෙර ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීම ද නිරීක්ෂණය කරයි. මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට හා ප්‍රමාදයන් වළක්වා ගැනීමට කළමනාකරණ කමිටුව මාසිකව රැස්වී තීරණ ගනියි. වර්ෂය තුළ කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක් පවත්වා ඇත.

| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකගේ නම | තනතුර | පත්වීම් කාල සීමාව | පැමිණීම (සුදුසුකම් ලැබූව රැස්වීම සඳහා) |
|---|---|---|---|
| වෛද්‍ය එම්. ක්‍රිශාන්ත වීරසිංහ මහතා | සභාපති | 2024.11.22 සිට | 1/1 |
| එම්. එල්. සුබසිංහ ආරච්චි මහතා | කළමනාකාර අධ්‍යක්ෂ | 2024.01.01 සිට | 12/12 |
| වෛද්‍ය සී.එල්.කේ. අතපත්තු මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 2024.12.12 සිට | 1/1 |
| කේ.වී.සී. දිල්රුක්ෂි මහත්මිය | විධායක නොවන අධ්‍යක්ෂ | 2024.12.12 සිට | 1/1 |
| ඊ.ඩී. වීරරත්න මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 2024.12.12 සිට | 1/1 |
| එස්. සමීර විජේදෝරු මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 2024.12.12 සිට | 1/1 |
| පැරකුම් ශාන්ත මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 2024.12.12 සිට | 1/1 |
| **ඉවත් වූ සාමාජිකයින්** | | | |
| වෛද්‍ය යූ. ඩී. මෙන්ඩිස් | සභාපති | 2024.09.30 දක්වා | 10/10 |
| වෛද්‍ය එච්. එම්. ඩී තිලකරත්න මහතා | සභාපති | 2024.11.22 දක්වා | 1/1 |
| මහාචාර්ය ආර්.එම්.ඩී.මැදගෙදර මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 2024.09.25 දක්වා | 7/10 |
| වෛද්‍ය චින්තක ද සිල්වා මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 2024.12.12 දක්වා | 10/11 |
| පී.එල්.කේ. පෙරේරා මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 2024.12.12 දක්වා | 7/7 |
| එම්. ගංගාතරන් මහත්මිය | විධායක නොවන අධ්‍යක්ෂ | 2024.12.12 දක්වා | 10/11 |

## විගණන කමිටුව

"යහපාලනය සඳහා පොදු ව්‍යාපාර මාර්ගෝපදේශ" සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ වලට අනුකූලව විගණන කමිටුව පිහිටුවා ඇත.

සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන අතර මුදල් අමාත්‍යංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා කමිටුවේ සභාපති ලෙස කටයුතු කරයි.

සංස්ථාවේ කර්තව්‍යයන් පරීක්ෂා කිරීම සහ ඇගයීම විගණන කමිටුව විසින් ස්වාධීනව සිදු කරයි. අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව සිදු කරනු ලබන අභ්‍යන්තර විගණන කටයුතු විගණකාධිපතිවරයා ද දැනුවත් කර විගණන කමිටුව විසින් අනුමත කරයි.

අභ්‍යන්තර විගණක වාර්තා සහ රජයේ විගණන වාර්තා පිළිබඳ විගණන කමිටු සමාලෝචනය සහ ඔවුන්ගේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය හරහා ක්‍රියාත්මක කෙරෙන බවට පසු විපරම් කිරීමත්, මූල්‍ය හා මෙහෙයුම් දෙඅංශයේ ම අවදානම් හඳුනා ගැනීමේ ක්‍රියාවලියක් සහ යන්ත්‍රණයක් සංස්ථාව සතුව ඇති බවටත්, එම අවදානම හොඳින් අර්ථ දක්වා ඇති ක්‍රියාකාරී සැලැස්මක් හරහා කළමනාකරණය කරන බවටත් විගණන කමිටුව සහතික කරයි.

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුල විගණන කමිටු රැස්වීම් දෙකක් පවත්වා ඇත.

| කමිටු සාමාජිකගේ නම | තනතුර | පැමිණීම (සුදුසුකම් ලද රැස්වීම සඳහා) |
|---|---|---|
| මලර්මතී ගංගාතරන් මහත්මිය | සභාපතිනී | 2/2 |
| මහාචාර්ය ආර්.එම්.ඩී. මැදගෙදර මහතා | සාමාජික | 2/2 |
| වෛද්‍ය චින්තක ද සිල්වා මහතා | සාමාජික | 2/2 |
| පී.එල්.කේ. පෙරේරා මහතා | සාමාජික | 2/2 |

## වේතන ප්‍රතිපත්තිය

සංස්ථාවේ වේතන ප්‍රතිපත්තිය මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත සකසා ඇත.

මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන සංස්ථා අධ්‍යක්ෂවරුන්ගේ දීමනා සහ වරප්‍රසාද වලට අදාළ චක්‍රලේඛ වලට අනුව අධ්‍යක්ෂ දීමනා හා වරප්‍රසාද තීරණය කරන අතර මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2016 අංක 2 දරන චක්‍රලේඛය මත පදනම් ව සංස්ථාව විසින් සකස් කල වැටුප් පරිමාණ මත සේවක වැටුප් ගෙවනු ලබයි.

කාර්යසාධන දිරිගැන්වීමේ යෝජනා ක්‍රම සෘජුවම කාර්යසාධනය හා සම්බන්ධව ක්‍රියාත්මක කරයි.

### අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලනය

මෙම මූල්‍ය ප්‍රකාශන මඟින් ආවරණය වන කාල සීමාව තුළ ක්‍රියාත්මක වූ අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල සඵලතාව සහ එතැන් සිට යාවත්කාලීන වද සමාලෝචනය කර ඇති බවට අධ්‍යක්ෂවරු තහවුරු කරයි.

ගනුදෙනු වල විනිවිද භාවය පවත්වා ගැනීමටත් එමගින් අදාළ පාර්ශවයන්ට සමාන අවස්ථා ලබා දීම සඳහා සංස්ථාව විසින් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුග මනය කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රාග්ධන වියදම් ද ඇතුළත් වාර්ෂික අයවැය සෞඛ්‍ය අමාත්‍යංශය හා මුදල් අමාත්‍යංශය වෙත ඉදිරිපත් කරයි.

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා අනුව, සංස්ථාවේ අවදානම් පැතිකඩ හඳුනා ගැනීම සහ ඇගයීම සඳහා අවදානම් කමිටුවක් පත් කිරීමට කටයුතු ආරම්භ කර ඇත.

### අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයේ මූලික අවධානය යොමු වන්නේ අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණාත්මක භාවය, අඛණ්ඩතාව සහ සඵලතාව ඇගයීම මඟින් සමස්ත අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් සිදු කිරීමත්, අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා කළමනාකාරිත්වයට නිර්දේශ ලබා දීමත් වේ. අභ්‍යන්තර විගණනය මඟින් සංස්ථාවේ අභ්‍යන්තර පාලන ක්‍රමවල ප්‍රමාණවත් බව, සඵලතාව, නීති හා රෙගුලාසි, ස්ථාපිත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි වලට අනුකූල වීම පිළිබඳ සභාපතිවරයා වෙත නිරන්තරයෙන් වාර්තා කරයි.

### ප්‍රධාන කොටස්කරුවා හා හිමිකරු ලෙස රජයට වග වීම

සංස්ථාව විසින් සාක්ෂාත් කර ගත යුතු පැහැදිලි මාර්ගෝපදේශ සහ උපාය මාර්ගික අරමුණු සැකසීමට අධ්‍යක්ෂ මණ්ඩලයට මග පෙන්වන ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා සහ සෞඛ්‍ය අමාත්‍යංශයේ ලේකම්තුමා සමඟ නිරන්තරයෙන් අදහස් හුවමාරු කර ගන්නා අතර වාර්ෂික වාර්තාව, වාර්ෂික ගිණුම්, වාර්ෂික අයවැය, කාර්තුමය කාර්යසාධන වාර්තා සෞඛ්‍ය අමාත්‍යංශයට සහ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට අමතරව, මුදල් අමාත්‍යංශයේ මහා භාණ්ඩාගාරයට අවශ්‍ය පරිදි, සංස්ථාව විසින් වසර තුනක ව්‍යාපාර සැලැස්මක් ඉදිරිපත් කරයි.

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ වර්තමාන කාර්යසාධනය ඇතුළත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සමාලෝචනය සඳහා පාර්ලිමේන්තුවේ සභා ගත කරයි.

## මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂ වගකීම් වාර්තාව

1971 අංක 38 දරන මුදල් පනත යටතේ, සංස්ථාවේ සියලූම ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් වාර්තා තබා ගැනීම සහ වසරේ ලාභා ලාභ තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ වගකීම සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා ගැනීමට සංස්ථාව මෙහෙයවා ඇති අතර ඔවුන්ගේ නිරන්තර රැස්වීම්වල දී හා විගණන කමිටුව හරහා මූල්‍ය වාර්තා කරන පද්ධතිය සමාලෝචනය කර ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී, සාධාරණ හා විචක්ෂණ තීරණ හා ඇස්තමේන්තු කිරීම් පදනම් වූ සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව අනුගමනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීමටත්, වංචා සහ වෙනත් අක්‍රමිකතා වැළැක්වීමට හා අනාවරණය කර ගැනීමට ඔවුන්ට සාධාරණ ව හෙළිදරව් වන පරිදි පියවර ගෙන ඇත. ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාවේ වත්කම් ආරක්ෂා කර ගැනීමටත් ප්‍රායෝගිකව අපගේ වාර්තා වල නිරවද්‍යතාව සහ විශ්වසනීයත්වය ආරක්ෂා කර ගනිමින් සංස්ථාවේ කටයුතු ක්‍රමානුකූලව සිදු කිරීමටත් අවශ්‍ය අභ්‍යන්තර පරීක්ෂාව, අභ්‍යන්තර විගණනය, මූල්‍ය සහ අනෙකුත් පාලනයන්ගෙන් සමන්විත ඵලදායී හා පුළුල් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කර ඇත.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග මත**



**නීති නිලධාරිණී / අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31වන දිනට | සටහන | 2024<br>රු. | 2023<br>(නැවත ප්‍රකාශිත) රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | **16** | 2,104,735,674 | 2,054,608,762 |
| භාවිත අයිතිය සහිත වත්කම් | **17** | 88,810,046 | 49,721,211 |
| පෙර ගෙවූ කල්බදු වත්කම් | **18** | 19,731,800 | 20,509,274 |
| නොනිමි වැඩ - ප්‍රාග්ධනය | | 39,816,321 | 95,840,425 |
| අස්පෘශ්‍ය වත්කම් - මෘදුකාංග | **19** | 5,688,499 | 5,171,925 |
| අය කර ගත හැකි ආදායම් බදු | | - | 510,726,482 |
| විලම්බිත බදු වත්කම් | **20** | 394,894,508 | 238,869,772 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **2,653,676,848** | **2,975,447,850** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය - රා.ඖ.සං | **21** | 4,479,239,824 | 6,919,844,576 |
| මාර්ගස්ථ තොගය - ර.බෙ.ග. | **22** | 357,093,423 | 2,369,595,569 |
| වෙළඳ හා වෙනත් ණයගැතියෝ | **23** | 37,801,776,607 | 38,801,758,400 |
| පෙරගෙවීම් | **24** | 101,206,021 | 112,379,093 |
| බැංකු හා අතැති මුදල් | **25** | 9,087,579,645 | 5,539,030,064 |
| **මුළු ජංගම වත්කම්** | | **51,826,895,520** | **53,742,607,703** |
| **මුළු වත්කම්** | | **54,480,572,368** | **56,718,055,553** |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| දායක ප්‍රාග්ධනය | **31** | 59,055,258 | 59,055,258 |
| රඳවාගත් ඉපයුම් | | 13,398,307,717 | 12,531,862,061 |
| ප්‍රත්‍යාගණන සංචිතය | **32** | 71,350,931 | 71,350,931 |
| ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ සංචිතය | **32** | 300,000,000 | - |
| පොදු සංචිතය | **32** | 66,061,447 | 66,061,447 |
| **මුළු ස්කන්ධය** | | **13,894,775,352** | **12,728,329,697** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව | **26** | 679,507,396 | 417,463,649 |
| දිගු කාලීන කල්බදු වගකීම් | **17.1** | 68,991,891 | 36,604,255 |
| දිගු කාලීන ණය | **27** | 3,550,522,197 | 5,447,844,429 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **4,299,021,483** | **5,901,912,333** |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා වෙනත් ණයහිමියෝ | **28** | 14,008,712,717 | 17,387,707,916 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 394,180,870 | - |
| කල්බදු වගකීම් | **17.1** | 32,046,834 | 22,921,431 |
| ජංගම මූල්‍ය වගකීම් | **29** | 19,872,901,778 | 18,616,639,731 |
| දිගු කාලීන ණය | **27** | 1,978,933,333 | 2,060,544,445 |
| **මුළු ජංගම වගකීම්** | | **36,286,775,532** | **38,087,813,523** |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | **54,480,572,368** | **56,718,055,553** |

මෙම මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර පහත පරිදි අත්සන් තබන ලදි.

| | | | |
|---|---|---|---|
| ..................................... | ..................................... | ..................................... | ..................................... |
| වෛද්‍ය. මනූජ් සී. වීරසිංහ<br>සභාපති | එම්. එල්. සුබසිංහ ආරච්චි<br>කළමනාකාර අධ්‍යක්ෂ | කේ.එම්.ඩී.ආර්. දසනායක<br>සාමාන්‍යාධිකාරී | නිශාන්ති දේවසුරේන්ද්‍ර<br>වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය |

පිටු අංක 23 සිට 67 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම ගිණුම් වාර්තාව හා සබැඳි අත්‍යාවශ්‍ය කොටස් වේ.

# ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

| | දායක ප්‍රාග්ධනය | පොදු සංචිතය | ප්‍රත්‍යාගණන සංචිතය | ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ සංචිතය | ඒකාබද්ධ ලාභාලාභ ගිණුම | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2022 ජනවාරි 01 වන දිනට ශේෂය | 59,055,258 | 66,061,447 | - | - | 13,590,891,445 | 13,716,008,150 |
| **වසරේ මුළු විස්තීරණ ආදායම** | | | | | | |
| භාණ්ඩාගාර අයබදු ගෙවීම් | | | - | - | (350,000,000) | (350,000,000) |
| වසරේ ශුද්ධ ලාභය | | | - | - | 644,723,214 | 644,723,214 |
| දේපල පිරියත උපකරණ ප්‍රත්‍යාගණන ලාභය (මෝටර් වාහන) | | | 71,350,931 | - | - | 71,350,931 |
| වසරට අදාල විශ්‍රාමික පාරිතෝෂික අතිරික්තය/හිඟය | | | - | - | 86,102,461 | 86,102,461 |
| * ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුව සැපයුම්කරුවන්ට ගෙවූ වට්නාකම් අඩුවෙන් දැක්වීම නිවැරදි කලා (ශුද්ධ) | | | | | (64,350,060) | (64,350,060) |
| * ර.බෙ.ග. විසින් සැපයුම් වලින් සිදුකල අඩුකර ගැනීම් සඳහා වූ ගිණුම් ප්‍රතිපත්තිය වෙනස් කලා (ශුද්ධ) | | | | - | 132,024,320 | 132,024,320 |
| * බැංකු අයිරා පොලිය අඩුවෙන් දැක්වීම නිවැරදි කලා (ශුද්ධ) | | | | - | (2,250,868,593) | (2,250,868,593) |
| *වත්කම් ක්ෂය වෙන්කිරීමේ ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කිරීම (ශුද්ධ) | | | | - | (6,628,920) | (6,628,920) |
| * කොටස් වශයෙන් ගෙවීමට එකඟවූ 2020/2021 වසරට අදාල ගෙවිය යුතු අධිභාර බද්ද | | | | | (146,714,954) | (146,714,954) |
| * 2020/2021 වසර අදාල ආදායම් බදු අධිභාර ගෙවීම් | | | | | (7,042,318) | (7,042,318) |
| *රසායනාගාර ගෘහ භාණ්ඩවල සැපයුම් සහ සවිකිරීම් පිරිවැය අඩුවෙන් දැක්වීම නිවැරදි කලා, ශුද්ධ. (සටහන අ) | | | | | 18,098,963 | 18,098,963 |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **59,055,258** | **66,061,447** | **71,350,931** | **-** | **11,646,235,559** | **11,842,703,194** |
| 2023 ජනවාරි 01 වන දිනට ශේෂය | 59,055,258 | 66,061,447 | 71,350,931 | - | 11,646,235,559 | 11,842,703,194 |
| **වසරේ මුළු විස්තීරණ ආදායම** | | | | | | |
| වසරේ ශුද්ධ ලාභය | | | - | - | 773,534,817 | 773,534,817 |
| වසරට අදාල විශ්‍රාමික පාරිතෝෂික අතිරික්තය/හිඟය (සටහන26.3) | | | - | - | 112,091,686 | 112,091,686 |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **59,055,258** | **66,061,447** | **71,350,931** | **-** | **12,531,862,061** | **12,728,329,697** |
| 2024 ජනවාරි 01 වන දිනට ශේෂය | 59,055,258 | 66,061,447 | 71,350,931 | - | 12,531,862,061 | 12,728,329,697 |
| **වසරේ මුළු විස්තීරණ ආදායම** | | | | | | |
| ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ සංචිතය | | | | 300,000,000 | (300,000,000) | - |
| භාණ්ඩාගාර අයබදු ගෙවීම් | | | | | (232,060,445) | (232,060,445) |
| වසරේ ශුද්ධ ලාභය | | | - | | 1,623,407,149 | 1,623,407,149 |
| වසරට අදාල විශ්‍රාමික පාරිතෝෂික අතිරික්තය/හිඟය (සටහන26.3) | | - | - | | (224,901,049) | (224,901,049) |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **59,055,258** | **66,061,447** | **71,350,931** | **300,000,000** | **13,398,307,717** | **13,894,775,352** |

**සටහන (අ)**

| | **පහත දැක්වෙන ගැලපීම් සිදුකර 2023 වසරට අදාල ගිණුම් ප්‍රකාශය නැවත දක්වන ලදී** | **වටිනාකම** | **බදු බලපෑම @ 30%** | **ශුද්ධ වටිනාකම** |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| i | රසායනාගාර ගෘහ භාණ්ඩවල සැපයුම් සහ සවිකිරීම් පිරිවැය අඩුවෙන් දැක්වීම නිවැරදි කලා | 25,855,661 | 7,756,698 | 18,098,963 |
| ii | 2020/2021 වසර අදාල ආදායම් බදු අධිභාර ගෙවීම් | - | 7,042,318 | 7,042,318 |
| | | **25,855,661** | **14,799,016** | **25,141,281** |

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | සටහන | ක්‍රියාකාරකම් ර.ඖ.ස 2024 රු. | ක්‍රියාකාරකම් ර.බෙ.ග 2024 රු. | සමස්ථ ක්‍රියාකාරකම් 2024 රු. | සමස්ථ ක්‍රියාකාරකම් 2023 රු. |
|---|---|---|---|---|---|
| ආදායම | 7 | **11,069,399,976** | **51,018,099,222** | **62,087,499,199** | **74,695,069,832** |
| අඩුකලා | | | | | |
| සෘජු වියදම් - ර.බෙ.ග. | 8 | | 47,031,918,139 | 47,031,918,139 | 59,705,008,034 |
| විකුණුම් පිරිවැය - රා.ඖ.ස. | 9 | 7,955,603,067 | - | 7,955,603,067 | 7,698,921,165 |
| නිෂ්පාදන පිරිවැය - ජීවනී ඒකකය | 10 | 150,640,791 | - | 150,640,791 | 146,654,024 |
| **දළ ලාභය/ අතිරික්තය** | | **2,963,156,118** | **3,986,181,084** | **6,949,337,202** | **7,144,486,609** |
| **එකතු කලා:-** වෙනත් මෙහෙයුම් ආදායම් | **11** | 148,378,036 | 695,959,278 | 844,337,314 | 612,566,998 |
| **අඩුකලා:-** | | | | | |
| පරිපාලන වියදම් | **12** | 2,003,327,314 | 886,717,250 | 2,890,044,564 | 2,479,525,184 |
| වෙනත් මෙහෙයුම් වියදම් | **13** | 533,580,485 | 144,432,529 | 678,013,014 | 727,141,123 |
| **මෙහෙයුම් ලාභය** | | **574,626,355** | **3,650,990,582** | **4,225,616,937** | **4,550,387,299** |
| **අඩුකලා:** මූල්‍ය වියදම් | **14** | 18,599,290 | 1,739,788,173 | 1,758,387,463 | 3,290,487,333 |
| **එකතුකලා:** මූල්‍ය ආදායම් (සේවක ණය පොළී) | | 7,181,360 | - | 7,181,360 | 7,816,715 |
| **බදු වලට පෙර ලාභය** | | **563,208,425** | **1,911,202,409** | **2,474,410,834** | **1,267,716,682** |
| ආදායම් බදු වියදම | **15** | 295,375,616 | 555,628,068 | 851,003,685 | 494,181,865 |
| **බදු වලට පසු ලාභය** | | **267,832,809** | **1,355,574,341** | **1,623,407,149** | **773,534,817** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | |
| ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ සංචිතය | | (300,000,000) | - | (300,000,000) | - |
| පාරිතෝෂික වෙන්කිරීම මත අතිරික්තය/ ඌනතාව | **26** | (98,956,462) | (125,944,587) | (224,901,049) | 112,091,686 |
| **වසරේ මුළු විස්තීරණ ආදායම** | | **(131,123,653)** | **1,229,629,753** | **1,098,506,100** | **885,626,503** |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | සටහන | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| **බදු වලට පෙර ශුද්ධ ලාභය** | | **2,474,410,834** | **1,267,716,682** |
| **ගැලපුම් කලා :** | | | |
| ක්ෂය කිරීම් | **16** | 96,050,475 | 111,464,247 |
| කොළඹ 4 ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම (පොත් අගය) | **16** | 3,331,556 | - |
| විශ්‍රාමික පාරිතෝෂික වෙන් කිරීම | **26.3** | 91,761,334 | 111,720,011 |
| කල්බදු ක්‍රමක්ෂය - රත්මලාන | **18** | 777,474 | 777,474 |
| මෘදුකාංග ක්‍රමක්ෂය | **19** | 2,369,616 | 1,771,117 |
| නොඉපයූ ලාභ සඳහා වෙන්කිරීම | **7** | 63,203,497 | 13,962,081 |
| කල්බදු පොලිය ( ඔසුසල) | | 15,850,879 | 12,411,244 |
| භාවිත අයිතිය සහිත වත්කම් ක්‍රමක්ෂය | | 32,602,791 | 27,428,158 |
| බොල්ණය වෙන්කිරීම -රා.ඖ.ස. | **13** | 7,559,838 | - |
| බොල්ණය වෙන්කිරීම -ර.බෙ.ග. | **11** | (61,166,178) | 180,335,734 |
| තොග අලාභ | **13** | 311,147 | 1,227,912 |
| හානි වූ හා කල්ඉකුත්වූ තොග සඳහා වෙන්කිරීම- රා.ඖ.ස | **13** | 277,002,116 | 291,745,815 |
| හානි වූ හා කල්ඉකුත්වූ තොග සඳහා වෙන්කිරීම- ර.බෙ.ග | **13** | - | 9,290,161 |
| පොලී වියදම් | **14** | 1,739,789,215 | 3,274,891,468 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | | **4,743,854,595** | **5,304,742,104** |
| වෙළඳ සහ වෙනත් ණයගැතියෝ වැඩිවීම/අඩුවීම | **23** | 1,053,588,133 | 6,668,128,205 |
| තැන්පතු සහ පෙරගෙවීම් වැඩිවීම/අඩුවීම | **24** | 11,173,073 | (61,582,023) |
| වෙළඳ තොග වැඩිවීම/අඩුවීම | | 2,100,087,992 | (4,023,106,573) |
| මාර්ගස්ථ තොගය වැඩිවීම/අඩුවීම | **22** | 2,012,502,146 | (2,338,885,183) |
| වෙළඳ ණයහිමියෝ වැඩිවීම/අඩුවීම | **28** | (3,303,995,200) | (2,008,286,906) |
| **මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | **6,617,210,739** | **3,541,009,623** |
| ආදායම් බදු ගෙවීම් | | (102,121,069) | (901,384,981) |
| අධිභාර බදු ගෙවීම් | | (75,000,000) | - |
| භාණ්ඩාගාර අයබදු/ලාභාංශ ගෙවීම් | | (232,060,445) | - |
| පාරිතෝෂික ගෙවීම් | **26** | (54,618,637) | (39,709,106) |
| පොලී ගෙවීම් | **14** | (1,739,789,215) | (3,274,891,468) |
| **විශේෂිත අයිතම වලට පෙර මුදල් ප්‍රවාහය** | | **(2,203,589,366)** | **(4,215,985,555)** |
| | | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **4,413,621,373** | **(674,975,931)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම් | **16** | (149,508,943) | (18,504,808) |
| නොනිමිවැඩ වැඩිවීම/අඩුවීම | | 56,024,104 | (27,718,274) |
| පරිගනක මෘදුකාංග | **19** | (2,886,190) | (194,490) |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් උපයෝජනය** | | **(96,371,030)** | **(46,417,573)** |
| **මූල්‍ය කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| දිගුකාලීන ණය ගෙවීම් | **27** | (1,978,933,344) | (1,978,933,344) |
| කල්බදු වාරික ගෙවීම් | | (46,029,465) | (39,194,131) |
| **මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(2,024,962,809)** | **(2,018,127,475)** |
| මුදල් හා මුදල් වලට සමාන දෑ ශුද්ධ වැඩිවීම | | 2,292,287,534 | (2,753,483,060) |
| **වර්ෂය මුල මුදල් හා මුදල් වලට සමාන දෑ** | | **(13,077,609,667)** | **(10,324,126,607)** |
| | | | |
| **වර්ෂය අග මුදල් හා මුදල් වලට සමාන දෑ (සටහන- අ.)** | | **(10,785,322,133)** | **(13,077,609,667)** |

| සටහන (අ) මුදල් හා මුදල් වලට සමාන දෑ | | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| අතැති මුදල් සහ බැංකු මුදල් | **25** | 8,836,812,142 | 5,539,030,064 |
| භාණ්ඩාගාර බිල් තැන්පතු | **25** | 250,767,504 | - |
| බැංකු අයිරාව | **29** | (19,872,901,778) | (18,616,639,731) |
| **වර්ෂය අග මුදල් හා මුදල් වලට සමාන දෑ** | | **(10,785,322,133)** | **(13,077,609,667)** |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1.ආයතනික තොරතුරු

### 1.1 පිහිටීම හා නෛතික ආකෘතිය

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1971 දී රාජ්‍ය සංස්ථාවක් ලෙස ලියාපදිංචි කර ඇති අතර අංක 75, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01. යන ස්ථානයේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත. දැනට කොළඹ 5, කිරුල පාරේ, අංක 41 "මෙහෙවර පියස" ගොඩනැගිල්ලේ සිට සිය මෙහෙයුම් ක්‍රියාත්මක කරයි.

### 1.2. ගිණුම් කාලපරිච්ඡේදය

2024 ජනවාරි මස 1 වන දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා වූ මාස දොළහක කාල සීමාව සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ගිණුම් පිළියෙල කරයි.

### 1.3. ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් වල ස්වභාවය

සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ,

අ. ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂිත අයිතම විවෘත වෙළඳ පොලට ආනයනය කිරීම, මිලදී ගැනීම, විකිණීම සහ බෙදාහැරීම.

ආ. රාජ්‍ය බෙහෙත් ගබඩාවට අවශ්‍ය ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය කර සැපයීම.

ඇ. ජීවනී, ග්ලූකෝස් සහ බෙන්සිල් බෙන්සොවේට් ක්‍රීම් (B.B Cream) ඇතුළු අයිතම ගණනාවක් නිෂ්පාදනය කර විකිණීම.

ඈ. රසායනාගාර පහසුකම් සැපයීම සහ ඖෂධ නියැදි පරීක්ෂාව.

## 2. පිළියෙල කිරීමේ පදනම

### 2.1. අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට භාවිතා කරන ලද මූලික ගණකාධිකරණ ප්‍රතිපත්ති සටහන් අංක 3 සිට 6 දක්වා ඉදිරිපත් කර ඇති අතර විශේෂයෙන් සඳහන් කර නොමැති විට ඒවා නියමාකාරයෙන් භාවිත කර ඇත. ඖෂධ සංස්ථාවේ මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට (සාමාන්‍ය ව්‍යවහාරයේ පරිදි "SLFRS/ LKAS) අනුකූලව පිළියෙල කර ඇත. මෙම මූල්‍ය වාර්තා වලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයක්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයක්, ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශනයක්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් හා සටහන් ද ඇතුළත් වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන සඳහා ඔවුන්ගේ වගකීම පිළිගන්නා අතර නිකුත් කිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශන වල කිසියම් සංශෝධන වේ නම් එය නිවැරදි කිරීම ද අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ.

### 2.3 මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය

2025 පෙබරවාරි මස 27 වන දින ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නිකුත් කිරීම සඳහා බලය පවරන ලදී.

### 2.4. මිණුම් පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සඳහන් පහත ප්‍රමාණාත්මක කරුණු හැර සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

- ගෘහ භාණ්ඩ, උපකරණ හා පරිගණක නැවත තක්සේරු කර සාධාරණ වටිනාකම ලෙස ප්‍රත්‍යගණන වටිනාකමට දක්වා ඇත.
- විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් ආයු ගණක තක්සේරු වටිනාකමට දක්වා ඇත.

අවශ්‍ය අවස්ථාවල දී, අදාළ නිශ්චිත ප්‍රතිපත්ති සටහන් මඟින් විස්තර කර ඇත.

### 2.5. භාවිත වන හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

සංස්ථාවේ භාවිත වන හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකාවේ රුපියල් වලින් සංස්ථාවේ මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත.

### විදේශ මුදල් ගනුදෙනු හා ශේෂ

ගනුදෙනුව සිදුවූ දිනයේ පවතින විදේශ විනිමය අනුපාතයට (Spot Exchange Rate) අනුව විදේශ මුදල් ගනුදෙනු සංස්ථාවේ ක්‍රියාකාරී මුදල් ඒකකයට පරිවර්තනය කරනු ලබයි. එවැනි ගනුදෙනු පියවීමෙන් හා වසර අවසානයේ දී විදේශ මුදලින් ඇති වටිනාකම් නැවත ක්‍රියාකාරී මුදල් ඒකකයට පරිවර්තනය කිරීමේ දී ලැබෙන විදේශ විනිමය ලාභ හා පාඩු ලාභාලාභ ගිණුමේ හඳුනා ගනියි.

### 2.6. සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීම හා සංසන්දනය පහසු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති සියලු වටිනාකම් වෙනුවෙන් ප්‍රමාණාත්මක, ආඛ්‍යාන හා විස්තර සහිත පෙර වසරේ සංසන්දනාත්මක තොරතුරු දක්වා ඇත. අවශ්‍ය අවස්ථාවල දී, ප්‍රවර්තන වසරේ ඉදිරිපත් කිරීම් වලට අනුකූලව පෙර වසරේ සංසන්දනාත්මක තොරතුරු නැවත සකස් කර ඇත.

### 2.7. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශ) දක්වා ඇති වක්‍ර ක්‍රමය භාවිතා කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇති අතර මෙහෙයුම් ක්‍රියාකාරකම්, මූල්‍ය ක්‍රියාකාරකම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලට අදාළ දළ මුදල් ලැබීම් හා දළ මුදල් ගෙවීම් හඳුනා ගෙන දක්වා ඇත.

### 2.8. සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන.

මෙම ගිණුම් ප්‍රකාශය පිළියෙල කිරීමේ දී, සංස්ථාවේ ගිණුම් ප්‍රතිපත්ති වලට සහ වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් වලට බලපාන තීරණ, ඇස්තමේන්තු හා උපකල්පන කළමනාකරණය විසින් ගන්නා ලදී. සත්‍ය ප්‍රතිඵලය එම ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැක. ඇස්තමේන්තු හා දක්වා ඇති උපකල්පන අඛණ්ඩව සමාලෝචනයට ලක් කරයි. ගිණුම්කරණ ඇස්තමේන්තු වල සංශෝධන, අදාළ සංශෝධන සිදු කරන වසර හා ඉදිරි කාලපරිච්ඡේද වලට අදාළ වන පරිදි ගැලපුම් සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගෙන ඇති වටිනාකම් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිතතා පිළිබඳ තොරතුරු පහත සටහන් වලට ඇතුළත් කර ඇත.

සටහන 25 - විලම්බිත බදු වත්කම්/වගකීම් හඳුනා ගැනීම

සටහන 21 - අපහායන සඳහා වෙන් කිරීම

සටහන 24 - විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව ඇගයීම

**මූලික ආයු ගණක උපකල්පන**

සටහන 18 - කල්බදු

සටහන 16 - උපකරණ, ගෘහ භාණ්ඩ, පරිගණක හා මෝටර රථ වල සාධාරණ අගය තක්සේරු කිරීම්

**වෙන් කිරීම්** : අතීත සිදුවීම් වල ප්‍රතිඵලයක් වශයෙන් වර්තමානයේ සංස්ථාවට නීතිමය හෝ වටහා ගත හැකි බැඳීමක් ඇති විට, විය හැකි සම්භාවිතාව සලකා බලා විශ්වාසදායක තක්සේරුව මත පදනම් ව ප්‍රතිපාදන සිදු කරයි.

### 2.9 සාධාරණ අගය තක්සේරු කිරීම

සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා හෙළිදරව් කිරීම් ගණනාවක් සඳහා මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් හා වගකීම් වල සාධාරණ අගය තක්සේරු කිරීමට අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය මූල්‍ය වෙළඳපොළ තුල සැලකිය යුතු අස්ථාවරත්වයකට හේතුව වී ඇත. කෙසේ වුවද මූල්‍ය වෙළඳපොළෙහි අස්ථාවරත්වය හේතුවෙන් සංස්ථාවට තම මූල්‍ය වත්කම් කිසිවක් නැවත වර්ගීකරණය කිරීමට අවශ්‍ය වී නොමැත.

සංස්ථාව විසින් සැලකිය යුතු ලෙස නිරීක්ෂණය කල නොහැකි යෙදවුම් සහ තක්සේරුකරණ ගැලපුම් ද නිරන්තරයෙන් සමාලෝචනය කරයි. වෙළඳ වටිනාකම තක්සේරු කිරීම සඳහා තෙවන පාර්ශවයක තොරතුරු භාවිතා කරයි නම්, නිගමනයට සහාය වීම සඳ හා තෙවන පාර්ශවයෙන් ලබාගත් සාක්ෂි එවැනි තක්සේරු කිරීම් වර්ගීකරණය කළ යුතු සාධාරණ අගය ධූරාවලියෙහි මට්ටම ද ඇතුළත් SLFRS/LKAS හි අවශ්‍යතා සපුරන බවට සංස්ථාව නැවත තහවුරු කර ගනියි.
තවද, සැලකිය යුතු වත්කම් තක්සේරු කිරීම සඳහා බාහිර තක්සේරුකරුවන් සම්බන්ධ කර ගනියි නම්බාහිර තක්සේරුකරුවන් තෝරා ගැනීමේ දී වෙළඳ පොළ දැනුම, කීර්තිය, ස්වාධීනත්වය සහ තම වෘත්තීය ප්‍රමිතීන් පවත්වා ගනියි ද යන්න සලකා බලයි. බාහිර තක්සේරුකරුවන් සමඟ සාකච්ඡා කර, ඒ ඒ වත්කම සඳහා කුමන යෙදවුම් හා කුමන තක්සේරු ක්‍රමය භාවිතා කළ යුතු ද යන්න සංස්ථාව තීරණය කරයි.

වත්කමක හෝ වගකීමක සාධාරණ වටිනාකම තීරණය කිරීමේ දී, සංස්ථාව හැකි පමණ නිරීක්ෂණය කල හැකි වෙළඳපොළ තොරතුරු භාවිතා කරයි. තක්සේරු කරණයේ දී භාවිතා කල යෙදවුම් පදනම් කර ගනිමින් සාධාරණ අගය මට්ටම් ධූරාවලියෙහි මට්ටම් වලට වෙළඳ වටිනාකම වර්ගීකරණය කර දක්වන ක්‍රම පහත පරිදි වේ.

- මට්ටම 1 - සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළඳපළ වල මිල ගනන් (සකස් නොකළ)
- මට්ටම 2 - 1 වන මට්ටමට ඇතුළත් කර ඇති මිල ගණන් හැර වත්කම් හෝ වගකීම් සඳහා කෙළින්ම නිරීක්ෂණය කල හැකි වෙනත් යෙදවුම්

  (උදා - මිල ගනන්) හෝ වක්‍රාකාර ව ( උදා - මිල ගනන් වලින් උපුටා ගත්)
- මට්ටම 3 - වත්කම් හෝ වගකීම් සඳහා නිරීක්ෂණය කල හැකි වෙළඳපළ දත්ත මත පදනම් නොවූ යෙදවුම් (නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්)

වත්කමක හෝ වගකීමක සාධාරණ වටිනාකම ගණනය කිරීම සඳහා භාවිතා කරන යෙදවුම් සාධාරණ අගය ධූරාවලියේ විවිධ මට්ටම් වලට වැටේ නම්, සාධාරණ අගය මැනීම, සමස්ත අගය සඳහා ම වැදගත් වන අවම ආදාන මට්ටම ලෙස සාධාරණ අගය ධූරාවලියේ එකම මට්ටමින් වර්ගීකරණය කර ඇත. සාධාරණ අගය ධූරාවලියේ විවිධ මට්ටම් අතර මාරු කිරීම අදාළ වෙනස සිදු වූ වර්ෂය අවසානයේ දී සිදු කරයි. ලාභාලාභ ගිණුම හරහා සාධාරණ මිල යටතේ හෝ වෙනත් විස්තීර්ණ ආදායම් ගිණුම හරහා සාධාරණ වටිනාකමට (OCI) ගණන් ගැනෙන වත්කම් කිසිවක් දැනට සංස්ථාව සතුව නොමැත.

## 3. මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

### 3.1. මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

සංස්ථාව විසින් භාවිතා කරන මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති විශේෂයෙන් දක්වා නොමැති විට පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුරූප වේ. ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි අවශ්‍ය අවස්ථාවල පෙර වර්ෂයේ සංඛ්‍යා හා වාක්‍ය ඛණ්ඩ නැවත සකසා ඇත.

### 3.2. අඛණ්ඩ පැවැත්ම

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන දිගින් දිගට පැවැත්මේ ගිණුම්කරණ සංකල්පය අනුව පිළියෙල කර ඇත.

### 3.3. වසර තුල නිකුත් කරනු ලැබූ නව ගණකාධිකරණ ප්‍රමිත/ දැනට පවතින ගණකාධිකරණ ප්‍රමිත වල සිදුවූ වෙනස්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සඳහා 2025 ජනවාරි 1 වන දිනට පසු බලපැවැත්වූ සංශෝධන මූල්‍ය ප්‍රකාශන සඳහා සැලකිය යුතු බලපෑමක් සිදු නොකරයි.

- IAS 21 සඳහා වූ සංශෝධන - විදේශ විනිමය අනුපාතවල වෙනස් වීම්වල බලපෑම්
- මූල්‍ය උපකරණ වර්ගීකරණය සහ මිනුම් සඳහා සංශෝධන (IFRS 9, මූල්‍ය උපකරණ සහ IFRS 7 සඳහා සංශෝධන, මූල්‍ය උපකරණ හෙළිදරව් කිරීම් (2026.01.01 දින සිට)

### 3.4. දේපළ, පිරියත හා උපකරණ

#### 3.4.1 හඳුනා ගැනීමේ පදනම

දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගනු ලබන්නේ අදාළ වත්කම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව තුලට ගලා එන්නේ නම් හා වත්කමේ පිරිවැය නිශ්චිතව ගණනය කළ හැකි නම් පමණි.

#### 3.4.2. මිණුම් පදනම

දේපළ, පිරියත හා උපකරණ දක්වා ඇත්තේ පිරිවැය/ ප්‍රත්‍යාගණන අගයෙන් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානි වටිනාකම් ඇත්නම් ඒවා ද අඩු කල පසු වටිනාකමට වේ.

වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජු වම ආරෝපණය කළ හැකි වියදම් පිරිවැයට ඇතුළත් වේ. ගොඩ නංවන ලද වත්කම් වල පිරිවැය අගයට ද්‍රව්‍යවල පිරිවැය සහ සෘජු ශ්‍රමය, වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන වීම වෙනුවෙන් සෘජු වම ආරෝපණය කළ හැකි වෙනත් වියදම්, වත්කම් කොටස් කිරීම සහ ඉවත් කිරීම සහ පිහිටා ඇති ස්ථානයේ නැවත සවි කිරීමේ පිරිවැය සහ ප්‍රාග්ධන ගත කරන ලද ණය ගැනීමේ පිරිවැය ආදිය ඇතුළත් වේ.

**පසුකාලීන පිරවැය**

දේපළ පිරියත හා උපකරණ වල උපාංග නැවත ස්ථාපිත කිරීමේ පිරිවැය එම අයිතමයේ පිරිවැය ලෙස හඳුනා ගනු ලබන්නේ එම කොටසට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ගලා වීමට සම්භාවිතාව පවතී නම් හා එහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් වේ. ඉවත් කල උපාංගයේ ධාරණ අගය හඳුනා ගැනීමෙන් ඉවත් කරයි. අනෙක් සියලුම අලුත්වැඩියා හා නඩත්තු වියදම්

දරනු ලබන පරිදි ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනියි.

**පිරිවැය ආකෘතිය**

ඉඩම් හා ගොඩනැගිලි ගිණුම් ගත කිරීම සඳහා සංස්ථාව පිරිවැය ආකෘතිය භාවිතා කරන අතර මිල දී ගැනීමේ පිරිවැය ගිණුම් ගත කරන්නේ ඒ සමඟ පවතින සියලු අමතර වියදම් වලින් සමුච්චිත ක්ෂය වීම් සහ සමුච්චිත හානි අඩු කල පසු අගය වේ.

**ප්‍රත්‍යාගණන ආකෘතිය**

ප්‍රත්‍යාගණන දිනට සාධාරණ මිලෙන් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානි වටිනාකම් ඇත්නම් ඒවා ද අඩු කල පසු වටිනාකමට අගය කර ඇති රථවාහන සංස්ථාව විසින් ප්‍රත්‍යාගණනය කර දක්වා ඇත. වාර්තා කරන දිනට සාධාරණ වටිනාකම, භාවිතා කර ඇති පොත් අගයට වඩා ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් කාලපරිච්ඡේදයකට වරක් ප්‍රත්‍යාගණනය කරයි.

නැවත තක්සේරු කිරීමේ දී, ලාභාලාභ ප්‍රකාශනයේ හඳුනා ගත් එකම වත්කමේ වටිනාකමෙහි පෙර අඩු වීමක් සකසන්නේ නම් මිස, ප්‍රත්‍යාගණන වටිනාකමෙහි යම් වැඩි වීමක් ස්කන්ධ ප්‍රාග්ධන වෙනස් වීම් ප්‍රකාශයේ ප්‍රත්‍යාගණන සංචිතයට බැර කරයි. පෙර හඳුනා ගෙන ඇති ප්‍රත්‍යාගණන සංචිතය ඉක්මවන වටිනාකම අඩු වීම ලාභාලාභ ප්‍රකාශයේ අගය අඩු වීමක් ලෙස හඳුනා ගනී. වත්කම් ඉවත් කිරීමේ දී, ඉවත් කිරීමට අදාළ ප්‍රත්‍යාගණන වටිනාකම, ප්‍රත්‍යාගණන සංචිතයෙන් රඳවා ගත් ඉපයීම් වෙත මාරු කරනු ලබන අතර වත්කම් ඉවත් කිරීමේ ලාභය හෝ අලාභය ගණනය කිරීමේ දී සැලකිල්ලට නොගනියි.

උපකරණ, ගෘහ භාණ්ඩ හා සවි කිරීම් හා පරිගණක සාධාරණ වටිනාකමට ගණනය කර දක්වයි. උපකරණ, ගෘහ භාණ්ඩ හා සවි කිරීම් හා පරිගණක විශ්‍රාමික රජයේ නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරුවෙකු වන ජේ.එම්. සේනානායක බණ්ඩාර මහතා විසින් 2015.12.31 දිනට ප්‍රත්‍යාගණනය කර ඇත.

### 3.4.3. ක්ෂය කිරීම

යන්ත්‍ර, පිරියත හා උපකරණ ඇස්තමේන්තු ගත එලදායී ජීවිත කාලය තුල සරල මාර්ග ක්‍රමයට වත්කම තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වල අපේක්ෂිත පරිභෝජන රටාව පිළිබිඹු වන පරිදි ලාභාලාභ ගිණුමේ ක්ෂය කර දක්වයි.

දේපළ, පිරියත හා උපකරණ වල ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ආයුකාලය පහත පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 20 - 40 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | වසර 8 |
| රථ වාහන | වසර 10 |
| බයිසිකල | වසර 6 සිට 7 |
| ලී බඩු හා සවි කිරීම් | වසර 10 |
| පරිගණක | වසර 4 |
| උපකරණ | වසර 5 |

වත්කම ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය භාවිතා කිරීම ආරම්භ කල හැකි දින සිට වන අතර වත්කම විකිණීමට ඇති වත්කමක් ලෙස නම් කල දින හෝ ඉවත් කල දින අතරින් ප්‍රථමයෙන් පැමිණෙන දින සිට නවතා දමයි. වත්කමක සුන්බුන් අගය හා එලදායී ජීවිත කාලය සමාලෝචනය කර යෝග්‍ය නම් වසර අවසානයේ දී LKAS 8 ට අනුව ගැලපුම් සිදු කරයි.

ඒ අනුව, දැනටමත් ක්ෂය වී ඇති ගෘහ භාණ්ඩ සවි කිරීම්, උපකරණ සහ පරිගණක වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කරන ලද අතර, LKAS 8 හි 37 වන වගන්තියේ දක්වා ඇති පරිදි, ධාරණ අගය ඉදිරියට ගැළපෙන පරිදි සකසන ලදි.

ක්ෂය කිරීම් ගිණුමට බලපෑම පහත පරිදි වේ.

| | |
|---|---|
| ප්‍රවර්තන වර්ෂය | රු. මිලියන 4.2 |
| අනාගත වර්ෂයන් | රු. මිලියන 9.7 |

### 3.4.4. හඳුනා නොගැනීම

යන්ත්‍ර පිරියත හා උපකරණ වල අයිතමයක් හඳුනා ගැනීමෙන් ඉවත් කරනුයේ අදාළ වත්කමෙන් බලාපොරොත්තු වූ අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැති විට හෝ ඉවත්වූ විට හෝ වත්කම ඉවත් කල විට වේ. වත්කම ඉවත් කිරීමේ ලාභය හෝ අලාභය, යන්ත්‍ර පිරියත හා උපකරණ විකුණුම් මිල හා පොත් අගය සංසන්දනය කර ගණනය කරන අතර ලාභ හෝ අලාභ වෙනත් ආදායම් යටතේ දක්වයි.

### 3.4.5. මූල්‍ය නොවන වත්කම් හානිකරණය

වත්කම් වල වටිනාකමේ අඩු වීමක් (impairment) වත්කමක් හානි විය හැකි බවට ඇඟවීමක් තිබේ ද යන්න සංස්ථාව වාර්තා කරන සෑම දිනකදීම තක්සේරු කරයි. කිසියම් ඇඟවීමක් තිබේ නම්, හෝ වත්කමක් සඳහා වාර්ෂික හානි පරීක්ෂාවක් අවශ්‍ය වූ විට, සංස්ථාව වත්කමේ අය කර ගත හැකි මුදල ඇස්තමේන්තු කරයි.

### 3.5 නොනිමි වැඩ - ප්‍රාග්ධනය

ප්‍රවර්තන වර්ෂයේ දී දරා ඇති එහෙත් ශේෂපත්‍ර දින දී ප්‍රාග්ධන ගත නොකල ප්‍රාග්ධන වියදම් නොනිමි වැඩ ප්‍රාග්ධනය ලෙස දක්වා ඇති අතර ප්‍රවර්තන වර්ෂයේ දී ප්‍රාග්ධන ගත කර ප්‍රයෝජනයට ගන්නා ප්‍රාග්ධන වත්කම්, දේපළ, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇත.

### 3.6. අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කර ගන්නා අස්පෘශ්‍ය වත්කම් වල මූලික පිරිවැය වශයෙන් සලකනු ලබන්නේ අත්පත් කර ගැනීමේ පිරිවැයයි. මූලික පිරිවැය හඳුනා ගැනීමෙන් පසුව අස්පෘශ්‍ය වත්කම් ඉදිරියට ගෙන යන අගය තීරණය කරනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානි කරණ අලාභ අඩුකර ය. ප්‍රාග්ධන සංවර්ධන වියදම් හැර අභ්‍යන්තරව ජනනය කරන ලද අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධන ගත කරනු නොලබන අතර අදාළ වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ වර්ෂය තුල දරා ඇති වියදම දක්වනු ලැබේ.

සංස්ථාවේ අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය ඒවායේ තක්සේරු කල එලදායී ජීවිත කාලය තුල සරල රේඛීය ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය කරයි.

### 3.7 කල්බදු

කල්බදු වත්කම් සංස්ථාවේ භාවිතයට පැවති දින සිට කල්බදු භාවිත අයිතිය සහිත වත්කම් හා ඒවාට අනුරූප වගකීම් ලෙස හඳුනා ගනියි. සංස්ථාවට ඔසුසල ගොඩනැගිලි, ගබඩා පහසුකම් හා සමහර තොරතුරු තාක්ෂණ උපකරණ සඳහා කල්බදු පවතී. කෙටි කාලීන කල්බදු හා අඩු වටිනාකම් සහිත කල්බදු හැර සෑම කල්බද්දක් ම ශේෂ පත්‍රයේ භාවිත අයිතිය සහිත වත්කම් හා කල්බදු වගකීම් ලෙස දක්වා ඇත.

**(අ) භාවිත අයිතිය සහිත වත්කම්**

පහත දත්ත පදනම් කර ගෙන පිරිවැය මත භාවිත අයිතිය සහිත වත්කම් ආරම්භයේ දී ගණනය කරයි.

- කල්බදු වගකීම් වල මූලික ඇගයීමේ වටිනාකම
- ආරම්භක දිනයේ දී හෝ ඊට පෙර කරන ලද බදු ගෙවීම් වලින් ලැබී ඇති බදු දිරි දීමනා අඩු කල පසු වටිනාකම
- කවර හෝ ආරම්භක පිරිවැයක්, හා
- ඉවත් කිරීම් හෝ ප්‍රතිෂ්ඨාපන පිරිවැයක්.

භාවිත අයිතිය සහිත වත්කම් වල පසු අගය ගණනය කරනු ලබන්නේ පිරිවැයට සමුච්චිත ක්ෂය හා අගය අඩු වීම් ඇත්නම් අඩු කල පසුවයි. භාවිත අයිතිය සහිත වත්කම් වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය හා බදු කාල සීමාව අතරින් වඩා කෙටි කාලය තුල සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි.

### (ආ) කල්බදු වගකීම්

SLFRS 16 ප්‍රමිතියේ විධිවිධානයන්ට අනුව, කල්බදු වගකීම් හඳුනා ගෙන වටිනාකම ගණනය කරනු ලබන්නේ, බදු කරුගේ වර්ධක ණය අනුපාතයට ඉතිරි කල්බදු ගෙවීම් වට්ටම් කිරීමෙනි. එය සමාන නියමයන්, කොන්දේසි හා සමාන ආරක්ෂක ඇපයක් සහිත සමාන ආර්ථික පරිසරයක් තුල භාවිතා අයිතිය සහිත වත්කමට සමාන වත්කමක් ලබාගැනීමට අරමුදල් ලබා ගැනීමේ දී ණය ගෙවීමට බදු කරු විසින් දැරිය යුතු පොලී අනුපාතය වේ.

සංස්ථාව කල්බදු වගකීම ශේෂ පත්‍රයේ වෙනම අයිතමයක් ලෙස දක්වන අතර කල්බදු වගකීම මත වූ පොලී වියදම මූල්‍ය වියදම් යටතේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දක්වනු ලබයි.

### (ඇ) කල්බදු වගකීම් නැවත ගණනය කිරීම

දර්ශකයක් හෝ අනුපාතයක් මත රඳා පවතින විචල්‍ය කල්බදු ගෙවීම් වල අනාගත වැඩි වීම් වලට සංස්ථාව නිරාවරණය වන නමුත් එම වැඩි වීම් ක්‍රියාත්මක වනතුරු කල්බදු වගකීම් වලට ඇතුළත් කර නොගනී. දර්ශකයක් හෝ අනුපාතයක් මත සිදුවන කල්බදු ගෙවීම් සඳහා ගැලපුම් සිදු කරන විට කල්බදු වගකීම නැවත ගණනය කර භාවිත අයිතිය සහිත වත්කම් වලට එරෙහිව ගළපනු ලබයි.

### (ඈ) වගකීම් ලෙස හඳුනා නොගත් කල්බදු ගෙවීම්

කෙටිකාලින කල්බදු (බදු කාලය මාස 12ක් හෝ එයට අඩු) හා අඩු වටිනාකම් සහිත කල්බදු, කල්බදු වගකීම් ලෙස හඳුනා නොගැනීමට තීරණය කරන ලදී. එවැනි කල්බදු වෙනුවෙන් සිදු කරනු ලබන ගෙවීම්, සරල මාර්ග ක්‍රමයට වියදමට ගළපනු ලබයි. මීට අමතරව, ඇතැම් විචල්‍ය කල්බදු ගෙවීම් කල්බදු වගකීම් ලෙස පිළිගැනීමට අවසර නොදෙන අතර ඒවා වියදම් ලෙස ගිණුම් ගත කරයි.

## 3.8. බදුකරණය

### 3.8.1 වර්තමාන බදුකරණය

වර්තමාන බදු වත්කම් හා බදු වගකීම් වන්නේ බදු බලධාරීන්ට ප්‍රවර්තන වර්ෂය හා අතීත වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු වන හා ඔවුන්ගෙන් අය කර ගත යුතු වන වටිනාකම් වේ. එම බදු ගණනය කිරීමට යොදා ගන්නා ලද බදු අනුපාතික හා බදු නීති වනාහි ශේෂ පත්‍ර දින වන විට බලාත්මකව පවතින ඒවා වේ. ඒ අනුව 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත හා එයට කරන ලද සංශෝධන වල විධිවිධාන වලට අනුකූලව හා පනතේ නියම කර ඇති අනුපාතයට අනුව බදු ගෙවීමේ කාර්යය සඳහා ගළපන ලද වර්ෂයේ ලාභය පදනම් කර ගෙන බදු ප්‍රතිපාදනය කර ඇත. සමාලෝචිත වර්ෂයේ බදු සඳහා ප්‍රතිපාදන සලස්වා ඇත්තේ පනතේ නියම කර ඇති අනුපාතික වලට යටත් ව ගිණුම් ගත ලාභය පදනම් කර ගෙන වේ.

### 3.8.2. විලම්බිත බදුකරණය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල හඳුනා ගෙන ඇති සෑම වර්ගයකම තාවකාලික වෙනස්කම්, විලම්බිත බදු වත්කම් හා බැරකම් ගණනය සඳහා සලකා බලා ඇත. මූල්‍ය ප්‍රකාශය තුල ප්‍රධාන වශයෙන් ස්ථාවර වත්කම්, විශ්‍රාම පාරිතෝෂිකය සඳහා වූ ප්‍රතිපාදනය, ණයගැති අගය අඩු වීම හා මතභේදාත්මක තොග සඳහා වෙන්කිරීම් විලම්බිත බදු ගණනය සඳහා සලකා බලා ඇත. සංස්ථාවේ විලම්බිත වත්කම් හා බැරකම් ආදායම් බදු අනුපාතය අනුව ගණනය කර දක්වයි.

විලම්බිත බදු වත්කම් වල පොත් අගය සෑම වාර්තා කරන වර්ෂයක් අවසානයේම සමාලෝචනය කර බදු අය කල හැකි ලාභයෙන් සම්පූර්ණයෙන් හෝ කොටසක් ප්‍රයෝජනයට ගැනීමට ප්‍රමාණවත් මට්ටමට අඩු කර දක්වයි.

## 3.9 භාණ්ඩ තොග

සංස්ථාවේ භාණ්ඩ තොග හඳුනා ගනු ලබන්නේ කල් ඉකුත් වූ හා විකිණිය නොහැකි භාණ්ඩ සඳහා නිසි ප්‍රතිපාදන කල පසුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත වන අතර ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු පදනමට අනුව තොග තක්සේරු කරයි. (FIFO)

ප්‍රධාන ගබඩාවේ සිට ඔසුසල වලට මාරු කරන සාමාන්‍ය හුවමාරු ආන්තිකය අනුව ගණනය කල තොග හුවමාරු ආන්තිකය ඉවත් කර ඔසුසල වල අවසාන තොග වටිනාකම ගණනය කරයි. වෙළඳපළ මිල ගණන් ද සලකා බලමින් සංස්ථාවේ මිල කමිටුව විසින් ඖෂධ මිල සූත්‍රය පදනම් කර ගෙන මිල තීරණය කරයි.

### 3.9.1. තොග අගය කිරීම

තොග පිරිවැය - ජීවනී ඒකකය

අමුද්‍රව්‍ය තොගය - ජීවනී ඒකකය

අමතර වියදම් ඇතුළත් මිලදී ගැනීමේ පිරිවැයට

නොනිමි වැඩ

සම්පූර්ණ අමුද්‍රව්‍ය පිරිවැය හා විචල්‍ය නිෂ්පාදන වියදම

නිමි භාණ්ඩ

සම්පූර්ණ අමුද්‍රව්‍ය පිරිවැය හා විචල්‍ය නිෂ්පාදන වියදම

## 3.10. මුදල් හා මුදල් වලට සමාන දෑ

මුදල් හා මුදල් වලට සමාන දෑ වලට අයත් වන්නේ අතැති මුදල් හා බැංකු මුදල්, භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන, මාස දොළහක් හෝ අඩු කාලයක් තුල කල් පිරෙන ද්‍රවශීලතාව අතින් ඉහල ආයෝජනයි. බැංකු අයිරාව ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ දක්වා ඇත.

## 3.11. පර්යේෂණ වියදම්

නව විද්‍යාත්මක හෝ තාක්ෂණික දැනුම හා අවබෝධය ලබා ගැනීමේ අරමුණෙන් සිදු කරන පර්යේෂණ කටයුතු සඳහා වූ වියදම් එම වියදම් ඇතිවූ අවස්ථාවේදීම ලාභයට ගළපනු ලබයි.

## 4. බැරකම් හා ප්‍රතිපාදන

### 4.1 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

### 4.1.1. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම - විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාර පාරිතෝෂික ගෙවීමේ වගකීමට සංස්ථාව බැඳී සිටී. සේවකයෙකුට ගෙවිය යුතු පාරිතෝෂිකය සඳහා බැර කමක් පැන නගින්නේ සේවකයෙකු සංස්ථාව සමඟ අවුරුදු පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන අවස්ථාවේයි. ශේෂ පත්‍රයේ පෙන්නුම් කරන මෙම වගකීම ශේෂ පත්‍ර දිනයේ දී ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමයට අනුව (Projected Unit Credit Method) තක්සේරු කළ විශ්‍රාම ප්‍රතිලාභ

වගකීමේ වර්තමාන වටිනාකමයි. මෙම විශ්‍රාම ප්‍රතිලාභ වගකීම සඳහා බාහිර අරමුදලක් ඇති කර නොමැත.

විශ්‍රාම ප්‍රතිලාභ වගකීමට අදාළ තක්සේරු වන සියලු ආයුගණක ලාභ හා අලාභ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ වහාම ගිණුම් ගත කිරීමට සංස්ථාව කටයුතු කරයි.

වෘත්තීය ආයුගණක තක්සේරුකාර සමාගමක් වන Actuarial and Management Consultants (Pvt) Ltd ආයතනයේ එම්. පුපාලනාදන් මහතා විසින් 2024 දෙසැම්බර් 31 දිනට ආයුගණක තක්සේරුව සිදු කරන ලදි. විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව ගණනය කිරීමේ දී පදනම් කරගත් උපකල්පන හා දත්ත මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 26 යටතේ දක්වා ඇත.

### 4.1.2. නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයට සහ සේවක භාරකාරත්ව අරමුදලේ දායකත්වයට සේවකයන් වෙනුවෙන් ලබා දෙන අරමුදල් අදාළ අරමුදල් රෙගුලාසි වලට අනුකූලව අදාළ දායකත්ව අරමුදල් මඟින් ආවරණය කරනු ලැබේ.

සේවකයන් ආවරණය කරමින් අර්ථසාධක අරමුදලට හා භාරකාර අරමුදලට සැපයෙන දායකත්වයන් ආදායම් ප්‍රකාශය තුල වියදමක් වශයෙන් හඳුනා ගනු ලැබේ.

**සේවක අර්ථසාධක අරමුදල**

පිළිවලින් සංස්ථාව හා සේවකයන්, ගමන් වියදම් දීමනා හැර දළ වැටුපෙන් 12% ක් හා 10% ලෙස සේවක අර්ථ සාධක අරමුදලට දායකත්වය ලබා දෙයි.

**සේවක භාරකාර අරමුදල**

සංස්ථාව ගමන් වියදම් දීමනා හැර දළ සේවක වැටුපෙන් 3% ක් සේවක භාරකාර අරමුදලට දායකත්වය ලබා දෙයි.

## 5. ආදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ දී කාර්යානුගත වියදම් ක්‍රමය යොදා ගෙන ඇත්තේ එමගින් සංස්ථාවේ කාර්යසාධනයෙහි මූලිකාංග සාධාරණව නිරූපනය වන බැවිනි.

### 5.1. ආදායම් හඳුනා ගැනීම

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති SLFRS 15 ගනුදෙනු කරුවන් සමග ගිවිසුම් ගත ආදායම් ප්‍රමිතියේ පියවර පහ ප්‍රවේශයට අනුව සංස්ථාව ආදායම් හඳුනා ගැනීම හා නිර්ණය කිරීම සිදු කරයි. තෙවන පාර්ශවයක් වෙනුවෙන් රැස් කළ වටිනාකම් හැර ගනුදෙනුකරු සමඟ ගිවිසුමේ නිරූපිත ප්‍රතිෂ්ඨාව පදනම් කර ගෙන සංස්ථාව සිය ආදායම නිර්ණය කරයි. සංස්ථාව ආදායම් හඳුනා ගන්නේ කාර්යසාධන බැඳීම් පිළිබඳ සෑහීමට පත්වන්නේ නම් පමණි.

සංසන්දනාත්මක කාලපරිච්ඡේදයේ දී, ආර්ථික ප්‍රතිලාභය සංස්ථාව වෙත ගලා ඒමේ හැකියාව නිශ්චිත ආදායම් හා ඊට සම්බන්ධ පිරිවැය නිවැරදිව ගණනය කළ හැකි ආදායම් ගෙවීම් කර ඇති නැති බව නොසලකා උපචිත පදනමට හඳුනා ගන්නා ලදි. ගිවිසුම් ගතව නිර්වචනය කරන ලද ගෙවීම් නියමයන් සැලකිල්ලට ගනිමින් ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමට ආදායම ලෙස ගණනය කරනු ලබයි.

### 5.1.1 භාණ්ඩ හා සේවාවල ස්වභාවය

සංස්ථාව තම ආදායම් ජනනය කරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකම් හා එම ක්‍රියාකාරකම් වලට අදාළ ආදායම් හඳුනා ගැනීමේ ප්‍රතිපත්ති පහතින් දැක්වේ.

I. **ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය හා වෙළඳාම මඟින් ලද ආදායම්**

සංස්ථාව පහත ප්‍රභවයන් ගෙන් ආදායම් හඳුනා ගනියි

| ගනුදෙනුකරු | ස්වභාවය,කාර්යසාධන බැඳීම පිළිබඳ තෘප්තිමත් බවට කාලය හා වැදගත් වන ගෙවීම් කොන්දේසි |
|---|---|
| බෙදාහරින්නන් / වරලත් වෙළඳුන් | සංස්ථාව ආදායම හඳුනා ගන්නේ මාසිකව, ගනුදෙනුකරු භාණ්ඩ තම භාරයට ලබාගත් මොහොතේ දීය. සංස්ථාව විසින් මිල තීරණය කර බෙදාහරින්නන් වෙත අලෙවිකරණ අතර මිල ගණන් විටින්විට බෙදාහරින්නන් වෙත දැනුම් දෙනු ලබයි.<br><br>නිකුත් කරනු ලබන අවස්ථාවේ නරක්වී, අවපැහැගැන්වී හෝ අත්වැරදීමකින් වැරදි අයිතමයක් බෙදා හරින්නන්ට නිකුත් වුවහොත් හැර සංස්ථාව විසින් බෙදාහරින්නන්ට අලෙවි කළ භාණ්ඩ නැවත භාර ගැනීම හෝ වෙනත් භාණ්ඩයකට හුවමාරු කිරීම සිදු නොකරයි.<br><br>ගනුදෙනුකරුවන් විසින් මිලදී ගැනීමට බලාපොරොත්තු වන වටිනාකමට සමාන අවලංගු කල නොහැකි කොන්දේසි විරහිත බැංකු ඇපකරයක් ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලබා දිය යුතු වේ. බැංකු ඇපකරය ගිවිසුම් කාලය ආරම්භයේ සිට ගිවිසුම් කාලය පුරා බලාත්මකව තිබිය යුතු වේ. |
| රජයේ හමුදාවන්/රජයේ රෝහල්/ පුද්ගලික රෝහල් | සංස්ථාව ආදායම හඳුනා ගන්නේ මාසිකව, ගනුදෙනුකරුවන්ට භාණ්ඩ භාර දුන් අවස්ථාවේ දී වේ. සංස්ථාව විසින් තීරණය කර ගනුදෙනු කරුවන්ට විටින්විට දැනුම් දෙනු ලබන මිලකට පාරිභෝගිකයින් වෙත භාණ්ඩ අලෙවි කරයි.<br><br>නිකුත් කරනු ලබන අවස්ථාවේ නරක් වී, අවපැහැගැන්වී හෝ අත්වැරදීමකින් වැරදි අයිතමයක් නිකුත් වුවහොත් හැර සංස්ථාව විසින් අලෙවි කල භාණ්ඩ නැවත භාර ගැනීම හෝ වෙනත් භාණ්ඩයකට හුවමාරු කිරීම සිදු නොකරයි. |

II. **වෛද්‍ය සේවා දෙපාර්තමේන්තුවට ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂිත අයිතම සැපයීමෙන් ලද ආදායම්**

වෛද්‍ය සේවා දෙපාර්තමේන්තුවට භාණ්ඩ ලබා දුන් අවස්ථාවේ දී ආදායම හඳුනා ගනියි. නිකුත් කරනු ලබන අවස්ථාවේ නරක් වී, අවපැහැගැන්වී හෝ අත්වැරදීමකින් වැරදි අයිතමයක් නිකුත් වුවහොත් හැර සංස්ථාව විසින් අලෙවි කල භාණ්ඩ නැවත භාර ගැනීම හෝ වෙනත් භාණ්ඩයකට හුවමාරු කිරීම සිදු නොකරයි.

III. **ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂිත අයිතම නිෂ්පාදනය**

ඖෂධ සංස්ථාව පහත ඖෂධ වර්ග නිෂ්පාදනය කර අලෙවි කරයි,

ජීවනී

ග්ලූකෝස්

බෙන්සිල් බෙන්සොවේට් ක්‍රීම්

**අවශ්‍යතා මත සමහර අයිතම සංස්ථාව විසින් නැවත ඇසුරුම් කරයි.**

භාණ්ඩ ගනුදෙනුකරුවන්ට භාර දුන් අවස්ථාවේ දී නිෂ්පාදිත භාණ්ඩ විකුණුම් ලෙස හඳුනා ගනියි. නිකුත් කරනු ලබන අවස්ථාවේ නරක්වී, අවපැහැගැන්වී හෝ අත්වැරදීමකින් වැරදි අයිතමයක් නිකුත් වුවහොත් හැර සංස්ථාව විසින් අලෙවි කල භාණ්ඩ නැවත භාර ගැනීම හෝ වෙනත් භාණ්ඩයකට හුවමාරු කිරීම සිදු නොකරයි. ආදායම හඳුනා ගැනීමට පෙර සංස්ථාව පහත විශේෂිත නිර්ණායකයන් ද සලකා බලයි.

### 5.1.2 ආපසු එවීමේ හිමිකම සහිත විකුණුම්

සංස්ථාව විසින් ආපසු එවීමේ හිමිකම සහිතව භාණ්ඩයේ පාලනය ගනුදෙනුකරුට ලබා දෙනුයේ,

* විකුණනු ලබන භාණ්ඩය කල් ඉකුත් වීමට ආසන්න වී ඇති විට
* නිකුත් කරනු ලබන අවස්ථාවේ භාණ්ඩය නරක් වී හෝ අවපැහැගැන්වී තිබූ විට
* අත්වැරදීමකින් වැරදි අයිතමයක් නිකුත්වූ විට.

  ආපසු එවීමේ හිමිකම සහිතව විකුණු භාණ්ඩ සංස්ථාව විසින් පහත පරිදි හඳුනා ගනියි.

* සංස්ථාව හිමිකම් ලැබීමට අපේක්ෂා කළ වටිනාකමට මාරු කළ අයිතමයේ ආදායම ආපසු ගෙවීමේ වගකීම හා
* වත්කමක් (එයට අනුරූප විකුණුම් පිරිවැය ගැළපීම) සඳහා මුදල් ආපසු ගෙවීමේ වගකීම පියවීම මත ගනුදෙනුකරුවන්ගේ භාණ්ඩ ආපසු ලබා ගැනීම

එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයේ, සංස්ථාව විසින් පැවරූ නිෂ්පාදන සඳහා හිමිකම් ලැබීමට අපේක්ෂා කරන මුදල පිළිබඳ තක්සේරුව යාවත්කාලීන කළ යුතු අතර, අවශ්‍ය නම් ගනුදෙනු මිලෙහි අනුරූප වෙනසක් සිදු කරනු ලැබේ.

මුදල් ආපසු ගෙවීමේ ප්‍රමාණයන් පිළිබඳ අපේක්ෂා වෙනස් වීම් සඳහා සංස්ථාව එක් එක් වාර්තා කරන කාලසීමාව අවසානයේ මුදල් ආපසු ගෙවීමේ වගකීම යාවත්කාලීන කල යුතුය. අනුරූප ගැළපීම සංස්ථාවේ ආදායම (හෝ ආදායමේ අඩු වීමක්) ලෙස හඳුනා ගනියි.

මුදල් ආපසු ගෙවීමෙන් වගකීම පියවීම මත ගනුදෙනු කරුවන්ගෙන් භාණ්ඩ ලබාගැනීමට සංස්ථාව හඳුනා ගෙන ඇති වත්කමක් මුලින් ගණනය කරනු ලබන්නේ එම භාණ්ඩයේ ශුද්ධ අගයෙන් භාණ්ඩය ආපසු ගැනීම සඳහා අපේක්ෂිත පිරිවැයක් ඇත්නම් අඩු කිරීමෙනි. එක් එක් වාර්තා කරන කාලපරිච්ඡේදය අවසානයේ දී, ආපසු ලැබිය හැකි භාණ්ඩ පිළිබඳ අපේක්ෂාවන් හි වෙනස් වීම් හේතුවෙන් පැන නගින වත්කම් ඇගයීම සංස්ථාව යාවත්කාලීන කළ යුතුය.

### 5.2 වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනම අනුව හඳුනා ගනියි.

### 5.3 සැපයුම් කරුවන්ගෙන් ලැබිය යුතු වන්දි

හිඟ සැපයුම් සහ තොග හානි සැපයුම් මත අයවිය යුතු හිමිකම් ඒවායේ අවිනිශ්චිත භාවය නිසා මූල්‍ය ප්‍රකාශයන්හි සැලකිල්ලට ගෙන නොමැත. නමුත් ආදායම උපලබ්ධි වන බව නිශ්චිතව දන්නා විට එම හිමිකම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර ඇත. 2024 වසර අවසානයේ දී ලැබිය යුතු වන්දි වටිනාකම රු. මිලියන 6,125 ක් විය. (2018.01.01 සිට 2024.12.31 දක්වා කාලපරිච්ඡේදයට අදාළ ව)

### 5.4. වියදම්

ව්‍යාපාරය පවත්වා ගෙන යාමෙන් ඇතිවූ සියලුම වියදම් වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී ආදායමෙන් අඩු කර ඇත. අලුත් වැඩියාවන් හා අලුත් කිරීම් එම වියදම ඇතිවූ වර්ෂයේ ලාභයට ගළපයි.

### 5.4.1. මූල්‍ය වියදම්

අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් වීමට සැලකිය යුතු කාලයක් ගතවන වත්කම්, අත්පත් කර ගැනීම, ගොඩනැගීම, නිෂ්පාදනය වෙනුවෙන් කෙළින්ම අදාළවන ණය පිරිවැය, අදාළ වත්කමේ පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනගත කරයි. අනෙක් සියලුම ණය පිරිවැය, පිරිවැය දරන ලද වර්ෂයේ වියදම් ලෙස සලකනු ලබයි. සංස්ථාවේ මූල්‍ය වියදම් තුල බැංකු අයිරා පොලී, ණයවර ලිපි විවෘත කිරීමේ වියදම් සහ ණය ගිවිසුම් ගාස්තු ඇතුළත් වේ.

### 5.4.2. පොදුකාර්ය වියදම් බෙදා වෙන්කිරීම

රාජ්‍ය ඖෂධ සංස්ථාව සහ රජයේ බෙහෙත් ගබඩාවට සම්බන්ධ ක්‍රියාකාරකම් විශ්ලේෂණය කර ගොඩනගාගත් ප්‍රතිශත අනුව පොදුකාර්ය පිරිවැය බෙදා වෙන්කර දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශනයේ පොදුකාර්ය වියදම් බෙදා ඇති ආකාරය පහත දැක්වේ.

| | ර.බෙ.ග. | රා.ඖ.ස. |
|---|---|---|
| (අ) සේවක වේතන | 56% | 44% |
| (ආ) ගමන් වියදම් | 10% | 90% |
| (ඇ) සැපයුම් හා අවශ්‍යතා | 25% | 75% |
| (ඈ) අලුත්වැඩියා හා නඩත්තු | 50% | 50% |
| (ඉ) ප්‍රවාහන, සන්නිවේදන, | | |
| උපයෝගීතා හා වෙනත් සේවා | 50% | 50% |
| (ඊ) පර්යේෂණ වියදම් | 65% | 35% |
| (උ) බැංකු අයිරා පොලී | (සත්‍ය වියදම) | (සත්‍ය වියදම) |

## 6. මූල්‍ය සාධන පත්‍ර - මූලික හඳුනා ගැනීම සහ පසු අගය කිරීම

### 6.1 මුල් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හඳුනා ගනු ලබන්නේ අස්තිත්වය සාධන පත්‍රයේ ගිවිසුම් ප්‍රතිපාදන වලට පාර්ශව කරුවෙකු වූ අවස්ථාවේයි. සාමාන්‍ය පරිදි මූල්‍ය වත්කම් මිලදී ගැනීම හා විකිණීම හඳුනා ගන්නේ හුවමාරු දිනයේ දී එනම් සංස්ථාව වත්කම විකිණීමට හෝ මිලදී ගැනීමට බැඳී සිටින දින දී වේ.

මූලික හඳුනා ගැනීමේ දී, සංස්ථාව මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් එහි සාධාරණ වටිනාකමට ගණනය කර ගළපයි. මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට නොවන විට, මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීම වෙනුවෙන් වැඩිවූ හා සෘජු වම අදාළ වන ගනුදෙනු පිරිවැයට හඳුනා ගනියි.

### 6.1.1 මූල්‍ය වත්කම්

#### 6.1.1.1 වර්ගීකරණය හා පසු තක්සේරුව

සංස්ථාව පහත මිනුම් කාණ්ඩ යටතේ මූල්‍ය වත්කම් වර්ග කර ඇත.

* ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට (FVPL)
* වෙනත් විස්තීර්ණ ආදායම් ගිණුම හරහා සාධාරණ

වටිනාකමට (FVOCI) හෝ

* ක්‍රමක්ෂය පිරිවැය

ණය හා ප්‍රාග්ධන උපකරණ වර්ගීකරණයේ අවශ්‍යතා පහතින් විස්තර කර ඇත.

■ **ණය මෙවලම්**

ණය මෙවලම් යනු නිකුත් කරනු ලබන්නාගේ දෘෂ්ටිකෝණයෙන් බලන විට මූල්‍ය වගකීමක් ලෙස නිර්වචනය කල හැකි මෙවලම් වේ. ණය මෙවලම් වල වර්ගීකරණය හා පසු තක්සේරුව පහත කරුණු මත රඳා පවතී.

අ. වත්කම කළමනාකරණය සඳහා වන සංස්ථාවේ ව්‍යාපාරික ආකෘතිය

ආ. වත්කමේ මුදල් ප්‍රවාහයේ ලක්ෂණ

මෙම කරුණු පදනම්ව, සංස්ථාව තම ණය මෙවලම් පහත සඳහන් මිණුම් කාණ්ඩ තුනට වර්ගීකරණය කර දක්වයි

**6.1.1.1.1 ක්‍රමක්ෂේපිත පිරිවැය**

ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය රැස්කිරීම සඳහා තබා ගන්නා මුදල් ගලා ඒම මුල් මුදල හා පොලිය පමණක් නියෝජනය වන (SPPI) හා ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට (FVPL) දැක්වීමට නියම කර නොමැති, වත්කම් ක්‍රමක්ෂේපිත පිරිවැයට දක්වනු ලැබේ. මෙම මූල්‍ය වත්කම් වලින් ලද පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමයට ගණනය කර වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ දක්වයි. අතැති මුදල් හා බැංකු මුදල් සේවක ණය, වෙළඳ ණයගැතියෝ හා කෙටි කාලීන භාණ්ඩාගාර බිල්පත් ආයෝජන සංස්ථාව මෙම වර්ගීකරණය යටතේ දක්වයි.

**6.1.1.1.2 විස්තීර්ණ ආදායම් ගිණුම හරහා සාධාරණ වටිනාකම** (FVOCI)

මුදල් ගලා ඒමේ දී, මුල් මුදල හා පොලිය පමණක් නියෝජනය වන ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකම (FVPL) දැක්වීමට නියම කර නොමැති, ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය රැස්කිරීමට හෝ විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් වෙනත් විස්තීර්ණ ආදායම් ගිණුම හරහා සාධාරණ වටිනාකමට නිර්ණය කර දක්වයි. (FVOCI) මූල්‍ය වත්කම් හානි කරන ලාභ හෝ අලාභ හඳුනා ගැනීම් ද, මූල්‍ය සාධන පත්‍ර ක්‍රමක්ෂේපිත පිරිවැය මත පොලී ආදායම හා ලාභාලාභ ගිණුමෙහි හඳුනා ගත් විදේශ මුදල් හුවමාරු ලාභ හෝ අලාභ ද හැර ධාරණ අගයෙහි විචලනයන් විස්තීර්ණ ආදායම් ගිණුමෙහි ගලපයි. මූල්‍ය වත්කමක් හඳුනා ගැනීමෙන් බැහැර කරන විට, කලින් විස්තීර්ණ ආදායම් ගිණුම හරහා හඳුනා ගත් සමුච්චිත ලාභ හෝ අලාභ ස්කන්ධය වෙනස් වීමේ සිට ලාභ හෝ අලාභ ලෙස වර්ග කර ලාභාලාභ ගිණුමට ගලපයි. මෙම මූල්‍ය වත්කම් වල පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමයට ගණනය කර වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස දක්වනු ලබයි. මෙම වර්ග කිරීම යටතේ ගැනෙන කිසිදු මූල්‍ය වත්කමක් දැනට සංස්ථාව සතුව නොමැත.

**6.1.1.1.3 ලාභාලාභ ගිණුම හරහා සාධාරණ මිල**

ක්‍රමක්ෂේපිත පිරිවැය හෝ වෙනත් විස්තීර්ණ ආදායම් ගිණුම හරහා සාධාරණ මිලට (FVOCI) යන නිර්ණායක වලට නොගැනෙන වත්කම් ලාභාලාභ ගිණුම හරහා සාධාරණ මිල ක්‍රමයට අගය කරයි. ණය ආයෝජනයක ලාභයක් හෝ අලාභයක් පසුව ලාභ හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් මනිනු ලබන අතර එය හෙජිං සම්බන්ධතාවක කොටසක් නොවන අතර එය ණයකින් මතු නොවන්නේ නම් එය පැන නගින කාල සීමාව තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ ඉදිරිපත් කර ඇති ලාභ හෝ අලාභය තුළ හඳුනා ගැනේ. එය සාධාරණ මිලට නම් කරන ලද හෝ විකිණීම සඳහා නොවන ණය උපකරණයකින් පැන නගින්නක් නොවේ නම් ලාභාලාභ ප්‍රකාශයේ වෙනම ඉදිරිපත් කරයි. මෙම මූල්‍ය වත්කම් වලින් ලැබෙන පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමයට අනුව ගණනය කර වෙනත් මෙහෙයුම් ආදායමට ඇතුළත් කරයි. දැනට සංස්ථාව සතුව මෙම කාණ්ඩය යටතට ගැනෙන කිසිදු වත්කමක් නොමැත.

■ **ව්‍යාපාර ආකෘතිය**

මුදල් ප්‍රවාහය ජනනය කිරීම සඳහා සංස්ථාව වත්කම් කළමනාකරණය කරන ආකාරය ව්‍යාපාරික ආකෘතියෙන් පිළිබිඹුවේ. එනම් සංස්ථාවේ පරමාර්ථය තනිකරම වත්කම් වලින් ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය ලබාගැනීම හෝ ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය හා වත්කම විකිණීමෙන් පැන නගින ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය යන දෙකම සඳහා ද යන්නයි. මේ දෙකෙන් එකක්වත් අදාළ නොවන විට ( උදා- විකිණීම අරමුණු කරගත් මූල්‍ය වත්කම්) එවිට මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියෙන් වෙනත් කොටසක් ලෙස වර්ගීකරණය කර ලාභාලාභ ගිණුම හරහා සාධාරණ අගයට ගණනය කරනු ලබයි. වත්කම් සමූහයක් සඳහා ව්‍යාපාර ආකෘතිය තීරණය කිරීමේ දී සංස්ථාව වත්කම සඳහා මුදල් ප්‍රවාහය එකතු කරන ආකාරය පිළිබඳ පෙර අත්දැකීම්, වත්කම් වල ක්‍රියාකාරීත්වය අගයන ආකාරය හා ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන්ට වාර්තා කරන ආකාරය, අවදානම් තක්සේරු කර කළමනාකරණය කරන්නේ කෙසේ ද, හා කළමනාකරුවන්ට හා

■ **මුළු මුදල හා පොලිය පමණක් ගෙවීම ( SPPI)**

ව්‍යාපාර ආකෘතිය විසින්, ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය ලබා ගැනීම හෝ ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය ලබාගැනීම හා විකිණීම සඳහා වත්කම් තබා ගන්නා අවස්ථාවල දී සංස්ථාව විසින් මූල්‍ය උපකරණයේ මුදල් ප්‍රවාහය මුළු මුදල හා පොලිය පමණක් නියෝජනය කරන බවට තක්සේරු කරයි. (SPPI Test) මෙම තක්සේරු කිරීමේ දී, සංස්ථාව විසින් ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය මූලික ණය දීමේ විධිවිධාන වලට අනුකූල ද යන්න සලකා බලයි. උදා. පොලියට ඇතුළත් වන්නේ මුදල් වල කාල වටිනාකම, ණය අවදානම, වෙනත් මූලික ණය දීමේ අවදානම් හා මූලික ණය විධිවිධාන යන්ට අනුව ලාභ ආන්තිකය පමණ ද.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී.

ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (ආ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 10 (2) හි (අ) හා (ආ) | රාජ්‍ය නීතිගත සංස්ථාවක යම් වර්ෂයක් තුළ ඇතිවන ශුද්ධ අතිරික්තය පනතේ (3) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව යම් කාර්යයක් සඳහා යෙදවීමේ දී මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද එසේ අනුමැතියකින් තොරව |

| | | |
|---|---|---|
| | | රු.250,767,504 ක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. |
| (ආ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ 53 වැනි සංවත්සරය සඳහා සේවකයන් වෙත කුඩ ලබාදීම වෙනුවෙන් රු.1,718,589 ක මුදලක්ද රන්කාසි ලබාදීම සඳහා රු.4,071,177 ක්ද වියදම් කර තිබුණි. |
| (ඇ) | 2024 දෙසැම්බර් 23 දිනැති අංක පීඊඩී 03/2024 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 ඡේදය | සාමූහික ගිවිසුම් හෝ වෙනත් එවැනි අවබෝධතා ගිවිසුම් යටතේ වැටුප් හා අනෙකුත් දීමනා ගෙවන රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සේවකයන්ට ප්‍රසාද දීමනා ගෙවීමට නොහැකි බව දක්වා තිබුණද ඉන් බැහැරව එක් සේවකයෙකුට රු. 20,000 බැගින් සේවකයින් 904 දෙනෙකුට ප්‍රසාද දීමනා ලෙස රු.17,194,236 ක් ගෙවා තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය, සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ඒකකයක් රු.9,320 බැගින් රු.100,609,400 කට අක්ෂි කාච 10,795 ක් මිලදී ගැනීම සඳහා වූ ඇණවුමක් තෙවන අවම ලංසුකරු වෙත ලබා දීමට 2023 ජූලි 05 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබුණද එම ලංසුකරු ලංසු විවෘත කරන අවස්ථාවේ ලංසු ඇපකර ඉදිරිපත් කර නොතිබුණු අතර පසුව ඉදිරිපත් කරන ලද රු.3,025,390 ක වෙක්පතද අහරු වී තිබුණි. අසමත් ලංසුකරුවන්ගේ පැමිණිල්ලක් මත මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පත්කල ත්‍රිපුද්ගල කමිටු වාර්තාවේ නිර්දේශය අනුව 2023 සැප්තැම්බර් 21 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් නැවත මෙම ලංසුව දෙවන අවම ලංසුකරු වෙත ඒකකයක් රු.9,000 බැගින් රු.97,155,000 කට ප්‍රදානය කර තිබුණි. එම සැපයුම්කරුද සාම්පල් ලබාදීම සඳහා ලංසු විවෘත කල දින සිට මාස 1 දින 16ක්ද ණයවර ලිපි විවෘත කර මාස තුනක් ඇතුලත තොග සැපයිය යුතු වුවත් මාස 05 දින 10ක්ද ප්‍රමාද වී තොග සපයා තිබුණි.

(ආ) අක්ෂිකාච වර්ග 2 කින් ඒකක 9,199 ක් රු. 85,734,680 කට මිලදී ගැනීමේ ඇණවුමක් ලංසු බැඳුම්කරය ලෙස ඉදිරිපත් කරන ලද වෙක්පතද අහරු වූ තෙවන අවම ලංසුකරු වෙත ප්‍රදානය කිරීමට 2023 ජුනි 15 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබා දී තිබුණි. මෙම මිලදී ගැනීම් පරික්ෂාවට අදාළව පත්කරන ලද ත්‍රිපුද්ගල කමිටුවේ නිර්දේශය මත දෙවන අවම ලංසුකරු වෙත රු.82,791,000 කට ඇණවුම ප්‍රදානය කිරීමට 2023 නොවැම්බර් 02 දින තිරණය කර තිබුණි. ණයවර ලිපි විවෘත කර මාස තුනක් ඇතුලත තොග සැපයිය යුතු වුවත් 2024 ජුනි 10 වන විටත් තොග සැපයීම සිදුකර නොතිබුණි.

(ඇ) අක්ෂිකාච වර්ග 07 කින් කාච 54,000 ක් මිලදී ගැනීමේ ඇණවුමට අදාලව 2020 පෙබරවාරි 20 දින කැඳවන ලද ප්‍රසම්පාදනයේ ලංසු ඇගයීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව නිසි සැලකිල්ලකින් තොරව ලංසු ආකෘති දෙකක් සඳහා එකිනෙකට වෙනස් කොන්දේසි අනුව ඇගයීම් සිදු කිරීම නිසා අවම හා

දෙවන ලංසුකරු ප්‍රතික්ෂේප කර අවම ලංසුවට වඩා රු. 293,960,742 ක් වැඩි තෙවන ලංසුකරු වෙත රු. 598,780,742 කට ප්‍රසම්පාදනය පිරිනැමීමට තෝරාගෙන තිබුණු අතර මේ සම්බන්ධව ලංසුකරුවන් තුන්දෙනෙකු විසින් අභියාචනා ඉදිරිපත් කිරීම මත අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් 2021 ජූලි 19 දින නැවත ලංසු කැඳවීමට තීරණය කර තිබුණි. ඒ අනුව අයිතම 5 ක් සඳහා රු. 692,964,000 කට ප්‍රසම්පාදනය ප්‍රදානය කර තිබුණද සැපයුම්කරු ප්‍රතිචාර දක්වා නොතිබුණු අතර එම සැපයුම්කරුගේ රු.6,602,580 ක් වටිනා ලංසු සුරක්ෂණය කල් ඉකුත්වීමට පෙර මුදල් කර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. තවද, 2024 ජුනි 10 වන විටත් මෙම ප්‍රසම්පාදනය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) අක්ෂි කාච වර්ග 08ක ඒකක 20,540 ක් රු.243,850,880 ක් සැපයීමට 2020 පෙබරවාරි 20 දින තෝරාගත් තෙවන අවම ලංසුකරු ණයවර ලිපි නිකුත් කරන ලද 2022 මාර්තු 04 දින සිට මාස තුනක් ඇතුලත තොග සැපයීමට එකඟ වුවද ඒ අනුව තොග සපයා නොතිබූ අතර සැපයුම්කරු සමඟ අත්සන් කරන ලද ගිවිසුමේ 10 වන වගන්තිය ප්‍රකාරව රු.24,385,088 ක් වටිනා කාර්ය සාධන බැඳුම්කරය මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සැනිටයිසර් ඇසුරුම් කිරීම සඳහා 50ml, 100ml හා 500ml ප්‍රමාණවල හිස් බෝතල් ඒකක 10,000ක් බැගින් පළමු ඇණවුම ලෙසද ඒකක 15,000ක් බැගින් දෙවන ඇණවුම ලෙසද මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී තෝරාගත් ලංසුකරුවන් තුන්දෙනකු වෙත ලංසු නිකුත් කළ බව සඳහන් වුවද අදාළ ලියකියවිලි එකම ලිපිනයකට යවා තිබුණු බැවින් මිල ගණන් 3ක් කැඳවූ බව දැක්වීමට අදාළ ලංසු ලේඛන තුනම විවිධ නම් වලින් පෙනී සිටින තනි ආයතනයක් වෙත යවා ඇති බවක් නිරීක්ෂණය විය. තවද,මෙම ප්‍රසම්පාදනය හදිසි අවශ්‍යතාවයක් ලෙස තීරණය කර තෝරාගත් සැපයුම්කරුවන් වෙත ලංසු ඇරයුම් නිකුත් කලද තෝරාගත් සැපයුම්කරු විසින් ඇණවුම් නිකුත් කල 2021 ඔක්තෝබර් 27 දින සිට පළමු ඇණවුම සඳහා දින 77ක් හා දෙවන ඇණවුම සඳහා දින 17 ක් ගත කර ඇණවුම් දෙකටම අදාල තොග ලබා දී තිබුණු අතර 500 ml ලබා දීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද, සැපයුම් ප්‍රමාදය සඳහා ලංසු ලියවිලි ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණු අතර ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය, සැපයුම්කරුගේ ප්‍රමාදය සමඟ කොරෝනා වසංගතය පහව යාම හේතුවෙන් සැනිටයිසර් නිෂ්පාදනය අඩුවීම නිසා පිරිවැය රු.1,220,695 ක හිස් බෝතල් ඉතිරි වී තිබුණි.

(ඊ) සැනිටයිසර් ඇසුරුම් කිරීම සඳහා ලීටර් 5 කෑන් ඒකක 25,000ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී ඉදිරිපත් වූ තනි ලංසුකරු වෙත රු.4,725,000කට 2022 අප්‍රේල් 06 දින ඇණවුම ප්‍රදානය කර තිබුණු අතර ඇසුරුම් කෑන් ඉතා හදිසි බව සඳහන් කර තිබුණද, සැපයුම්කරු විසින් මුළු ඇණවුම සැපයීම සඳහා දින 180 ක කාලයක් ගත කර තිබුණි. කෙසේ වුවද, සැපයුම් ප්‍රමාදය සඳහා ලංසු ලියවිලි ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණු අතර ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය, සැපයුම්කරුගේ ප්‍රමාදය සමඟ කොරෝනා වසංගතය පහව යාම හේතුවෙන් සැනිටයිසර් නිෂ්පාදනය අඩුවීම නිසා රු.3,589,250ක හිස් ඇසුරුම් ඒකක 20,510 ක් ඉතිරි වී තිබුණි.

(උ) පිරිවැය එ.ජ.ඩොලර් 261,000ක් වූ Cefuroxime Injection 750 mg එන්නත් කුප්පි 900,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාලව දෙවන අවම මිල ඉදිරිපත් කල ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සැපයුම්කරුවකු වෙත ඇණවුම ප්‍රදානය කර තිබුණි. ඒ අනුව සැපයුම්කරු විසින් 2023 අගෝස්තු 07 දිනැති ලිපිය මඟින් ඖෂධ අමුද්‍රව්‍ය මිල ඉහළ යාම හේතුවෙන් ඇනවුම ප්‍රතික්ෂේප කර තිබුණද, සාර්ථක ලංසුකරු ලංසුව පිළිගෙන ගිවිසුමකට ඇතුලත් වීමට අසමත් වීම මත රු.1,027,800 ක් වටිනා ලංසු සුරක්ෂණය රාජසන්තක කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) පිරිවැය එ.ජ.ඩොලර් 84,750 ක් වූ Glucose BP (Monohydrate) කිලෝග්‍රෑම් 25 පැකට් 3,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාලව තෝරාගත් සැපයුම්කරුවන් 34 ක් වෙත යැවූ ලංසු ඇරයුම් අතුරින් විදේශ සමාගම් 26ක් වෙත සෘජුවම යවන ලද කිසිදු ෆැක්ස් පණිවිඩයක් ඉදිරිපත් වී නොතිබුණු අතර පෙර වර්ෂයේ සැපයුම්කරු වෙත ද ලංසු ආරාධනා කිරීමට නොහැකි වි තිබුණි. ඒ අනුව නිසි තරඟකාරීත්වයක් නොමැතිව තෝරාගත් ලංසුකරුගේ මිල ගණන් පෙර සැපයුම්කරුගේ ලංසු මිල ගණන් වලට සාපේක්ෂව සියයට 42 කින් ඉහළ ගොස් තිබුණ බව නිරීක්ෂණය විය.

(එ) ජීවනී නිෂ්පාදනයට යොදා ගනු ලබන Sodium Citrate කිලෝග්‍රෑම් 22,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාලව සැපයුම්කරුවන් 11 දෙනකුගේ දත්ත ලබාගෙන තිබුණද ඉන් ලංසුකරුවන් දෙදෙනෙකුට පමණක් ලංසු ඇරයුම් යවා තිබුණි. මෙම අමුද්‍රව්‍යය විවෘත සාමාන්‍ය බලපත්‍රය (Open General Licence) මත ආනයනය කළ හැකි වුවද ලියාපදිංචි සැපයුම්කරුවන් නොමැත යන්න පදනම් කර ගනිමින් තෝරාගත් සැපයුම්කරුවන් වෙත ලංසු ඇරයුම් නිකුත් කිරීමට තීරණය කිරීම නිසා විවෘත වෙළඳපල මිල ගණන් කැඳවීම මඟින් තරඟකාරී මිල ගණන් ලබා ගැනීමේ හැකියාව අහිමිව තිබුණි.

(ඒ) පිරිවැය රු.925,000 ක් වූ Saccharin sodium crystalline කිලෝග්‍රෑම් 500 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාලව අවම මිල ඉදිරිපත් කල සැපයුම්කරු වෙත ඇණවුම ප්‍රදානය කල ද සැපයුම් සිදු කරන ලද අවස්ථාවේ දීම අදාළ විශ්ලේෂණ සහතිකය ලබා ගැනීමට කටයුතු නොකර ඒ සඳහා අමුද්‍රව්‍ය ලැබී දින 271 ක් ගත කර තිබුණි. ඒ අනුව Saccharin sodium 350 Kg ක් භාවිතා වන තුරු අදාළ පිරිවිතරයන්ට අනුකූලද යන්න අවසන් පරීක්ෂා කිරීමට නොහැකි වී තිබුණි.

(ඔ) Anhydrous Citric Acid කිලෝග්‍රෑම් 6,500 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාළ ගිවිසුමෙහි ඇතුළත් ඇතැම් කරුණු සම්බන්ධයෙන් එකඟතා ප්‍රමාදයක් හේතුකොට ගෙන සැපයුම්කරුගේ දේශීය නියෝජිතයා ගේ යෝජනාවකට අනුව Anhydrous Citric Acid කිලෝග්‍රෑම් 6,500ක් එ.ජ.ඩොලර් 6,871.80 කට මිලදී ගැනීමට සාමාන්‍යාධිකාරී විසින් ආවරණ අනුමැතිය ලබා දී තිබුණද ඒ සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාගෙන නොතිබුණි. මෙම ප්‍රසම්පාදනයට අදාලව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්ති ප්‍රකාරව කාර්ය සාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි. තවද, නිකුත් කරන ලද ගැනුම් ඇණවුම ප්‍රකාරව තොග ඉක්මනින් අවශ්‍ය බව දක්වා තිබුණද ගැනුම් ඇණවුම නිකුත් කල දින සිට දින 52 ක ප්‍රමාදයෙන් පසුව තොග ලබා දීම හේතුවෙන් ගිවිසුමේ වගන්ති අංක 10.1 ප්‍රකාරව එ.ජ.ඩොලර් 687.1 ක ප්‍රමාද ගාස්තුවක් සැපයුම්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) Anhydrous Glucose කිලෝග්‍රෑම් 80,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාලව අවම දෙවන මිල ඉදිරිපත් කල ලංසුකරු තෝරා ගත්තද එම ලංසුකරු සාම්පල් ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම තෝරාගත් සැපයුම්කරු මිල වැඩි කිරීම නිසා මෙම ලංසුව අවලංගු කිරීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කළද ලංසුකරු ස්වකීය ලංසුව පිළිගෙන ගිවිසුමට ඇතුලත් වීමට අපොහොසත් වීම හේතුවෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 ප්‍රකාරව රු. 245,000 ක් වූ ලංසු සුරක්ෂණය රාජසන්තක කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ක) රත්මලාන නිෂ්පාදනාගාරය සඳහා අවශ්‍ය Sodium chloride ඉන්දීය ණය යෝජනා ක්‍රමය යටතේ මිලදී ගැනීමේ ප්‍රමාදයන් දක්වමින් සෘජු මිලදී ගැනීමේ ක්‍රමය යටතේ පෙර සැපයුම්කරුවකුගෙන් කිලෝග්‍රෑම් 7,200 ක් එ.ජ.ඩොලර් 7603.20 (රු. 2,461,222)කට මිලදී ගැනීමට අනුමැතිය ලබා දී තිබුණද මෙම ඇණවුමට අදාලව රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 හා 3.6 වගන්ති ප්‍රකාරව නැවත ඇණවුම් කිරීමේ ක්‍රමවේද හෝ සෘජු මිලදී ගැනීමේ ක්‍රමවේදය අනුගමනය කළ යුතු පසුබිමක් පැවැති බවට විගණනයට අනාවරණය නොවීය. සෘජු මිලදී ගැනීමේ ක්‍රමය භාවිතා කර මෙම ඇණවුම පෙර සැපයුම්කරුගෙන් මිලදී ගත්තද පෙර තීරණය වූ මිලට වඩා කිලෝග්‍රෑම් එකක් සඳහා එ.ජ.ඩොලර් 0.646ක වැඩි මිලක් තීරණය වී තිබුණි. එය කිලෝග්‍රෑම් එකක් සඳහා සියයට 157 ක මිල වැඩි වීමකි. එමෙන්ම මෙම ඇණවුම සඳහා ඉන්දීය ණය යෝජනා ක්‍රමය යටතේ මිලදී ගත් මිලට වඩා කිලෝග්‍රෑම් එකක් සඳහා එ.ජ.ඩොලර් 0.316 ක් වැඩිපුර ගෙවා තිබුණි. ඒ අනුව සෘජු මිලදී ගැනීම යටතේ එ.ජ.ඩොලර් 2275.2 ක (රු.736,502) ක පාඩුවක් රජයට දැරීමට සිදු විය. කෙසේ වුවද, සාපේක්ෂව වැඩි මිලක් යටතේ සෘජු මිලදී ගැනීමේ ක්‍රමය මත මිලදී ගනු ලබන මෙම තොගය ගබඩාව වෙත බාර දෙන විටත් ඉන්දීය ණය යෝජනා ක්‍රමය හරහා ගෙන්වන ලද තොගය ගබඩාව වෙත ලැබී තිබුණි.

(ග) පිරිවැය එ.ජ.ඩොලර් 16,200 ක් වූ Clobetasol Propionate Ointment USP 0.05% 15 g පැකට් 90,000ක් මිලදී ගැනීමට අදාලව තෝරාගත් ලංසු කරුවන් වෙත ලංසු අරාධනා යැවීම් තොරතුරු සහ

ලංසු කරුවන් ඉදිරිපත් කල ලංසු ලියවිලි හා ලංසු විවෘත කිරීමට අදාල ලියවිලි ලිපි ගොනුව තුළ නොතිබුණි. 2021 දෙසැම්බර් සිට තොග ශූන්‍ය තත්ත්වයක් පැවැතියද ලංසුව අවසාන දින සිට තෝරාගත් සැපයුම්කරුවෙත ප්‍රතිග්‍රහන ලිපිය යැවීමට දින 101 ක කාලයක් ගත කර තිබුණි. සැපයුම්කරු විසින් සපයන ලද තොග වලට අදාලව ඔසුසල් පාරිභෝගිකයන් විසින් සිදු කරනු ලබන පැමිණිලි වලට අනුව සිදු කරන ලද පරීක්ෂණ වලදී මෙම නිෂ්පාදිත ලේබලයේ Ointment ලෙස සඳහන් වී තිබුණද මෙය Cream format වලින් සමන්විත බව සංස්ථාවේ රසායනාගාරය මගින් තහවුරු කර තිබුණි. නිෂ්පාදකයා විසින් දෙනු ලබන ගුණත්ව වාර්තා උපයෝගී කර ගනිමින් තොග නැවත ඔසුසල් වෙත නිකුත් කිරීමට තීරණය කර සැපයුම්කරුට අදාල ගෙවීම් සිදුකිරීමෙන් පසු නැවත වරක් ඔසුසල් මගින් ඉදිරිපත් කළ ගුණත්ව දුර්වලතා හේතු කරගෙන රු.7,893,000 ක හරපතක් සැපයුම්කරු වෙත යොමු කළද සැපයුම්කරු එම ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණි. මෙම ගුණත්වය අසමත් තොග ඔසුසල් මගින් අලෙවි කල නොහැකි පසුබිමක දී මෙම තොගය වෛද්‍ය සැපයුම් අංශයට භාර දීමට ශක්‍යතාවයක් පවතීද යන්න සොයා බැලීමට ගුණත්ව කළමණාකරණ කමිටුව තීරණය කර තිබුණි. කෙසේ වුවද, සැපයුම්කරුගෙන් අයකර ගැනීම් නොකලහොත් සංස්ථාවේ ඉතිරිව් පවතින තොග ඒකක 46,407 ට අදාලව රු. 3,255,915 ක පිරිවැය හා තොග විනාශ කිරීමට අදාල පිරිවැය සංස්ථාවට දැරීමට සිදුවන බව නිරීක්ෂණය විය.

(ච) Famotidine tablets USP 40 mg ඖෂධයෙන් ඇසුරුම් ඒකක 120,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාලව අවම මිල ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරු වෙත එ.ජ.ඩොලර් 58,800 කට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය ලබා ගැනීමට යටත්ව ඇණවුම ප්‍රදානය කලද ඉන්ඩෙන්ටුව නිකුත් කළ දින සිට තොග සැපයීම සඳහා වර්ෂයක කාලයක් ගතකර තිබුණි.සැපයුම්කරු විසින් ප්‍රමාද වී සැපයූ මෙම සම්පූර්ණ තොගය මාස 06 ක් වැනි කෙටි කාලයක් තුළ අලෙවි වී තිබුණි. මෙම ඖෂධයේ ඇසුරුම් ඒකක ප්‍රමාණය නිවැරදිව හඳුනාගෙන නියමිත කාලය තුළදී තොග ඇණවුම් නොකිරීම හේතුවෙන් 2021 දෙසැම්බර් සිට 2023 ඔක්තෝබර් දක්වාද 2024 මැයි සිට 2024 නොවැම්බර් 15 දින දක්වාද තොග ශූන්‍ය වූ බැවින් එම මාස වල අලෙවිය ද ශූන්‍ය වී තිබුණි.

(ඡ) Gabapentin Capsules USP 100 mg ඖෂධයෙන් (10 x 10) ඇසුරුම් ඒකක 48,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේ ලංසු කැඳවීමේදී අවම මිල ඉදිරිපත් කල ලංසුකරු වෙත එ.ජ.ඩොලර් 44,640 කට ඇණවුම ප්‍රදානය කර තිබුණි. ඇණවුම ප්‍රදානය කරන විට මෙම සැපයුම්කරු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි වලංගු කාලය කල් ඉකුත් වී තිබුණි. තවද,මෙම සැපයුම්කරු පෙර ඇණවුමක් යටතේ ප්‍රදානය කරන ලද *ඇසුරුම්* ඒකක 16,800 ක් ද සපයා නොතිබුණු අතර ඉන් පෙර සපයන ලද ඇසුරුම් ඒකක 29,962 ක ජීව කාලය සියයට 50 කට අඩු බැවින් නැවත ප්‍රතිඅපනයනය කිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව වලංගු ලියාපදිංචි සහතිකයක් නොමැති විශ්වාසය තැබිය නොහැකි සැපයුම්කරුවකු වෙත ඇණවුම ලබා දීම හේතුවෙන් මෙම ප්‍රසම්පාදනය සඳහා වර්ෂ 03 මාස 06 ක් පමණ ගත කළද ඖෂධය සපයා ගැනීමට නොහැකි වී තිබුණි. කෙසේ වුවද එවැනි තත්ත්වයක් තුළදීත් ඊලඟ ඇණවුම ලෙස ඇසුරුම් ඒකක 60,000 ක් මෙම සැපයුම්කරුටම එ.ජ.ඩොලර් 57,600 කට ප්‍රදානය කර තිබුණු අතර සැපයුම්කරු 2023 සැප්තැම්බර් මස වන විට සම්පූර්ණ තොගය සැපයිය යුතු වුවත් 2024 දෙසැම්බර් 03 දක්වා තොගය සපයා නොතිබුණි. ඒ අනුව 2020 සිට 2024 වර්ෂය දක්වා මෙම ඖෂධය එකම සැපයුම්කරුගෙන් මිලදී ගෙන තිබුණු අතර නියමිත කාලසීමාව තුළදී සපයා නොමැතිවීම හේතුවෙන් 2024 දෙසැම්බර් 03 දක්වා අවස්ථා කිහිපයකදී ඖෂධයේ තොග ශූන්‍ය වී තිබුණි.

(ට) Mebendazole Tablets USP 500 mg ඖෂධයෙන් ඒකක 72,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාලව සෘජු සැපයුම්කරුවකු වෙතින් ලංසු ආරාධනා කර තිබුණු අතර ලංසුව සම්බන්ධ තීරණයක් ගැනීමට සැපයුම්කරු විසින් කාලයක් ඉල්ලා තිබුණි. මාස 03 කට පසු නැවතත් එම ලංසුකරුට ලංසු ලියවිලි යැවීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණු අතර සැපයුම්කරුගේ දේශීය නියෝජිතයාගෙන් මිල එකඟතාවය ලබා ගෙන ඒකකයක් රු.360.60 බැගින් ඒකක 3,000ක් රු.919,800 කට ඇණවුම ප්‍රදානය කර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන තීරණය ගැනීමට මාස 19 ක

කාලයක් ගතකර තිබුණු අතර සැපයුම්කරු විසින් මාසයක් ප්‍රමාද කර තොග සපයා තිබුණි. එකම සැපයුම්කරුගෙන් 2020 සිට 2024 වර්ෂය දක්වාම මිලදී ගන්නා මෙම අයිතමය 2020,2023 හා 2024 වර්ෂ වල හිඟව පැවතුණි.

(ඞ) Film Laser Blue Dry CR,DR,CT,MRT ඒකක 1,280,000 ක් ප්‍රසම්පාදනයට අදාලව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් Fuji Film හී දේශීය නියෝජිත හරහා නිෂ්පාදකගෙන් සෘජු මිල කැඳවීම් තීරණය කර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුවේ එකහතාවද නොමැතිව ප්‍රසම්පාදන කමිටුව විසින් ඒකකයක් එ.ජ.ඩොලර් 1.4535 බැගින් එ.ජ.ඩොලර් 1,860,480 කට Fuji Film විදේශීය සමාගම වෙත ඇණවුම ප්‍රදානය කර තිබුණද, ඒකක 320,000 ක් දේශීය පවතින බැවින් ඒ සඳහා දේශීය ණයවර ලිපි නිකුත් කරන ලෙස දේශීය නියෝජිතයා කළ ඉල්ලීම මත ගැනුම් ඇණවුම නැවත දේශීය නියෝජිතයා වෙත නිකුත් කර තිබුණි. සැපයුම්කරු විසින් තොග ඉක්මනින් සැපයීමට එකඟ වුවද සංස්ථාව විසින් සැපයුම් සඳහා දීර්ඝ කාල සීමාවක් ලබා දෙමින් රෝහල්වල හිඟ බව පෙන්වමින් දේශීයව මිලදී ගැනීමට යොමුව තිබෙන බව නිරීක්ෂණය විය. ඉතිරි සම්පූර්ණ තොග ඒකක ප්‍රමාණය දේශීය සැපයුම්කරුගෙන් මිලදී ගැනීමේදී ලබා ගත් කාර්යය සාධන සුරක්ෂණය කල් ඉකුත් වී තිබූ අතර එය දීර්ඝ කර ගැනීමකින් තොරව ඒකක 80,000ක් සඳහා රු. 53,101,006 ක් එනම් සියයට 100 ක අත්තිකාරමක්ද ගෙවා තිබුණි.

(ණ) පිරිවැය එ.ජ.ඩොලර් 25,920 ක් වූ Cotton crepe Bandage (7.5 cm x 4.5 m) රෝල් 36,000 ක් මිලදී ගැනිමේ ප්‍රසම්පාදනයට අදාලව ලංසු ඉදිරිපත් කල එකම ලංසුකරු ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණු අතර ඉදිරිපත් කරන ලද ලංසු ලියවිලි වල ලංසු මිලෙහි වලංගු කාල සීමාව සඳහන් කර නොතිබුණි. එමෙන්ම සැපයුම්කරු මාසයක ප්‍රමාද කාලයක් සහිතව තොග සපයා තිබූ අතර තොග වරායෙන් නිදහස් කරන දිනට කාර්යසාධන සුරක්ෂණය කල් ඉකුත් වී තිබුණි. තනි ලංසුකරුවකු වූ මෙම ලංසුකරු ඉදිරිපත් කල මිලට නිශ්කාශණ පිරිවැය හා සියයට 63 ක ලාභ ප්‍රතිශතයක් තීරණය කර ඒකකයක විකුණුම් මිල රු. 615 ක් ලෙස තීරණය කර තිබුණද එය වෙළඳපල තුල පැවැති තරගකාරී මිල මෙන් දෙගුණයක් විය. වෙළඳපලෙහි පවතින මිල සම්බන්ධව අවබෝධයකින් තොරව සිදුකල මෙම මිලදී ගැනීම හේතුවෙන් පවතින අලෙවි රටාව තුළ අලෙවිය පැවතුනහොත් තොගය කල් ඉකුත් වන 2026 මාර්තු මස 20 දිනට රු.5,779,134 ක අලාභයක් සංස්ථාවට දැරීමට සිදුවන බව නිරීක්ෂණය විය.

## 2.3 වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂයේ එකම කාල සීමාවක් තුළ රාජ්‍ය ඔෟෂධ නීතිගත සංස්ථාවේ ඔසුසල්වල අලෙවි කිරීමට ඔෟෂධ 13ක් මිලදී ගැනීමේදී SPC අංශයේ ගැණුම් මිලට වඩා CPU අංශයේ සහ ඔසුසලෙහි ගැණුම් මිල සියයට 12 සිට සියයට 425 දක්වා ඉහළ අගයක් ගෙන තිබීම හේතුවෙන් රු.10,196,335 ක අතිරේක පිරිවැයක් දැරිමට සිදු වි තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ තොග හා ස්ථාවර වත්කම් සමීක්ෂණය සඳහා නිලධාරීන් යෙදවීමේදී නිශ්චිත ක්‍රමවේදයකින් තොරව කටයුතු කර තිබුණි. ඒ අනුව භාණ්ඩ සමීක්ෂණය සඳහා පත්කල නිලධාරීන්ට අමතරව සමීක්ෂණය සඳහා පත්වීම් නොකළ ඔසුසල් සේවකයන්ට, රත්මලාන ප්‍රධාන ගබඩාවේ සේවකයන්ට හා නිෂ්පාදනාගාරයේ සේවකයන්ට මිනිස් දින 778ක් සඳහා රු. 3,461,243 ක දීමනා ගෙවා තිබුණි.

(ඇ) සංස්ථාව විසින් ප්‍රසම්පාදනය කර වෛද්‍ය සැපයුම් අංශයට සපයන ලද ඔෟෂධ හා ශල්‍ය අයිතම වෛද්‍ය සැපයුම් අංශයට යැවීමේදී එහි ගබඩා ප්‍රමාණවත් නොවීම මත තොග ආපසු හරවා එවීම හේතුවෙන් එම තොග සඳහා වූ අතිරේක ගබඩා පිරිවැය වශයෙන් රු.152,842,047 ක් හා ප්‍රසම්පාදනයට අදාල ලිපිලේඛන වල පවත්නා අඩුපාඩු හෝ ලිපිලේඛන නොමැති වීම නිසා වෛද්‍ය සැපයුම් අංශය තොග භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් එම තොග බාහිර ගබඩාවල ගබඩා කිරීමේ පිරිවැය වශයෙන් රු.7,913,539 ක් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජුලි දක්වා සංස්ථාව විසින් දරා තිබුණි.

(ඇ) 2023 හා 2024 වර්ෂ වල රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිෂ්පාදිත ඖෂධ වර්ග ප්‍රසම්පාදනය සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත ලංසු ආරාධනා කළද, ඖෂධ වල මිල වෙනස් වීම් වලදී ඒ සඳහා අනුගත නොවීම, නියමිත සැපයුම් කාල සීමාවන් වලදී ඖෂධ භාර නොගැනීම, ඇතැම් ඖෂධ තොග ගබඩා කර තබාගෙන කල් ඉකුත්වීමේ දිනය ළංවන විට ගුණත්ව සහතික හා ඖෂධ වල ආයුකාලය වැඩිකර ගැනීමට ඉල්ලීම් සිදු කිරීම හා කල් ඉකුත් වන ඖෂධ වෙනුවෙන් නව තොගයක් ප්‍රතිස්ථාපනය කරන මෙන් ඉල්ලීම් සිදුකිරීම වැනි හේතූන් මත අදාළ ලංසුව සඳහා ඖෂධ නිෂ්පාදන සංස්ථාව ලංසු ඉදිරිපත් නොකරන අවස්ථා රැසක් පැවැති බව නිරීක්ෂණය විය. ඒ අනුව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ මිල ගණන් වලට වඩා වැඩි මිල ගණන් යටතේ වෙනත් පාර්ශවයන්ගෙන් අදාළ ඖෂධ මිලදී ගැනීමට සිදුවී තිබුණි. යථෝක්ත හේතුව නිසා 2023 වර්ෂයේ පමණක් ඇණවුම් 3 ක් වෙනුවෙන් රු. 159,747,000 ක අතිරේඛ පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මගින් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල වෙත ප්‍රදානය කරන ලද එ.ජ.ඩොලර් මිලියන 02 ක් Meropenem Injection 1 g හා 500mg එන්නත් කුප්පි 788,590 ක් ප්‍රසම්පාදනය සඳහා ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල විසින් 2022 සැප්තැම්බර් 19 දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලබා දී තිබුණි. ඒ අනුව සංස්ථාව විසින් ඖෂධ මිලදී ගැනීමෙන් පසුව රු. 817,114,333 ක හරපත් වෛද්‍ය සැපයුම් අංශය වෙත නිකුත් කර සියයට 10 ක සේවා ගාස්තුවට අමතරව රු.742,826,030 ක් වූ ඉන්වොයිස් අගයද අයකරගෙන තිබුණි. ඒ අනුව ඉහත සැපයුම් වෙනුවෙන් සංස්ථාව දෙවරක් මුදල් ලබා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. 2023 වර්ෂයේද ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මගින් සෞඛ්‍ය සංවර්ධන අරමුදල හරහා සංස්ථාවට ප්‍රදානය කරන ලද එ.ජ.ඩොලර් 500,000 ක් ඖෂධ අයිතම 18ක් මිලදී ගැනීම සඳහා භාවිතා කර එම ඖෂධ මිලදී ගැනීමෙන් පසුව හරපත් වෛද්‍ය සැපයුම් අංශය වෙත නිකුත් කිරීම තුළින් අතිරේකව රු. 111,373,924 ක මුදලක් ලබා ගෙන තිබුණි.

(ඊ) පිරිවැය එ.ජ.ඩොලර් 11,100 ක් හෙවත් රු. 4,010,430 ක් වූ Sodium chloride කිලෝග්‍රෑම් 15 000 මිලදී ගැනීමේ ඇණවුමට අදාළ තොගය වරායෙන් නිදහස් කර ගැනීමට මාස දෙකකට වඩා වැඩි කාලයක් ගත කිරීම හේතුවෙන් රු. 1,111,191 ක ප්‍රමාද ගාස්තුවක් ගෙවා තිබුණි.

(උ) වෛද්‍ය සැපයුම් අංශයට තත්ත්වයෙන් අසමත් හා හානි වූ ඖෂධ සපයා තිබීම වෙනුවෙන් දරන ලද පිරිවැය, පරිපාලන ගාස්තු හා එම තොග විනාශ කිරීමේ වියදම් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීම සඳහා 2024 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර තිබුණු හරපත් වටිනාකම රු. 5,573,638,714 ක් වූ නමුත් ඉන් රු. 2,996,647,169 ක් 2025 මාර්තු 31 දින වන විටත් අයකර ගැනීමට නොහැකිව තිබුණි. එම හරපත් අතර අසාදු ලේඛනගත සැපයුම්කරුවන්ගෙන් අයකර ගත යුතු රු.1,651,976,520 ක්ද 2025 මාර්තු 31 දින වන විටත් අවසාන සිහි කැඳවීමේ ලිපි යොමු කර ඇති සැපයුම්කරුවන්ගෙන් අයකර ගත යුතු රු.279,455,513 ක්ද පවතින බැවින් එම මුදල් අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

(ඌ) 2022 වර්ෂයේදී ඔසුසල් 11ක් පමණ අලාභ ලබා තිබූ අතර 2023 වර්ෂය වන විට අලාභ ලබන ඔසුසල් ප්‍රමාණය ඔසුසල් 19ක් දක්වා ද සමාලෝචිත වර්ෂය වන විට එය ඔසුසල් 34ක් දක්වා ද වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂ තුනෙහිම අලාභ ලබන ඔසුසල් 09ක් වාර්තා වන අතර 2023 හා 2024 යන ආසන්නතම වර්ෂ දෙකෙහිම අලාභ ලබන ඔසුසල් ප්‍රමාණය 18 කි. එමෙන්ම 2024 වර්ෂයේ අලාභ ලබන ඔසුසල්වල මුළු අලාභය රු.84,404,012 කි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ ලැබිය යුතු නියෝජිත කොමිස් ලෙස දක්වා තිබුණු රු. 13,437,985 කින් රු. 13,375,322 ක් 2006 සිට 2011 දක්වා වූ වර්ෂවලට අයත් වර්ෂ 10 කටත් වඩා පැරණි ශේෂයක් වූ අතර ගෙවිය යුතු නියෝජිත කොමිස් ලෙස දක්වා තිබුණු රු. 63,077,186 කින් රු.11,657,526ක් වර්ෂ 02 කට වඩා පැරණි ශේෂයක් වූ අතර සංස්ථාව මෙම පැරණි ශේෂ නිරවුල් කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු. 10,605,483,740 ක් වූ ගෙවිය යුතු බැංකු බිල්පත් ගිණුමේ ශේෂයෙන් රු. 1,215,148,739 ක් වර්ෂ 2කට වඩා වැඩි කාලයක් පැරණි නොගෙවූ සියයට සියයක ණයවර ලිපි වටිනාකම හා රැඳවුම් මුදල් වලින් සමන්විත වී තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සැපයුම්කරුවන්ට ගෙවන ලද රු. 345,512,946 ක් වූ අතර Covid vaccines සඳහා ශීතකරණ බහළුම් සැපයූ පුද්ගලික ආයතනයක් වෙත ලබා දී තිබූ රු.36,397,900 ක්ද ඇතුළුව රු.44,718,126 ක් වූ වර්ෂ 3 ත් 10 ත් අතර කාලයක් නිරවුල් නොකළ අත්තිකාරම් ඒ අතර පවතින බව නිරීක්ෂණය විය.

(ඕ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ශේෂය රු.12,165,035ක් වූ විවිධ ණයගැතියන්ගෙන් රු.5,678,711 ක් 1997 සිට 2016 දක්වා කාලයට අයත් පැරණි ශේෂ විය.

(ක) 2012 සිට 2021 වර්ෂය දක්වා වූ කාල සීමාව තුලදී ලංකා බැංකුව, කොමර්ෂල් බැංකුව හා මහජන බැංකුව විවෘත කරන ලද නැව් ඇපකර 04 ක්, 6 ක් හා 2 කට අදාල පිළිවෙළින් රු.34,391,727 ක්, රු.31,470,538 ක් හා රු. 266,767 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිදහස් කර ගැනීමට නොහැකිව පැවතුණි.

(ග) සංස්ථාවේ මෙහෙයුම් හා පරිපාලන කටයුතු කාර්යක්ෂම කිරිමට ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය ක්‍රියාත්මක කිරිමේ ප්‍රසම්පාදනය 2008 වර්ෂයේ දී ආරම්භ කර තිබූ අතර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2018 සහ 2019 වර්ෂයන්හි දී රු.32,360,230 ක් වටිනා පරිගණක උපාංග අයිතම මිලදී ගෙන තිබුණි. පසුව එම ව්‍යාපෘතිය අත්හැර දමා නැවත යෝජිත ERP පද්ධතියක් සඳහා ලංසු කැඳවීම් සිදු කළ ද ප්‍රතිපාදන නොමැති වීමෙන් එම ලංසුව අවලංගු කර නැවත ලංසුව කැඳවීමට තීරණය කර තිබුණි. කෙසේවුවද 2007 සිට 2022 වර්ෂය දක්වා වසර 16 ක් වරින් වර ලංසු කැඳවා තිබුණු නමුත් එම අරමුණ ඉටු කර ගැනිමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(ච) සංස්ථාවේ ඔසුසල් ජාලයට සැපයෙන ඖෂධ අතරින් 2022 , 2023 හා 2024 වර්ෂයේ සිට පිළිවෙලින් ඖෂධ අයිතම 53 ක්, 46 ක් හා 86 ක් ලෙස 2024 අගෝස්තු 31 දිනට ඖෂධ අයිතම 185 ක් දින 1 සිට දින 946 දක්වා කාල පරාසයක හිඟව පැවතුණි. එමෙන්ම රත්මලාන ගබඩා පරිශ්‍රය තුල පවතින ඖෂධ අතරින් ඖෂධ 151 ක් සීඝ්‍රයෙන් චලනය වන ඖෂධ අයිතම ලෙස හඳුනාගෙන ඇති අතර එම අයිතම වලින් ඖෂධ අයිතම 47 ක් 2024 අගෝස්තු 31 දිනට හිඟව පැවතුණි.

(ජ) සංස්ථාවේ ණය ප්‍රතිපත්තිය අනුව,විකුණූ දින සිට දින 30 ත් 45 ත් අතර කාලය තුලදී වෙළඳ ණයගැතියන්ගෙන් ණය අයකර ගත යුතු වුවත් 2024 දෙසැම්බර් 31 දිනට රු.1,069,146,516 ක් වූ ණය ශේෂය තුළ, පුද්ගලික, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු රු.33,691,456 ක් වර්ෂ 5 කට වැඩි කාලයක සිට හා රු.31,364,446 ක් වර්ෂ 1 ත් 5ත් අතර කාලයක සිට අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ට) 2024 වර්ෂයේ කම්කරු තනතුරු සඳහා 12 දෙනෙකු බඳවා ගැනීමට අදාළ ලිපිගොනුවේ පැවැති සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලබා දී තිබූ ලකුණු ප්‍රමාණය හා අනුමැතිය ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කල වාර්තාවේ සඳහන් කරන ලද ලකුණු ප්‍රමාණය අතර පරස්පරතාවයක් සහ සකස් කරන ලද අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව සමඟ ඉදිරිපත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ලකුණු ලබා දීමේ ක්‍රියාපටිපාටියේ වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව නිලධාරීන් 8 දෙනෙකු බඳවාගැනීමට අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කර තිබුණද එම බඳවාගත් නිලධාරීන් 4 දෙනෙකු සුදුසුකම් නොලත් අයදුම්කරුවන් බව නිරීක්ෂණය විය.

(ඩ) 2024 වර්ෂයේ දී බඳවා ගැනීම් සිදුකරන ලද කළමණාකරණ සහකාර තනතුරට තෝරාගත් අයදුම්කරුවන් 7 දෙනකු සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද සාරාංශ වාර්තාවට අනුව කිසිදු විශේෂ දක්ෂතාවක් සඳහන් නොකළ නිලධාරීන්ට විශේෂ දක්ෂතා මත ලකුණු

ලබා දීම තුළින් සුදුසුකම් සහිත ඇතැම් නිලධාරීන්ට අසාධාරණයක් සිදු වී තිබුණි. ඒ අනුව 2024 මාර්තු 30 දින පැවැති සම්මුඛ පරීක්ෂණයේ දී සේවා අත්දැකීම් හා විශේෂ දක්ෂතා සඳහා ලකුණු ලබා දීමක් සිදුකර නොමැති නිලධාරියෙකු 2024 ජුලි 18 දින පැවැති සම්මුඛ පරීක්ෂණයේ දී සේවා අත්දැකීම් හා විශේෂ දක්ෂතාවය සඳහා ලකුණු ලබා දී බඳවා ගෙන තිබුණි.

(ණ) සංස්ථාවේ කම්කරු තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීම සඳහා 2024 ජනවාරි 17,18 සහ 19 යන දින 03 තුළ හා 2024 ජුලි 10 දින සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේ දී ලකුණු ලබා දීමේ ක්‍රියාපටිපාටි 02 ක් අනුගමනය කර තිබුණු බව නිරීක්ෂණය විය. එකම තනතුර සඳහා මාස දෙකක් තුළ පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 02 කදී ලකුණු ලබා දීමේ ක්‍රියාපටිපාටින් 02 ක් අනුගමනය කිරීම තුලින් අයදුම්කරුවන්ට අසාධාරණයක් සිදු වී ඇති බව නිරීක්ෂණය විය.

(ත) දියතලාව රාජ්‍ය ඔසුසල ඉදිකිරීමේ කටයුතු 2015 වර්ෂයේ ආරම්භ කර ඒ සඳහා සමාලෝචිත වර්ෂය වන විට රු.9,374,218ක වියදමක් දරා ඇති අතර ඉන් රු.3,368,283 ක් උපදේශන ගාස්තු වශයෙන් ගෙවා තිබුණි. 2025 අප්‍රේල් 02 වන විට අවුරුදු 10කට ආසන්න කාලයක් ගතව තිබුණද මෙහි ඉදිකිරීම් කටයුතු අවසන් වී නොතිබුණි. තවද, කොළඹ 07 ඔසුසල ගොඩනැගිල්ල අළුත්වැඩියාව සඳහා 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු. 21,268,513 ක වියදම් දරමින් වසර 5කට ආසන්න කාලයක් ගතකර තිබුණද, එම අළුත්වැඩියා කටයුතු මේ දක්වාම අවසන් වී නොතිබුණි.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ.)

# මානව සම්පත් විශ්ලේෂණය













**මුළු සේවක සංඛ්‍යාව 917**

රු. "000"

# වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු - ආදායම් වාර්තාව

| විස්තරය | 2024 | 2023 | 2022 | 2021 | 2020 | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පිරිවැටුම - රා.ඖ.ස | 11,069,400 | 11,746,644 | 9,945,849 | 9,446,822 | 8,798,047 | 8,924,850 | 7,458,320 | 6,593,401 | 6,127,478 | 5,286,876 |
| පිරිවැටුම - ර.බෙ.ග | 51,018,099 | 62,948,425 | 40,973,117 | 70,853,255 | 54,323,565 | 42,959,660 | 31,436,986 | 25,970,290 | 26,127,912 | 19,176,807 |
| **මුළු පිරිවැටුම** | **62,087,499** | **74,695,069** | **50,918,966** | **80,300,077** | **63,121,612** | **51,884,510** | **38,895,306** | **32,563,691** | **32,255,390** | **24,463,683** |
| දළ වෙළඳ ලාභය - රා.ඖ.ස | 2,963,156 | 3,901,069 | 2,069,584 | 2,224,536 | 2,249,676 | 2,279,155 | 1,772,559 | 1,680,368 | 1,656,938 | 1,410,722 |
| දළ අතිරික්තය - ර.බෙ.ග | 3,986,181 | 3,243,417 | 2,635,384 | 4,584,027 | 3,415,072 | 2,717,507 | 2,125,052 | 1,887,026 | 1,850,650 | 1,386,731 |
| **අතිරික්තය** | **6,949,337** | **7,144,486** | **4,704,968** | **6,808,563** | **5,664,749** | **4,996,662** | **3,897,611** | **3,567,394** | **3,507,588** | **2,797,453** |

**පොදුකාර්ය පිරිවැය**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වෙනත් ආදායම් | 844,337 | 612,567 | 107,110 | 88,531 | 287,363 | 91,441 | 73,072 | 53,004 | 43,085 | 51,259 |
| පරිපාලන වියදම් | (2,890,044) | (2,479,525) | (2,068,280) | (1,967,159) | (1,753,834) | (1,619,555) | (1,532,485) | (1,288,183) | (1,101,435) | (1,057,970) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (678,013) | (727,141) | (1,979,136) | (1,158,052) | (962,078) | (971,096) | (691,967) | (741,459) | (580,843) | (563,357) |
| **මෙහෙයුම් ලාභය** | **4,225,617** | **4,550,387** | **764,662** | **3,771,883** | **3,236,200** | **2,497,452** | **1,746,231** | **1,590,756** | **1,868,392** | **1,227,385** |
| මූල්‍ය පිරිවැය | (18,599) | (15,596) | (13,974) | (10,556) | (10,588) | (10,763) | (1,512) | (1,295) | (1,071) | (1,599) |
| බැංකු අයිරා පොලිය | (1,739,789) | (3,274,891) | (3,052,165) | (569,624) | (686,878) | (317,470) | (67,406) | (35,199) | (5,434) | (734) |
| **මුළු පොදුකාර්ය පිරිවැය** | **(5,326,445)** | **(6,497,153)** | **(7,113,555)** | **(3,705,391)** | **(3,413,378)** | **(2,918,884)** | **(2,293,370)** | **(2,066,136)** | **(1,688,783)** | **(1,623,660)** |
| මූල්‍ය ආදායම් | 7,181 | 7,817 | 7,643 | 6,943 | 6891 | 6,875 | 7,436 | 5,765 | 5,721 | 5,086 |
| **බදු පෙර ලාභය** | **2,474,411** | **1,267,717** | **(2,293,834)** | **3,198,646** | **2,545,625** | **2,176,094** | **1,684,749** | **1,560,027** | **1,867,608** | **1,230,137** |
| ආදායම් බදු වියදම | 851,004 | 494,182 | (611,992) | 782,230 | 576,401 | 512,225 | 756,823 | 470,595 | 625,863 | 610,539 |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය** | **1,623,407** | **773,535** | **(1,681,842)** | **2,416,416** | **1,969,224** | **1,663,869** | **927,926** | **1,089,432** | **1,241,744** | **619,598** |
| විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව | (224,901) | 112,091 | 86,102 | 57,438 | 191,755 | (1,926) | 30,453 | (59,575) | 10,049 | 239,887 |
| ප්‍රත්‍යාගණන ලාභ/ සංචිත | (300,000) | - | 71,351 | | | | | | | |
| **එකතු විස්තීරණ ආදායම** | **1,098,506** | **885,626** | **(1,524,389)** | **2,473,854** | **2,160,979** | **1,661,943** | **958,380** | **1,029,856** | **1,251,794** | **859,485** |




**මූලික අනුපාත**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දළ ලාභ අනුපාතය -රා.ඖ.ස.(%) | 26.8 | 33.2 | 20.8 | 23.5 | 25.6 | 25.5 | 23.8 | 25.5 | 27.0 | 26.7 |
| දළ ලාභ අනුපාතය -ර.බෙ.ග.(%) | 7.8 | 5.2 | 6.4 | 6.5 | 6.3 | 6.3 | 6.8 | 7.3 | 7.1 | 7.2 |
| දළ අතිරික්තයට විකිණුම් (%) | 11.2 | 9.6 | 9.5 | 8.4 | 9.0 | 9.6 | 10.0 | 11.0 | 10.9 | 11.4 |
| වාර්ෂික විකුණුම් වර්ධනය-රා.ඖ.ස (%) | (5.8) | 18.1 | 5.3 | 7.4 | (1.4) | 19.7 | 13.1 | 7.6 | 15.9 | 8.7 |
| වාර්ෂික විකුණුම් වර්ධනය-ර.බෙ.ග. (%) | (19.0) | 53.6 | (42.2) | 30.4 | 26.5 | 36.7 | 21.0 | (0.6) | 36.2 | 11.0 |
| සමස්ථ විකුණුම් වර්ධනය (%) | (16.9) | 46.7 | (36.6) | 27.2 | 21.7 | 33.4 | 19.4 | 1.0 | 31.9 | 10.5 |

## වසර දහයක සංඛ්‍යාත්මක තතාරතුරු - මූලය තත්ත්ව ප්‍රකාශනය

රු. "000"

| විස්තරය | 2024<br>රු. | 2023<br>රු. | 2022<br>රු. | 2021<br>රු. | 2020<br>රු. | 2019<br>රු. | 2018<br>රු. | 2017<br>රු. | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **දායක ප්‍රාග්ධනය හා සංචිත** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **125,117** |
| **ජංගම වත්කම්** | | | | | | | | | | |
| තොගය - රා.ඖ.ස | 4,479,240 | 6,919,845 | 3,189,712 | 2,396,406 | 2,751,098 | 2,802,020 | 2,754,287 | 1,798,403 | 2,009,502 | 2,364,091 |
| මාර්ගස්ථ තොගය - ර.බෙ.ග | 357,093 | 2,369,595 | 40,001 | 936,743 | 1,314,756 | 280,723 | 286,587 | 630,130 | 540,693 | 788,342 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 37,801,776 | 38,801,758 | 45,650,222 | 52,164,442 | 33,682,452 | 27,299,630 | 16,319,413 | 7,901,244 | 4,521,175 | 3,051,445 |
| තැන්පතු හා පෙර ගෙවීම් | 101,206 | 112,379 | 50,797 | 41,906 | 100,917 | 53,931 | 61,219 | 57,979 | 37,614 | 33,046 |
| අතැති මුදල් හා බැංකු මුදල් | 9,087,580 | 5,539,030 | 5,613,777 | 1,111,457 | 1,225,358 | 1,114,223 | 1,021,185 | 312,050 | 244,947 | 790,525 |
| **මුළු ජංගම වත්කම්** | **51,826,895** | **53,742,607** | **54,544,509** | **56,650,954** | **39,074,581** | **31,550,527** | **20,442,691** | **10,699,807** | **7,353,931** | **7,027,449** |
| **ජංගම වගකීම්** | | | | | | | | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු | 14,008,713 | 17,387,708 | 19,249,279 | 16,164,216 | 16,117,661 | 16,293,739 | 10,423,896 | 3,996,134 | 2,657,620 | 3,347,410 |
| ගෙවිය යුතු ආදායම් බදු | 394,181 | - | - | 1,285,189 | 475,496 | 352,117 | 438,060 | 337,976 | 519,770 | 397,758 |
| විලම්බිත ආදායම් | - | - | - | 1,471 | 1,800 | 1,461 | 1,345 | 927 | 1,103 | 1,005 |
| කල්බදු වගකීම් | 32,047 | 22,921 | 23,253 | 21,759 | 19,870 | 19,187 | | | | |
| ජංගම මූල්‍ය වගකීම් | 19,872,902 | 18,616,640 | 15,937,904 | 15,432,057 | 55,929 | 6,310,716 | 2,639,033 | 1,361,444 | 39,703 | 56,689 |
| දිගුකාලීන ණය | 1,978,933 | 2,060,544 | 1,978,933 | 2,060,544 | 491,355 | | | | | |
| **මුළු ජංගම වගකීම්** | **36,286,776** | **38,087,813** | **37,189,369** | **34,965,236** | **17,162,111** | **22,977,220** | **13,502,334** | **5,696,481** | **3,218,196** | **3,802,862** |
| ජංගම නොවන වත්කම් | 2,653,677 | 2,975,448 | 2,627,937 | 2,351,605 | 2,329,488 | 2,277,480 | 2,225,337 | 2,179,335 | 2,166,630 | 2,156,615 |
| ජංගම නොවන වගකීම් | 4,299,021 | 5,901,912 | 8,004,715 | 9,904,472 | 11,908,162 | 294,459 | 271,308 | 264,651 | 192,213 | 233,394 |
| **ශුද්ධ වත්කම්** | **13,894,775** | **12,728,330** | **11,978,362** | **14,132,848** | **12,333,796** | **10,556,328** | **8,894,386** | **6,918,010** | **6,110,152** | **5,147,807** |

**මූලික අනුපාත**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වත්කම් පිරිවැටුම් අනුපාතය (වාර) | 1:14.4 | 1:18.15 | 1:13.89 | 1:22.91 | 01:18.3 | 1:15.42 | 1:11.82 | 1:10.0 | 1:9.96 | 1:7.6 |
| ජංගම අනුපාතය (වාර) | 1:1.42 | 1:1.41 | 1:1.47 | 1:1.62 | 1:2.28 | 1:1.37 | 1:1.51 | 1:1.88 | 1:2.29 | 1:1.85 |
| ද්‍රවශීලතා අනුපාතය (වාර) | 1:1.3 | 1:1.17 | 1:1.38 | 1:1.52 | 1:2.04 | 1:1.24 | 1:1.2.9 | 1:1.5 | 1:1.5 | 1:1.02 |
| පොලී ආවරණය (වාර) | 2.39 | 1.38 | 0.25 | 6.45 | 4.66 | 7.85 | 25.99 | 45.32 | 344.69 | 1676.94 |
| තොග පිරිවැටුම් අනුපාතය (වාර)-රා.ඖ.ස | 1.4 | 1.6 | 2.7 | 2.75 | 2.36 | 2.39 | 2.5 | 2.58 | 2.04 | 2.07 |

# විකුණුම් ජාලය

| **ලියාපදිංචි කාර්යාලය** | | **ව්‍යාපාරික කාර්යාලය** | |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**<br>අංක 75 .සර් බාරොන් ජයතිලක මාවත ,<br>කොළඹ.1 ශ්‍රී ලංකාව.<br>දුරකතන: 011-2320356 – 9 ෆැක්ස්: 011-2447118 වෙබ අඩවිය:<br>www.spc.lk විද්‍යුත් තැපැල්: spc@spc.lk | | **ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**<br>16 වන මහල, “මෙහෙවර පියස”<br>කිරුල පාර,<br>කොළඹ 05.<br>දුරකතන: 011-2320356 – 9 ෆැක්ස්: 011-2447118 වෙබ අඩවිය:<br>www.spc.lk විද්‍යුත් තැපැල්: spc@spc.lk | |
| **විකුණුම් අංශය- රත්මලාන** | දු.ක. 011-2632288<br>ෆැක්ස් : 011-2632962 | ජීවනී අංශය - රත්මලාන | Tel.011-2622334 |
| **ප්‍රධාන ගබඩාව - රත්මලාන** | දු.ක. 011-2634318<br>ෆැක්ස් :011-2636715 | මහනුවර ගබඩාව- තැන්නෙකුඹුර | Tel.081-2240013 |
| ඔසුසල - අක්කරෙයිපත්තුව | Tel.067-2057625 | ඔසුසල - K.D.U | Tel.011-2044595 |
| ඔසුසල - අම්බලන්ගොඩ | Tel.091-2210333 | ඔසුසල - කරාපිටිය | Tel.091-2226947 |
| ඔසුසල - අම්පාර | Tel.063-2223088 | ඔසුසල -කුරුණෑගල | Tel.037-2230840 |
| ඔසුසල - ආනමඩුව | Tel.032-2263999 | ඔසුසල- මැදවච්චිය | Tel.025-2121040 |
| ඔසුසල - අනුරාධපුර | Tel.025-2227488 | ඔසුසල - මහරගම | Tel.011-2745640 |
| ඔසුසල -අවිස්සාවේල්ල | Tel.036-2222501 | ඔසුසල - මැණික්හින්න | Tel.081-2081198 |
| ඔසුසල - බද්දේගම | Tel.091-2298540 | ඔසුසල - මාතලේ | Tel.066-2220126 |
| ඔසුසල - බදුල්ල (සතොස) | Tel.055-2229837 | ඔසුසල - මාතර | Tel.041-2231871 |
| ඔසුසල -බදුල්ල (බස් නැවතුම) | Tel.055-2224700 | ඔසුසල - මතුගම | Tel.034-2248861 |
| ඔසුසල - බණ්ඩාරගම | Tel.038-2288671 | ඔසුසල -මිනුවන්ගොඩ | Tel.011-2295120 |
| ඔසුසල - බේරුවල | Tel.034-2278578 | ඔසුසල - මොනරාගල | Tel.055-2277712 |
| ඔසුසල - බිබිල | Tel.055-2055877 | ඔසුසල - ගල්කිස්ස | Tel.011-2718959 |
| ඔසුසල - බොරැල්ල | Tel.011-2697660 | ඔසුසල - නාගොඩ | Tel.034-2222818 |
| ඔසුසල - කොළඹ 01 | Tel.011-2328046 | ඔසුසල - නාරාහේන්පිට | Tel.011-2055284 |
| ඔසුසල - කොළඹ 07 | Tel.011-2694716, 011-2672293 | ඔසුසල - මීගමුව | Tel.031-2228599 |
| ඔසුසල - දඹුල්ල | Tel.066-2285133 | ඔසුසල -නින්දවූර් | Tel.067-2058208 |
| ඔසුසල - දියතලාව | Tel.057-2227190 | ඔසුසල -නිට්ටඹුව | Tel:033-2053499 |
| ඔසුසල - ඇල්පිටිය | Tel.091-2299857 | ඔසුසල -නුගේගොඩ | Tel.011-2856641 |
| ඔසුසල - ඇඹිලිපිටිය | Tel.047-2261177 | ඔසුසල - නුවරඑළිය | Tel.052-2050154 |
| ඔසුසල - කොටුව | Tel.011-2336926 | ඔසුසල - පානදුර | Tel.038-2234767 |
| ඔසුසල - ගාල්ල | Tel.091-2234726 | ඔසුසල -පේරාදෙණිය | Tel.081-2386045 |
| ඔසුසල - ගම්පහ | Tel.033-2234516 | ඔසුසල -පිළිමතලාව | Tel.081-2570149 |
| ඔසුසල - හම්බන්තොට | Tel.047-2222163 | ඔසුසල -පිළියන්දල | Tel.011-2613640 |
| ඔසුසල - හොරණ | Tel.034-2205333 | ඔසුසල -පිටකෝට්ටේ | Tel.011-2099444 |
| ඔසුසල - හික්කඩුව | Tel.091-2273978 | ඔසුසල -පොළොන්නරුව | Tel.027-2225465 |
| ඔසුසල - හෝමාගම | T: 011-2891222 | ඔසුසල -පොතුවිල් | Tel.063-2050517 |
| ඔසුසල - ශ්‍රී ජයවර්ධනපුර රෝහල | Tel.011-2779414 | ඔසුසල - රාගම | Tel.011-2955219 |
| ඔසුසල - යාපනය | Tel.021-2219262 | ඔසුසල - රත්නපුර | Tel.045-2223014 |
| ඔසුසල - මහනුවර | Tel.081-2225175 | ඔසුසල - තංගල්ල | Tel.047-2241221 |
| ඔසුසල - (මහනුවර දුම්රිය පල) | Tel.081-2225176 | ඔසුසල - වැල්ලවත්ත | Tel.011-2587128 |

අලෙවි හා විකුණුම් අංශය- දු.ක. 011-2430778, 011-2328507, 011-2320356-9

“මෙහෙවර පියස”, 16 වන මහල, අංක. 41 කිරුළ පාර, කොළඹ 05.
‘‘மேஹேவர பியச’’ 16 ஆம் மாடி, இல. 41, கிருல வீதி, கொழும்பு 05.
“Mehewara Piyasa”, 16th Floor, No. 41, Kirula Road, Colombo 05.